(ii) දඹදිව වන්දනාකරුවන් වන්දනාවේ යෙදෙන අතරතුර නිරන්තරයෙන් සෞඛ්‍ය ගැටළුවලට මුහුණ දීම හා කිහිප අවස්ථාවකදී මරණයට පත්වීම ආදි සිද්ධීන් හේතුවෙන් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) විසින් වන්දනා චාරිකා සංවිධාන හා වන්දනාකරුවන් සඳහා සෞඛ්‍ය උපදෙස් සහිත මාර්ගෝපදේශයක් සකස් කර දෙන ලෙස සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් කර තිබුණු අතර ඒ අනුව, සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය විසින් අදාල මාර්ගෝපදේශයක් පිළියෙල කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද, මෙම මාර්ගෝපදේශය අමාත්‍යාංශයේ ලියාපදිංචි සියළු වන්දනා සංවිධානයකයින් වෙත බෙදා දුන් බවට විගණනයේදී තහවුරු කරගත නොහැකි වූ අතර ඊට අදාල පසු විපරම් කිරීමටද කටයුතු කර නොතිබුණි.

(iii) ලියාපදිංචි සංවිධායකයින්ගෙන් දඹදිව වන්දනාවේ යෙදෙන බැතිමතුන්ට සිදුවන අඩුපාඩු සම්බන්ධයෙන් සොයා බැලීමක් අමාත්‍යාංශය මඟින් සිදු කර නොතිබුණු අතර 2020 සිට 2022 දක්වා කාලසීමාව තුළ වන්දනාකරුවන්ට සංවිධායකයින්ගෙන් සිදු වූ විවිධ දුෂ්කරතාවන් හා අසාධාරණයන් දක්වමින් පැමිණිලි 29 ක්ද, වන්දනා සංවිධාකයින්ගෙන් පැමිණිලි 02 ක් ද ලැබී තිබුණද ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් කිසිදු පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(ආ) රජරට චාරිකා නිවාසය පරීක්ෂා කිරීම

(i) රජරට චාරිකා නිවාස ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් බීම් ඉරිතැලී ඇති අතර රියදුරු නවාතැන් ගොඩනැගිල්ලේ විදුලි සවිකිරීම් ආශ්‍රිතව අළුත්වැඩියාවන් සිදු කළ යුතු තත්වයක පැවතුණි. තවද, චාරිකා නිවාසයේ පිවිසුම් මාර්ගය වැසි ජලයට සේදීයාම හේතුවෙන් වාහන ඇතුළු කිරීමේ දුෂ්කරතාවයක් පැවතුණ ද මෙතෙක් අළුත්වැඩියාවන් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) චාරිකා නිවාසය වෙන් කිරීමේ ගාස්තුවලට අතිරේකව අමුත්තන්ගේ එක් ඇදක් සඳහා රු.50 බැගින් ඇද ඇතිරිලි ගාස්තුවක් චාරිකා නිවාස භාරකරු විසින් අයකරන ලබන අතර ඒ සඳහා මුදල් රෙගුලාසි 168 (1) සහ (2) වගන්තිය ප්‍රකාරව විධිමත් කුවිතාන්සියක් නිකුත් කර නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි 177 ප්‍රකාරව එකතු කර ගත්තා රජයේ මුදල් දිනපතාම හෝ හැකිතාක් කලින් ප්‍රේෂණය කළ යුතු වුවත් චාරිකා නිවාසයට සුළු මුදල් අග්‍රිමයක් හෝ ලබා දීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් ඇතැම් අවස්ථාවල ඇද ඇතිරිලි ගාස්තුවලින් වෙනත් වියදම් දරා තිබුණි.

(ඇ) නිදහස් උත්සවයේ නර්තනාංග සඳහා ඇඳුම් වෙනුවෙන් අමාත්‍යාංශයේ සංස්කෘතික අංශය විසින් රු.4,429,800 ක් වැය කර තිබුණු අතර එම ඇඳුම් විධිමත්ව නර්තන ඇඳුම් ගබඩාවේ තැන්පත් කර නොතිබීම හේතුවෙන් රංග වස්ත්‍රාභරණවල ශේෂයන්හි නිවැරදිතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. තවද, සාපේක්ෂව ඉතා ඉහළ පිරිවැයක් දරා නිර්මාණය කරන මෙම නර්තන ඇඳුම් කට්ටල වෙනත් විකල්ප අවස්ථාවන් සඳහා බාහිර ආයතනවලට ලබා දී ආදායම් උත්පාදනය කර ගැනීමට හැකියාව ඇතත් ඒ සම්බන්ධයෙන් අවධානය යොමුනොකර නිශ්කාර්ය ලෙස මෙම ඇඳුම් කට්ටල ගොඩගසා ඇති බව නිරීක්ෂණය විය.

(ඈ) තිස්සමහාරාම, රන්මිණිතැන්න ප්‍රදේශයේ අක්කර 235 ක භූමි ප්‍රදේශයක ඉදිකර තිබූ මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය 2010 මාර්තු 30 වන දින විවෘත කර තිබූ අතර ඒ වන විට ආයතනයක් ලෙස විධිමත්ව ස්ථාපිත වී නොතිබුණි. ඒ සම්බන්ධයෙන් "මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය රජයට අයත් සමාගමක් බවට පත්කිරීම" යන මැයෙන් එවකට ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යවරයා විසින් 2013 ජනවාරි 31 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) අදාල අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කළ යුතු ආයතනය ලෙස ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය නම්කර තිබූ අතර එම අමාත්‍යාංශය විසින් හෝ මෙම උද්‍යානය එවකට පැවති ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් අදාල අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාවට නංවා නොතිබුණි.

(ii) මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය පිහිටි ඉඩම රජයේ ඉඩමක් වන අතර මෙම උද්‍යානය ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය යටතේ පැවති කාලසීමාවේදී එම අමාත්‍යාංශයේ බලයලත් නිලධාරියා වෙත විශේෂ කොන්දේසි කීපයක් යටතේ පැවරීම සිදුකර තිබුණි. මෙම වාර්තාවේ දිනය වන විටත් එම ඉඩම, ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයේ බලයලත් නිලධාරියාගේ නමින් පැවති අතර ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත උද්‍යානය පැවරී වසර 02 කට වැඩි කාලයක් ගත වී තිබුණද අදාල ඉඩම අමාත්‍යාංශය වෙත පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රයේ මෙහෙයුම් කටයුතු හා කාර්යසාධනය පිලිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2022 සැප්තැම්බර් 13 දිනැති අංක අමප/22/1294/620/007දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් වශයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගන්නා ලෙස බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත නිර්දේශ කර තිබුණද, සංස්කෘතික කටයුතු

දෙපාර්තමේන්තුව යටතේ වන ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක නොකර විගණිත දින වන විටත් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පැවතුණි.

(ii) පූර්ව ආසන්නතම වසර තුනක කාලපරිච්ඡේදය තුළ ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය වෙනුවෙන් දරන ලද මුළු වියදම රු.26,365,301ක් වුවත් එම කාලපරිච්ඡේදය තුළ පාඨමාලා සඳහා සහභාගීවී ඇති සිසුන් ගණන 112ක් වැනි අඩු අගයක් ගෙන තිබූ අතර පාඨමාලා සඳහා සහභාගිවන සිසුන් සංඛ්‍යාව වැඩිකර ගැනීම සඳහා සුදුසු ක්‍රමෝපායන් භාවිතා කර නොමැති බව නිරීක්ෂණය විය.

(iii) 2020 ඔක්තෝබර් 26 දිනැති අංක 02/2020 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි 1(vii) උපවගන්තිය ප්‍රකාරව ආයතනයන්හි කාලීන සේවා අවශ්‍යතාවයන් අනුව අනුමත සේවක සංඛ්‍යාව සඳහා සංශෝධනයන් අවශ්‍ය වන විට වඩා කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් ලබා දීමට අවශ්‍ය අවම තනතුරු සංඛ්‍යාවක් හඳුනාගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේනතුව වෙත ඉදිරිපත් කර අනුමත කර ගත යුතුය. එසේ වුවද, රංගශාලාවක් නොමැති ජනකලා කේන්ද්‍රය සඳහා කළමණාකරු තනතුරක් හා රංගශාලා සහයක තනතුරු දෙකක් අනුමත තනතුරු ලෙස පවත්වා ගෙන ගොස් තිබූ අතර එම තනතුරු කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් සංශෝධනය කරගෙන නොතිබුණි.

(ඊ) ජාතික ප්‍රාසාංග කලා මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2020 සැප්තැම්බර් 25 දින සිට නෙළුම් පොකුණ රඟහල, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ පැවති ජාතික උරුම ප්‍රාසාංගික කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පරිපාලනය විය. අනතුරුව, 2022 ජූලි 22 දිනැති අංක 2289/49 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතට පත්කර තිබුණි. එසේ වුවද, රඟහල විධිමත් පරිදි සංස්ථාපනය කිරීම උක්ත අමාත්‍යාංශ විසින් 2022 දෙසැම්බර් 31 දින වන විටත් සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

(ii) රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක SA/AMP/Deposit/Transfer දරන 2020 ජනවාරි 09 දිනැති ලිපිය ප්‍රකාරව රඟහලේ ආදායම් සඳහා ආදායම් ශීර්ෂයක් ඇතිකර ගැනීමට කටයුතු කළ යුතු වුවත් සම්බන්ධව 2022 දෙසැම්බර් 31 දින වන විටත් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(iii) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.1 ඡේදය ප්‍රකාරව, සේවා සම්පාදනය සඳහා අයකරනු ලබන විවිධ ගාස්තු ඉහළ නැංවීමක් සිදු කර නොමැති සියළුම රාජ්‍ය ආයතනයන් විසින් අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන එම ගාස්තු සියයට 15 කින් හෝ ට වැඩි ප්‍රමාණයකින් ඉහළ නැංවීමට කටයුතු කළ යුතු වුවද, අමාත්‍යාංශය විසින් 2012 වර්ෂයේ සිට අයකරන ගාස්තු සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර 2020, 2021 හා 2022 වර්ෂවලදී ද ගෙන නොතිබුණි.

(iv) රහහල, කුලී පදනම් මත ලබා දීමේදී ඇතැම් පාර්ශවයන් වෙතින් පමණක් සහනදායී මිල ගණන් මත කුලී මුදල් අයකර (වට්ටම් ලබා දීම) තිබූ අතර එවැනි සහනදායී අයකිරීම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(v) රහහල, කුලී පදනම් මත ලබා දීමේදී අදාල කුලී ගැනුම්කාර පාර්ශව සමඟ ගිවිසුමකට එළඹ තිබූ අතර ගිවිසුමෙහි පලමු පාර්ශවය වෙනුවෙන් ගිවිසුම් අත්සන් කිරීම රහහල වෙන්කරවා ගැනීමේ නිලධාරී සහ රහහලෙහි ප්‍රධාන පරිපාලන නිලධාරී විසින් සිදු කර තිබුණි. එසේ වුවද, විධිමත් නෛතික පුද්ගලභාවයක් සහිත ආයතනයක් ලෙස රහහල ස්ථාපනය කර නොතිබූ බැවින් ගිවිසුමෙහි නෛතික වලංගුභාවයක් නොපැවතුණි.

(vi) මුදල් රෙගුලාසි 3(1) අනුව රජයේ සියළුම කාර්යයන් කලින් තීරණය කර සැලසුම් හා වැඩසටහන්වල දැක්විය යුතු වුවද, රහහලට අදාල වියදම් දැරීම සඳහා එසේ සැලසුම් කර නොතිබුණු අතර එම වියදම වාර්ෂික ඇස්තමේන්තුවේ ඇතුළත් කර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(vii) විදුලි බිල්පත් සඳහා ගෙවීම් කිරීමේදී, යම් මසක බිල්පත ලැබී දින 15 ක් තුල ගෙවීම් කළ යුතු බවත්, ප්‍රමාද වන ගෙවීම් සඳහා 16 වන දින සිට 1.20% ක මාසික පොලී මුදලක් හිඟ බිල්පත් වටිනාකම මත අයකරනු බවත් බිල්පතෙහි සඳහන්ව තිබුණි. එසේ වුවද, රහහලේ මාසික විදුලි බිල්පත් සඳහා දින 15 ක් ඇතුලත ගෙවීම් කර ප්‍රමාද පොලී අයකර ගැනීම් වලක්වා ගැනීමට පියවර ගෙන නොතිබුණි. මේ හේතුවෙන් 2022 වර්ෂය තුලදී පාරිභෝජනය කල විදුලිය සඳහා වන ගෙවීම් වලට අමතරව රු.460,419ක අතිරේක මුදලක් අධිභාර ලෙස ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 හා 210(2) ප්‍රකාරව කටයුතු කළ යුතු බව නිරීක්ෂණය විය.

(viii) මධ්‍යස්ථානය තුල පෞද්ගලික සන්නිවේදන ආයතන තුනක් මඟින් පවත්වාගෙන යන සම්ප්‍රේෂණ ඇන්ටනා සඳහා සේවා සැපයීම වෙනුවෙන් අයකරනු ලබන බදුකුලී සහ විදුලි වියදම් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

- සම්ප්‍රේෂණ ඇන්ටනා පවත්වාගෙන යනු ලබන පෞද්ගලික සන්නිවේදන ආයතන දෙකක් සමඟ එළඹ තිබූ ගිවිසුම් 2022 දෙසැම්බර් 31 දින වන විට අවසන් වී තිබුණද, නව ගිවිසුම්වලට එළඹ නොතිබුණි. මේ හේතුවෙන් මිල ගණන් සංශෝධනය කර වැඩි ආදායමක් උපයා ගැනීමට රහහලට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.
- ගිවිසුම් ප්‍රකාරව සෑම මසකම 10 වන දින බදු කුලිය ගෙවිය යුතු වුවත් රගහලේ මාසික ආදායම් වාර්තා අනුව, උක්ත සඳහන් සන්නිවේදන ආයතන විසින් වාරික මුදල් නිසි පරිදි ගෙවා නොතිබුණු අතර ගිවිසුම්වලට එළඹීමේදී බදු කුලිය ගෙවීම ප්‍රමාද වීම මත අයකළ යුතු දඩ මුදලක් දක්වා නොතිබීමෙන් ප්‍රමාද දඩ මුදල් අයකළ නොහැකිව තිබුණි.
- රහහල හා එක් එක් සන්නිවේදන ආයතනය අතර වූ ගිවිසුම් අනුව, සම්ප්‍රේෂණ ඇන්ටනා පවත්වාගෙන යාම සඳහා භාවිතා වන විදුලිය වෙනුවෙන් වූ වියදම් එම ආයතන විසින් රහහල වෙත ගෙවිය යුතු අතර රහහල විසින් අදාල බිල්පත් පියවිය යුතු වේ. එසේ වුවද, උක්ත සඳහන් ආයතන විසින් විදුලි බිල්පත් නිසි පරිදි ගෙවා නොතිබීම හේතුවෙන් 2021 හා 2022 වර්ෂ සඳහා රු.1,255,465ක මුදලක් අයවිය යුතුව පැවතුණි.

(ix) මධ්‍යස්ථාන පරිශ්‍රය තුල වර්ග අඩි 400 ක පමණ භූමියක් හාවිතා කරමින් යුධ හමුදාව විසින් ආපන ශාලාවක් පවත්වාගෙන යනු ලබන අතර ඒ සඳහා අදාල හමුදාව වෙතින් කිසිදු කුලී මුදලක් අයකරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. ආපනශාලාව සුභසාධන පදනම මත ක්‍රියාත්මක කරන බැවින් හා එම ආපනශාලාවේ කටයුතු රහහලේ කටයුතු සමඟ සම්බන්ධ නොවන පරිදි වෙන්ව පවත්වාගෙන යනු ලබන බැවින් පරිශ්‍රය වෙනුවෙන් කුලී මුදලක් නොගෙවන බව අදාල යුධ හමුදා අංශය විසින් විගණනය වෙත දක්වන ලදි. එසේ වුවද, අදාල භූමි පරිශ්‍රය ඉතා ඉහළ ආර්ථික වටිනාකමකින් යුක්ත බවත් එම පරිශ්‍රයට අදාලව පිරිසිදු කිරීම්, විදුලි බිල්, ජල බිල් යනාදියද රහහල මඟින්ම දරන බැවින් තක්සේරු වටිනාකම මත කුලී මුදලක් අයකළ යුතු බව නිරීක්ෂණය විය.

(උ) කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා වූ අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා වූ අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය සිදු කරනු ලබන ව්‍යාපෘති බොහෝමයක් ඉටු කිරීම සඳහා වෙනත් ආයතන පවතින බැවින් තවදුරටත් කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා වෙනමම ව්‍යාපෘතියක් පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැති බව නිරීක්ෂණය විය.

(ii) කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩල කාර්යාල පරිශ්‍රය සඳහා මහනුවර මහ නගර සභා සීමාව තුළ පිහිටි ගොඩනැගිල්ලක් බදු කුලී පදනමට ලබා ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර තිබුණි. අදාල බදු ගිවිසුමට අනුව අමාත්‍යාංශය විසින් දේපළෙහි සිදු කරන ලද රු.6,194,607ක සවිකිරීම් හා ඉදිකිරීම්, බදු ගිවිසුම අවසානයේ පවත්නා තක්සේරු වටිනාකම මත බදුදීමනාකරු වෙතින් අය කර ගැනීමට අමාත්‍යාංශය පියවර ගෙන නොතිබූ අතර නව බදු ගිවිසුමට එම කොන්දේසි ඇතුළත් කිරීමට ද කටයුතු කර නොතිබුණි.

(ඌ) පූර්ණ හිමිකාරිත්වය අමාත්‍යාශය සතු සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් (පුද්) සමාගම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) සංස්කෘතික අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල ඉදිකිරීම් හා නඩත්තු කටයුතු කාර්යක්ෂමව ඉටු කරවා ගැනීමේ අරමුණින් අමාත්‍යාංශය වෙත පූර්ණ කොටස් අයිතිය ඇතිව ලියාපදිංචි කර තිබූ සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් (පුද්) සමාගමේ 2018/2019, 2019/2020, 2020/2021 හා 2021/2022 මූල්‍ය වර්ෂවලට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) වර්තමානයේ සමාගමේ කටයුතු සම්පූර්ණයෙන්ම අක්‍රිය වී ඇති බැවින් සමාගම ඇවර කිරීමට 2021 ජූලි 05 දින අග්‍රාමාතය ලේකම්වරයා වෙතින් ඉල්ලා තිබුණද ඇවර කිරීමේ ක්‍රියාවලිය මෙම වාර්තාවේ දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

4. යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) සහ 40 (3) වගන්ති ප්‍රකාරව අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින්, 2021 හා 2022 වර්ෂවල අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර තිබූ විගණන විමසුම් 07 ක් සම්බන්ධයෙන් අදහස් දැක්වීම් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 6 වගන්තිය ප්‍රකාරව වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීමේදී මුදල් රෙගුලාසි 134(2) හි සඳහන් පරිදි විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශයේ සංස්කෘතික අංශය සඳහා දහසකට ආසන්න කාර්ය මණ්ඩලයක් සහ දිවයින පුරා පිහිටුවා ඇති සංස්කෘතික මධ්‍යස්ථාන 208 ක් ක්‍රියාත්මකව පැවතියද, අනුමත අභ්‍යන්තර විගණක තනතුර වසර කිහිපයක සිට පුරප්පාඩුව පැවතුණි.

5. මානව සම්පත් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශය සඳහා අනුමත කාර්ය මණ්ඩලය 219ක් හා තත්‍ය කාර්ය මණ්ඩලය 164 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව 55කි. ඒ අතුරින්, අධ්‍යක්ෂ තනතුරක, ඉංජිනේරු සහ සහකාර ඉංජිනේරු තනතුරු 02 ක, සහකාර ලේකම් තනතුරු 03 ක පුරප්පාඩු පැවතුණි. ඊට අමතරව, සංවර්ධන නිලධාරී තනතුරු 13 ක සංවර්ධන සහකාර තනතුරු 12 ක සහ කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 9 ක සහ රියදුරු තනතුරු 07 ක පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම අමාත්‍යාංශයේ කාර්යසාධනය කෙරෙහි බලපෑමක් ඇති කරන බව නිරීක්ෂණය කෙරේ.

(ආ) සංස්කෘතික අංශය සඳහා සහකාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීන් 201 ක් අනුමත කර තිබුණද තත්‍ය සංඛ්‍යාව 133 ක් වූ අතර තනතුරු 68 ක් එනම් සියයට 34 ක පුරප්පාඩු පැවති අතර සංස්කෘතික අංශය සඳහා අනුමත සංවර්ධන නිලධාරී සංඛ්‍යාව 141 ක් වුවද තත්‍ය සංඛ්‍යාව 187 ක් වුයෙන් තනතුරු 46 ක එනම්, සියයට 33 ක අතිරික්තයක් පැවතුණි.

(ඇ) අමාත්‍යාංශය සතුව සංස්කෘතික මධ්‍යස්ථාන 208 ක් පැවතුණද මධ්‍යස්ථාන මුරකරුවන් 297 ක් සේවයේ යොදවා තිබුණි. 2020 දෙසැම්බර් 10 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දරන්නාට පමණක් පෞද්ගලික වන සේ මුරකරුවන් 106 ක් අනුමත කිරීම හේතුවෙන් මෙම අතිරික්තය වාර්තා වී තිබුණි. සිදුකළ විගණන පරීක්ෂාවේදී අතිරික්ත මුරකරුවන් 89 දෙනාගේ සේවය කාර්යක්ෂම අයුරින් ලබා ගැනීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. මෙම මධ්‍යස්ථානවල සේවයේ නිරත සේවකයන් සඳහා ඇඹිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීමේ වැදගත්කම 2021 වර්ෂයේ විගණන වාර්තාවලින් පෙන්වා දී තිබුණද අමාත්‍යාංශය විසින් මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ඈ) මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය සඳහා "කාර්යාල කාර්ය සහායක තනතුර" අනුමත තනතුරක් නොවුවද 2022 දෙසැම්බර් 31 දින වන විටත් පුද්ගලයන් 02 දෙනෙකු එම තනතුරේ සේවය කරමින් පැවතුණි.

එච්.එම්.රණසිංහ මුණ්ඩා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශකය

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස		
	100-90 %	75-89 %	50-74 %
1. පූජාභූමි වල පහසුකම් වැඩිවීමේ ප්‍රමාණය	√	-	-
2. විහාරස්ථානවල භෞතික යටිතල පහසුකම් වැඩිවීමේ ප්‍රමාණය	√	-	-
3. සමාජීය ආර්ථිකමය හා ආධ්‍යාත්මික වශයෙන් බලගැන්වූ ගම්මාන ඇති වීමේ ප්‍රමාණය	√	-	-
4. ශ්‍රී දළදා මාළිගාවට අනුයුක්තව පල්ලෙකැලේ ප්‍රාසාංගික පුහුණු මධ්‍යස්ථානය ඉදි කිරීම් නිම කිරීමේ ප්‍රමාණය	√	-	-
5. විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ඉදි කිරීම	√	-	-
6. සාමණේර හා උපසම්පදා භික්ෂු පුහුණුව	-	√	-
7. කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ දහම්පාසැල් ගොඩනැගිල්ල ඉදි කිරීම් නිම කිරීමේ ප්‍රමාණය	-	-	√

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0-49 (%)	50-74 (%)	75-100 (%)
1. පූජාභූමිවල සංරක්ෂණය සහ සංවර්ධනය.	පූජාභූමිවල භෞතික/යටිතල පහසුකම් ඉහළ නැංවීම.	පූජාභූමි වල පහසුකම් වැඩිවීමේ ප්‍රමාණය			√
2. විහාරස්ථානයන්හි පවතින භෞතික අඩුපාඩු අවම කිරීම.	විහාරස්ථානවල භෞතික යටිතල පහසුකම් ඉහළ නැංවීම.	විහාරස්ථානවල භෞතික යටිතල පහසුකම් වැඩිවීමේ ප්‍රමාණය			√
3. සමාජීය, ආර්ථිකමය හා ආධ්‍යාත්මික වශයෙන් පූර්ණ පුද්ගලයින් බිහි කිරීම.	සමාජීය , ආර්ථිකමය හා ආධ්‍යාත්මික වශයෙන් බල ගැන්වූ ගම්මාන ඇති කිරීම.	සමාජීය ආර්ථිකමය හා ආධ්‍යාත්මික වශයෙන් බලගැන්වූ ගම්මාන ඇති වීමේ ප්‍රමාණය			√
4. ශිල්පීන්ට පුහුණු ස්ථානයක් සකස් කිරීම.	ශ්‍රී දළදා මාළිගාවට අනුයුක්තව පල්ලෙකැලේ ප්‍රාසාංගික පුහුණු මධ්‍යස්ථානය ඉදි කිරීම.	ඉදිකිරීම් නිම වීමේ ප්‍රමාණය			√
5. පූර්ණ දැනුමැති භික්ෂූන් වහන්සේලා බිහි කිරීම.	සාමණේර හා උපසම්පදා භික්ෂු පුහුණුව.	වාර්ෂිකව පුහුණු වන භික්ෂූන් වහන්සේලා සංඛ්‍යාව			√
6. ජාතික හා අන්තර්ජාතික මට්ටමින් ථේරවාද බුදු දහම ව්‍යාප්ත කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම.	විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම. (V වන අදියර)	ඉදිකිරීම් නිම වීමේ ප්‍රමාණය			√
7. අධ්‍යාත්මික වශයෙන් පරිපූර්ණ දරුවන් බිහි කිරීම.	කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ දහම්පාසැල් ගොඩනැගිල්ලේ ඉදි කිරීම් නිම කිරීම.	දහම්පාසලේ භෞතික යටිතල පහසුකම් වැඩිවීමේ ප්‍රමාණය		√	

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

තිරසර සංවර්ධන ඉලක්ක අතරින් ‘‘තිරසර සංවර්ධනය පිණිස සාමකාමී හා සංයුක්ත සමාජ ප්‍රවර්ධනය උදෙසා සැමට ප්‍රවේශය ලබා දීම සහ ඵලදායී වගවීම සහිත සංයුක්ත ආයතන ගොඩනැගීම’’ යන 16 වන සංවර්ධන ඉලක්කය සපුරා ගැනීමට මෙම අමාත්‍යාංශය මගින් සෘජු දායකත්වයක් ලබා දීම සිදු වේ.

ඒ අනුව යමින් ළමා සමාජය ඵලදායී හා විනය ගරුක කිරීම සඳහා බෞද්ධාගමික ඉගැන්වීම් වෙනුවෙන් ඉරිදා දිනයන්හි බෞද්ධ විහාරස්ථාන ආශ්‍රිතව දහම් පාසල් පද්ධතියක් ක්‍රියාත්මක වන අතර දහම් පාසල් යටිතල පහසුකම් සැපයීමට වෙන් වන ප්‍රතිපාදන ප්‍රමාණය සීමා සහිත වීමත්, ස්වේච්ඡා ගුරුවරුන්ගෙන් පමණක් දහම් පාසල් පද්ධතිය ක්‍රියාත්මක කිරීමට සිදුවී තිබීමත්, ඉරිදා දින දරුවන් සඳහා වෙනත් උපකාරක පන්ති පැවැත්වීම මත දරුවන් දහම් පාසල් වෙත පැමිණීම දුර්වලවීමත් ළමා සමාජය තුල දහම් දැනුම වර්ධනය කිරීමට පවතින බාධාවන් වේ.

ජනගහනයෙන් 72% ක් පමණ වන බෞද්ධ ජනතාව දිවයින පුරා විසිරී සිටියද දුෂ්කර ප්‍රදේශවල පිහිටි සමහර විහාරස්ථානවල ස්වාමීන් වහන්සේලා නොසිටීම හෝ අල්ප වශයෙන් සිටීමද ජනතාවට ලබා දිය යුතු ශාසනික මෙහෙවර ලබා දීමට බාධාවක් වී ඇත.

පුණ්‍යග්‍රාම වැඩසටහන තුලින් ජනතාව තුල අධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීමට ක්‍රියා කළද සියළු ක්ෂේත්‍ර වල සංවර්ධනයක් ඇති කිරීමට මෙය ප්‍රමාණවත් නොවන අතර අනෙකුත් ආයතනවල සහායද ලැබීම අවශ්‍යව පවතී.

රට තුල පැවති ආර්ථික අර්බුද හමුවේ ඉන්ධන හිඟය, ගොඩනැගිලි ද්‍රව්‍ය වල මිල ගණන් ඉහල යාම වැනි හේතූන් නිසා පුණ්‍යග්‍රාම වැඩසටහන යටතේ ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන්, ආගමික සහජීවන වැඩසටහන් හා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීමට හා ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ගැටළු ඇතිවිය.

එසේ වුවද පවතින සම්පත් ප්‍රශස්ත මට්ටමින් උපයෝගී කර ගනිමින් 2022 වර්ෂය තුල නියමිත ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ අතර ව්‍යාපෘතින්හි භෞතික ප්‍රගතිය ඉහල ප්‍රතිශතයක් ගැනීමෙන් ඒ බව තහවුරු වේ.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය (2022.12.31 දිනට)

සේවක මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	21	15	06
තෘතීක	05	04	01
ද්විතීයික	143	104	39
ප්‍රාථමික	50	41	09

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇති ආකාරය

ද්විතීක ශ්‍රේණියේ තනතුරු අතුරෙන් සිටින නිලධාරියාට පෞද්ගලික වන සේ අනුමතව ඇති තනතුරු වලින් 13 ක පුරප්පාඩු පවතින බැවින් එම තනතුරු යටපත් කරන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. එම ශ්‍රේණියේ ඉතිරි පුරප්පාඩු අතුරෙන් බහුතරය සංවර්ධන නිලධාරී සේවයේ හා කළමනාකරණ සේවා නිලධාරී සේවයේ පුරප්පාඩු වේ.

නමුත් සිටින කාර්ය මණ්ඩලය ප්‍රශස්ථ මට්ටමින් යොදවමින් රාජකාරි ඉටුකර ගැනීමට කටයුතු කර ඇත.

6.3 මානව සම්පත් සංවර්ධන

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
				දේශීය (රු.)	විදේශීය (රු.)		
1.	කාර්යාල ක්‍රම පුහුණුව - I	නිලධාරීන් - 30	දිනකට පැය 4	15.78	-	දේශීය	
2	කාර්යාල ක්‍රම පුහුණුව - II	නිලධාරීන් - 30	දිනකට පැය 4	24.81	-	දේශීය	
3.	රසවින්දන සංගීත වැඩසටහන	නිලධාරීන් - 160	-	-	-	දේශීය	
4.	ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි - I	නිලධාරීන් - 25	එක්දින	26.458	-	දේශීය	නිලධාරීන්ගේ විෂයය දැනුම / ආකල්ප වර්ධනය
5.	ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි - II	නිලධාරීන් - 35	එක්දින	27.626	-	දේශීය	නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ යාම
6.	ව්‍යාපෘති නිරීක්ෂණ පුහුණු වැඩසටහන	මාණ්ඩලික නිලධාරීන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්	එක් දින	85.343	-	දේශීය	
7.	ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී ආයතනයට ගෙවූ වාර්ෂික සාමාජික ගාස්තු	නිලධාරීන් 1	-	10	-	දේශීය	

8.	වාහන නඩත්තු පුහුණු වැඩසටහන	නිලධාරීන් 3	එක් දින	15	-	දේශීය	
9.	ලිපිගොනුකරණය	නිලධාරීන් 1	එක් දින	5	-	දේශීය	
10.	නිවාඩු නිකේතනයක් විධිමත්ව පවත්වා ගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන	නිලධාරීන් 3	එක් දින	13.395	-	දේශීය	නිලධාරීන්ගේ විෂයය දැනුම / ආකල්ප වර්ධනය
11.	පරිගණක දෘඪාංග සම්බන්ධ පුහුණුව	නිලධාරීන් 25	එක් දින	82.590	-	දේශීය	නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ යාම
12.	පෞද්ගලික ලිපිගොනුවක් ඵලදායීව පවත්වාගෙන යාම	නිලධාරීන් 5	එක් දින	25	-	දේශීය	
13.	අමාත්‍යාංශයේ ප්‍රායෝගික උපාය මාර්ග පිළිබඳ දේශනය	නිලධාරීන් 130	එක් දින	25.270	-	දේශීය	

පොදුවේ පුහුණුවීම් තුලින් විෂයය දැනුම, ආකල්ප වර්ධනය වන අතර පැමිණෙන මහජනතාවගේ කටයුතු නොපමාව ඉටුකරදීම හා අනෙකුත් රාජකාරි කාර්යක්ෂමව හා ඵලදායකව ඉටුකිරීමට කාර්යය මණ්ඩලය යොමු වීම තුළින් ආයතනයේ කාර්යසාධනය වර්ධනය වීම සිදුවේ.

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	√		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	√		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත්පත් හා ලේඛණ නඩත්තු කිරීම**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	√		
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.9	හානිපාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම.	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	√		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	√		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	√		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	√		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	√		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	√		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	√		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	√		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	√		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	×	ඇතැම් අවස්ථාවලදී හා ඇතැම් ආයතන වලින් පිළිතුරු ලැබීම ප්‍රමාද වේ.	නිරන්තර දැනුවත් කිරීම් මගින් හා විගණන කළමනාකරණ කමිටු රැස්වීම් මගින් ඉලක්ක වෙත ළඟා වීම
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත්කර සිටීම	√		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	√		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 1-2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	√		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිලිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කිරීම.	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම	√		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	√		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	√		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	√		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	√		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	√		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	√		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	√		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	√		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	√		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	√		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	√		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	√		
12.2	හිඟ හිටි ණය ශේෂ පිලිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	√		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	√		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	√		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	√		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම , එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	√		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	√		
14.4	අග්‍රිම ගිණුම් ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	√		
15	**ආදායම් ගිණුම්**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අදාළ නොවේ		
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කොට තිබීම	අදාළ නොවේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා.වෙත ඉදිරිපත්කර තිබීම	අදාළ නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	√		
16.2	කාර්යමණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	√		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබීම	√		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
17.2	ආයතනය පිලිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	√		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	√		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි , පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	√		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	√		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	√		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	√		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	√		

සංස්කෘතික කටයුතු අංශය

පරිච්ඡේදය - 01 ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලාංකීය ප්‍රෞඩ උරුමයන් සංරක්ෂණය කිරීමේ හා ආරක්ෂා කිරීමේ පූර්ණ වගකීම දරමින්, සාහිත්‍ය හා කලාව පෝෂණය කරමින්, අනන්‍ය ශ්‍රී ලාංකීය ජාතියක් බිහි කිරීමේ උදාර කර්තව්‍ය ඉටු කිරීමට සංස්කෘතික කටයුතු අංශය බැඳී සිටී. මේ සඳහා සංස්කෘතික කටයුතු අංශය වශයෙන් අප, ජාතික ප්‍රතිපත්තීන්ට අනුකූලව, තිරසර සංවර්ධන වැඩසටහන පාදක කරගනිමින් යහ ගුණයෙන් පිරිපුන් වූ සංවේදී මිනිසුන්ගෙන් සපිරුණු තිරසර සංවර්ධිත ශ්‍රී ලංකාවක් වෙත පිය නැගීමට අවැසි කාර්යභාරය ඉටු කරමින් සිටී. ඒ අනුව 2022 වසර තුළ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ කාර්යයන් අතරින් සංස්කෘතික කටයුතු අංශයේ කාර්ය සාධනය මෙහි අන්තර්ගත වේ.

1.2 දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

"තිරසාර ලෙස සංවර්ධිත ශ්‍රී ලංකාවක්"

මෙහෙවර

සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක උරුමයන් ස්ථානීය හා අස්ථානීය සංරක්ෂණය, චිත්‍රපට, නාට්‍ය හා රංග කලාවන්, ස්පෘෂ්‍ය - අස්පෘෂ්‍ය උරුමය හා රාජ්‍ය ලේඛන සංරක්ෂණය කිරීම සහ ශ්‍රී ලාංකීය සංස්කෘතිකාංග සංරක්ෂණය, ප්‍රවර්ධනය හා ප්‍රචාරණය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම

අරමුණු

රටක සංස්කෘතිය, එම රටේ ජනතාව සුඛිත මුදිත කිරීම සඳහා හඳුන්වා දෙනු ලබන සියලු වැඩසටහන් වඩාත් ඵලදායී ලෙස සඵල කර ගැනීම සඳහා ඉවහල් වන ජනතා හැසිරීම මෙහෙය වන ප්‍රධාන මෙවලම ලෙස සලකා අරමුණු හඳුනාගෙන ඇත.

- රටේ පොදු ජාතික සංවර්ධන ප්‍රතිපත්ති සාර්ථක කර ගැනීමට හේතුවන ආකාරයෙන් ජනතාව ස්වයංව මෙහෙයවන සාධනීය සංස්කෘතික පරිසරයක් රට තුළ ගොඩනැගීම

- ශ්‍රී ලාංකීය බහු ජාතිකත්වය පිළිගනිමින්, ඒ එක් එක් උප සංස්කෘතිවල අනන්‍යතාව ආරක්ෂා කරන අතරම සියලු උප සංස්කෘති එක්ව ගෙන ශ්‍රී ලාංකික වූ මහා සංස්කෘතියක් සහිත රටක් ලෙස ඉදිරියට පවත්වාගෙන යාම සහ විවිධ බලවේග හරහා හානියට පත්වන සාධනීය සංස්කෘතිකාංග, එවැනි හානිවලින් වළක්වා ගැනීම

- සංස්කෘතික උරුමයන් සංරක්ෂණය, පවත්වාගෙන යාම සහ ප්‍රයෝජනයට ගැනීම මඟින් රටේ ජනතාවගේ ජීවිතයේ සංස්කෘතිකමය හැඩ ගැස්ම සකස්කර ගැනීමට මං සැලසීම

- සාධනීය සංස්කෘතිකාංග හඳුනා ගැනීමට හා ඒවා තම ජීවිතයට යාකර ගැනීමට ජනතාව පෙළඹවීම හා ඒ මඟින් ශ්‍රී ලාංකික අනන්‍යතාවය ඇති සංස්කෘතියක් ගොඩනැගීම

- සංස්කෘතික පරිහානියට හේතුවන බාහිර අභ්‍යන්තර සාධක හඳුනාගැනීමේ හා ඒවා නිශේධනය කිරීමේ ස්වයං ශක්තිය ජනතාවට ලබා දීම

- දේශාභිමානී චින්තනය පෙරටු කරගත් සංවර්ධන ඉලක්ක සපුරාලීමට සමත්, ස්වයං අභිප්‍රේරණිකවූත්, සාමූහිකවූත්, බලවේගයක් ලෙස සංස්කෘතික සමාජය තුළ මුල් බැස ගැනීමට සැලැස්වීම

1.3 ප්‍රධාන කාර්යයන්

- ශ්‍රී ලංකාවේ ජාතික සංස්කෘතිකයේ සියලුම අංගයන් අභිවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

- විදේශීය රටවල් සමඟ සංස්කෘතික සබඳතා පවත්වාගෙන යාම

- සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක උරුමයන්ට හානි නොවන පරිදි සංස්කෘතිය පදනම් වූ සංචාරක වැඩසටහන් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම

- ජාතීන් අතර සහයෝගය ඇති කිරීමෙහිලා සංස්කෘතිකමය දායකත්වය යොදවා ගැනීමේ ප්‍රවණතාවයන් හඳුනාගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම

- ඓතිහාසික, පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම

- නවීන හා සාම්ප්‍රදායික කලා නිර්මාණ ප්‍රවර්ධනය සහ කලා ශිල්පීන් දිරිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම

- නාට්‍ය, සංගීතය හා නර්තන ක්ෂේත්‍රයන්ගේ අභිවර්ධනයට අදාළ ක්‍රියාමාර්ග හඳුනාගෙන ක්‍රියාවට නැංවීම

- රාජ්‍ය ලේඛන විධිමත්ව කළමනාකරණය හා සංරක්ෂණය කිරීම

- මධ්‍යම සංස්කෘතික අරමුදල පරිපාලනය සහ ඒ පිළිබඳව අධ්‍යයනයක් කර ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කිරීම

- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.

- නාස්තිය හා දූෂණය පිටුදකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.

- සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම, ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය යන ආයතනයන්ට පැවරී ඇති සියලුම විෂයයන් අධීක්ෂණය කිරීම.

1.4 සංස්කෘතික කටයුතු අංශය - සංවිධාන සටහන - 2022


ගරු විෂය භාර අමාත්‍යතුමා
අමාත්‍යාංශ ලේකම්තුමා
අතිරේක ලේකම් (පාලන)
ප්‍රධාන ගණකාධිකාරී
ගණකාධිකාරී (ගංවඩි)
ගාමක ප්‍රධාන ශ්‍රී ලේඛ
ගණකාධිකාරී (මූල්‍ය හා මූලමානය)
ගාමක ප්‍රධාන මූලමානඥ
ස්ථිරකාර්ය ලේකම්
අභ්‍යන්තර විගණක
ගාමක ප්‍රධාන අ. වි.
ගාමක ප්‍රධාන ලේඛ
ගාමක පරිවර්තක
ජෙ.ස.ලේ.(පාලන)
සහකාර ලේකම් (පාලන/මූ.පාලන/ පුළුගන)
පරිපාලන නිලධාරී
ගාමක ප්‍රධාන පාලන
ගාමක ප්‍රධාන ම පාලන
ගාමක ප්‍රධාන පුළුගන
සහකාර ලේකම් (විමද්ශ)
ගාමක ප්‍රධාන විමද්ශ
අතිරේක ලේකම් (ප්‍රතිපත්ති)
අධ්‍යක්ෂ(සංස්කෘතික පුළුගන / ඉදිකිරීම්)
සහකාර ලේකම් (ඉදිකිරීම්)
ගාමක ප්‍රධාන ඉදිකිරීම්
ඉංජිනේරු
සහකාර ලේකම් (පුළුගන/ඉදිකිරීම්)
ගාමක ප්‍රධාන පුළුගන
අධ්‍යක්ෂ(සැලසුම්)
නි.අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ(සැලසුම්)
ගාමක ප්‍රධාන සැලසුම්
ක්‍රම.ලේ.ම.
ක්‍රම.ලේ.ම.
ක්‍රම.ලේ.ම.

1.5 අමාත්‍යාංශයේ සංස්කෘතික කටයුතු අංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

I.  සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලාංකීය ජනතාව අධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය වූ සංවේදී මිනිසුන් බවට පත් කිරීමේ ඒකායන අපේක්ෂාව සපුරා ගැනීම වස්, ශ්‍රී ලාංකික සංස්කෘතිය ගොඩනැගීමේ අරමුණින් යුතුව, ශ්‍රී ලාංකික අනන්‍යතාවයෙන් යුත් සාහිත්‍ය කලා හා සංස්කෘතික කටයුතු සංරක්ෂණය, ප්‍රවර්ධනය, ව්‍යාප්තිකරණය සඳහා වූ වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම මෙම සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

A. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ආයතන

- ජාතික කලාභවන හා ජෝන් ද සිල්වා සමරු රඟහල
- නිදහස් මන්දිරය
- මහාවංස සම්පාදන කාර්යාලය
- ශබ්දකෝෂ කාර්යාලය
- විශ්වකෝෂ කාර්යාලය
- ජන සංගීත සංරක්ෂණ ඒකකය
- එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය පුහුණු පාසල
- වලිසිංහ හරිස්චන්ද්‍ර කෞතුකාගාරය හා සංස්කෘතික කේන්ද්‍රය
- ජාතික කලා නිකේතනය - මහනුවර කුන්ඩසාලේ
- උතුරු දකුණු මිතුරු සෙවණ - මිහින්තලේ
- පොත් ගබඩාව හා පොත් අලෙවිසැල
- රාජ්‍ය නැටුම් කණ්ඩායම හා රාජ්‍ය සංගීත කණ්ඩායම

මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරන අනෙකුත් කටයුතු

- සංස්කෘතික, කලා හා සාහිත්‍ය කටයුතු ප්‍රවර්ධනය උදෙසා රාජ්‍ය උත්සව/උළෙල සංවිධානය කිරීම හා කලාකරු සුභ සාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- සංස්කෘතික, කලා හා සාහිත්‍ය කටයුතු ප්‍රවර්ධනය උදෙසා විශේෂ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

II. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

1877 වර්ෂයේ ස්ථාපනය කරන ලද ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මඟින්, සෞභාග්‍යමත් අනාගතයක් උදෙසා ජාතික උරුමය සංරක්ෂණය, ප්‍රදර්ශනය හා ප්‍රචාරණය කිරීමත්, සංස්කෘතික හා ස්වාභාවික උරුමයට අයත් සම්පත් විද්‍යාත්මකව හා ක්‍රමානුකූලව ආරක්ෂා කිරීම හා මහජනතාවගේ ඇගයීම, අධ්‍යාපනය හා රසාස්වාදය උදෙසා ඉදිරිපත් කිරීමත් සිදු කරයි.

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- දිවයින පුරා පිහිටුවා ඇති ජාතික කෞතුකාගාර (10කි)
- මානව විද්‍යා අංශය
- මානව වංශ විද්‍යා අංශය
- භූ විද්‍යා අංශය
- සත්ත්ව විද්‍යා අංශය
- කීට විද්‍යා අංශය
- උද්භිද විද්‍යා අංශය
- සංරක්ෂණ අංශය
- පුස්තකාලය
- අධ්‍යාපන හා ප්‍රකාශන අංශය

III. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

සංස්කෘතික දායාදයේ කොටසක් ලෙස රාජ්‍ය ලේඛන විධිමත්ව කළමනාකරණය සහ සංරක්ෂණය උදෙසා ජාතික ලේඛනාරක්ෂක නීතිය සහ ඊට අදාළ නීති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම, ස්ථිර සංරක්ෂණය සඳහා රාජ්‍ය ලේඛන සහ අද්විතීය පෞද්ගලික ලේඛන ආබද්ධ කර ගැනීම, අදාළ නීති රීතිවලට අනුකූලව සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන රාජ්‍ය ලේඛන කළමනාකරණය සහ සංරක්ෂණය කිරීම, අදාළ නීතිමය තැන්පතුවට පුවත්පත් සහ ප්‍රකාශන උපචිත කරගැනීම මෙන්ම රාජ්‍ය පරිපාලන ක්‍රියාවලියේ දී සහ මහජන පර්යේෂණය සඳහා, තැන්පතු ලේඛනවලින් තොරතුරු සමුද්ධනය කිරීමට පහසුකම් සැලසීම ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව මගින් සිදු කරයි.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- රාජ්‍ය ලේඛන ආබද්ධ කරගැනීම් අංශය
- ප්‍රදර්ශන අංශය
- පොත් සහ පුවත්පත් ලියාපදිංචිය අංශය
- ලේඛන සංරක්ෂණය අංශය
- පුවත්පත් සූක්ෂම ඡායාගත කිරීමේ අංශය
- ලේඛනාගාර ගොඩනැගිල්ල පුළුල් කිරීමේ අංශය
- ලේඛන කළමනාකරණ ව්‍යාපෘතිය අංශය
- පර්යේෂණ අංශය
- මහජන සම්බන්ධතා අංශය

IV. ශ්‍රී ලංකා කලා මණ්ඩලය

කලා කටයුතු ප්‍රවර්ධනය, සංරක්ෂණය හා සංවර්ධනය සඳහා අවශ්‍ය අනුමණ්ඩල පත්කොට ඒවාට නායකත්වය සැපයීම හා මඟ පෙන්වීම, සාහිත්‍ය, නාට්‍ය, සංගීත, නර්තන හා චිත්‍ර අනුමණ්ඩලය මගින් දීප ව්‍යාප්තව කටයුතු සංවිධානය කිරීම, ජාතික මට්ටමේ ඇගයීම්වලට ශිල්පීන් ගෙන ඒම හා ඔවුන් ජාතික තලයට හඳුන්වාදීම මගින් නියමිත ක්ෂේත්‍රයන් තුළ ඉහළම තලයන්හි පිහිටුවීම, ලලිත කලාවන්හි තත්වය වැඩි දියුණු කිරීම, ශ්‍රී ලංකාවට ආවේණික කලා ශිල්ප කර්මාණ්ත නගා සිටුවීම, කලා කටයුතු සඳහා සම්බන්ධිත වෙනත් දෙපාර්තමේන්තු, ආයතන, ස්වේච්ඡා සංවිධාන සමග සම්බන්ධවී කටයුතු කිරීම, සාරධර්මවලින් පිරි සමාජයක් බිහි කිරීම සඳහා සුදුසු සංස්කෘතික පරිසරයක් ගොඩනැගීම මෙහි ප්‍රධාන කාර්යයන් වේ.

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන/අරමුදල්

I.  එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම

අභාවප්‍රාප්ත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ මතකය සදාකාලිකව පවත්වා ගැනීම සඳහා "එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම" ලෙස පදනමක් 1975 පෙබරවාරි 04 වන දින පිහිටුවා ඇත. 1975 අංක 02 දරණ පාර්ලිමේන්තු පනතක් සහ 1981 සහ 1983 සංශෝධන මගින් පදනම බලාත්මක කර ඇත. දකුණු ආසියාවේ ප්‍රමුඛතම උත්සව සහ ප්‍රදර්ශන මධ්‍යස්ථානය බවට පත් වීමේ දැක්මෙන් යුතුව වෙළඳ නාමය,

භෞතික සම්පත් සහ මානව ප්‍රාග්ධනය නවීකරණයෙන් ඉහළ නැංවීමෙන් සංවිධානයේ සුවිශේෂී තත්වයක් පවත්වාගෙන යාම සහ වැඩිදියුණු කිරීම මෙහි මූලික කාර්යභාරයයි. මෙම පදනම යටතේ ප්‍රධාන අංග තුනක් ක්‍රියාත්මකයි.

- එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව (BMICH) - 1976 දී නොබැඳි සම්මේලනය සඳහා ඉදිකරන ලද අතර, රටේ සෑම ජාතික හා ජාත්‍යන්තර සමුළුවක් සඳහාම පහසුකම් සපයන ප්‍රධාන ආයතනය ලෙස ක්‍රියා කරයි.
- බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානය - ජාත්‍යන්තර සබඳතා සහ භාෂා පාඨමාලා ක්‍රියාත්මක කිරීම සිදු කරයි.
- කෞතුකාගාර - එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක කෞතුකාගාරය හා සිරිමාවෝ බණ්ඩාරනායක කෞතුකාගාරය ලෙස කෞතුකාගාර දෙකකි.

II. ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය

ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ පළමු විධායක ජනාධිපති ‘‘ජූනියස් රිචඩ් ජයවර්ධන’’ ජනාධිපතිවරයාගේ සංකල්පයකට අනුව 1988 අංක 77 දරණ පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම මධ්‍යස්ථානය පුස්තකාලයකින්, කෞතුකාගාරයකින්, ජනාධිපති ලේඛනාගාරයකින් සහ ජපන් කෞතුකාගාරයකින් සමන්විත වේ. එහි කෞතුකාගාරය තුළ ජයවර්ධන මැතිතුමාගේ පෞද්ගලික පුස්තකාල එකතුව සහ එතුමාගේ දේශපාලන දිවියට අදාළ ලිපි ලේඛන මෙන්ම ජනාධිපති මහලේකම් කාර්යාලයේ පැවති සමහර ලිපි ලේඛන සහ වාර්තා ද එතුමාගේ ධූර කාලය තුළ ලද ත්‍යාග ද තැන්පත් කර ඇත. මෙම මධ්‍යස්ථානය ප්‍රදර්ශනය සඳහා මහජනතාවට විවෘතව පවතින අතර මෙමගින් විවිධ සමාජ සේවා කටයුතු රැසක් ද වර්තමානයේ ක්‍රියාත්මක කරනු ලබයි.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

2022 වසර තුළ දී සංස්කෘතික කටයුතු අංශය මගින් විදේශ ආධාර ලබන ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොමැත.

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන, සංස්කෘතික කටයුතු අංශය යටතේ ක්‍රියාත්මක ප්‍රධාන වැඩසටහනකි. මේ යටතේ, දිවයින පුරා විසිරී සිටින දරුදැරියන්ගේ හා කලාකරුවන්ගේ කලා කුසලතා ඔප්නැංවීම සඳහා රංගකලා අධ්‍යයනාගාර, පුස්තකාල පහසුකම් සහ නවීන පහසුකම්වලින් යුත් රංග ශාලාවක් ස්ථාපනය කිරීම අරමුණු කරගනිමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ''සංස්කෘතික මධ්‍යස්ථානයක්'' පිහිටුවීමට කටයුතු කර ඇත. මෙය සාම්ප්‍රදායික රංග කලාවන් සහ සම්භාව්‍ය සංස්කෘතික අංග සංරක්ෂණයකර, ඉන් පෝෂිත සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමට හා මෙම සංස්කෘතිකාංග පොදු මහජනයා අතරට ගෙන යාමට දායක වන විධිමත් යාන්ත්‍රණයකි.

සංස්කෘතික මධ්‍යස්ථාන පිළිබඳ මූලික තොරතුරු

පළාත	දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ. කොට්ඨාශ ගණන	පිහිටුවා ඇති ක්‍රියාත්මක සං.ම.	විවෘත කිරීමට නියමිත සං.ම.	ඉදි කරමින් පවතින නව සං.ම.
මධ්‍යම	මහනුවර	20	15	-	-
	මාතලේ	11	11	-	-
	නුවරඑළිය	05	04	-	-
නැගෙනහිර	අම්පාර	20	07	04	01
	මඩකලපුව	14	06	-	-
	ත්‍රිකුණාමලය	11	06	-	-
උතුරු මැද	අනුරාධපුර	22	13	01	01
	පොළොන්නරුව	07	06	-	-
උතුර	යාපනය	15	10	-	-
	කිලිනොච්චි	04	-	-	-
	මන්නාරම	05	-	-	-
	මුලතිව්	06	-	-	-
	වවුනියා	04	02	-	-
වයඹ	කුරුණෑගල	30	18	04	02
	පුත්තලම	16	08	02	-
සබරගමුව	කෑගල්ල	11	09	-	-
	රත්නපුර	17	08	-	-
දකුණ	ගාල්ල	19	14	-	-
	හම්බන්තොට	12	07	-	-
	මාතර	16	16	-	-
ඌව	බදුල්ල	15	13	-	-
	මොනරාගල	11	07	01	-
බස්නාහිර	කොළඹ	13	07	-	-
	ගම්පහ	13	09	01	-
	කළුතර	14	12	01	-
	එකතුව	**331**	**208**	**14**	**04**

සංස්කෘතික මධ්‍යස්ථාන මගින් ලබාදෙන මූලික සේවාවන්

පුහුණු පාඨමාලා පැවැත්වීම

දීපව්‍යාප්තව පිහිටා ඇති සංස්කෘතික මධ්‍යස්ථාන 208, අගයෙන් ඉහල කලා නිර්මාණ බිහිකිරීමට අවශ්‍ය අධ්‍යයනය හා පුහුණුව ලබාගතහැකි ආයතනික ව්‍යූහයක් බවට පත්කිරීම අරමුණුකර ගනිමින්, එම සංස්කෘතික මධ්‍යස්ථානවල, අංකුර කලාකරුවන් සඳහා නව දැනුමක් ලබා දෙන පුහුණු පාඨමාලා පැවැත්වීමට කටයුතු සලසා ඇත. එහිදී ගායන, වාදන, නර්තන යනාදී කලා කුසලතාවයන් සපුරාගැනීමට අපේක්ෂාකරන්නන් සඳහා සහභාගී විය හැකි පරිදි ප්‍රමිතියෙන් යුතු වැඩසටහන් පැවැත්වේ. තවද, විශේෂයෙන් ජනශ්‍රැති පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම හා පර්යේෂණ කටයුතු සඳහා මේවායෙහි අවස්ථාව සලසා දී ඇති අතර, පහත පාඨමාලා ද සංවිධානය කර ඇත.

- උඩරට, පහතරට, සබරගමු, භරත, කථක් සහ ජන නැටුම් පාඨමාලාව
- පෙරදිග සහ අපරදිග සංගීතය පාඨමාලාව
- නාට්‍ය හා රංග කලා පාඨමාලාව
- චිත්‍ර, මූර්ති සහ කැටයම් කලා පාඨමාලාව
- ජ්‍යොතිෂ්‍ය පාඨමාලාව
- කායික හා මානසික වර්ධන පාඨමාලාව
- අත්කම් නිපැයුම්, බතික් නිර්මාණ පාඨමාලාව
- සිංහල, දෙමළ, ඉංග්‍රීසි, පාලි හා සංස්කෘත භාෂාවන් පිළිබඳ පාඨමාලාව
- අංගම්පොර ශිල්ප පාඨමාලාව
- මුස්ලිම් රබන් / ලී කෙළි නර්තන පාඨමාලාව
- ජනසන්නිවේදන පාඨමාලාව
- දේශීය හෙළ වෙදකම පාඨමාලාව
- චීන සාම්ප්‍රදායික සටන් කලා පාඨමාලාව
- රූපලාවන්‍ය පාඨමාලා

පුස්තකාල සේවාවන් සැපයීම

සෑම ප්‍රාදේශීය මධ්‍යස්ථානයකම පිහිටුවා ඇති පුස්තකාල මගින් පාසල් ළමුන්ගේ සහ ජනතාවගේ කියවීමේ රුචිය ඉහළ නැංවීමේ සහ අධ්‍යාපනයට රුකුලක් වීමේ අදහසින් මෙම

සේවාව ක්‍රියාත්මක කර ඇත. ඇතැම් මධ්‍යස්ථාන මගින් දුෂ්කර ප්‍රදේශවල පිහිටුවා ඇති ග්‍රාමීය සමාජ සඳහා ජංගම පුස්තකාල සේවා ද ආරම්භ කර ඇත.

සංස්කෘතික සේවාවන් සැපයීම

ප්‍රාදේශීය ජනතාවගේ අවශ්‍යතාවය මත ආගමික/සංස්කෘතික උත්සව අවස්ථා සඳහා ප්‍රදේශයේ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් සංස්කෘතික සේවාවන් සැපයීම සිදු කරයි. මේ යටතේ ජය මංගල ගාථා කණ්ඩායම්, හේවිසි කණ්ඩායම්, මඟුල් බෙර කණ්ඩායම්, වෙස් නැටුම් කණ්ඩායම්, නර්තන කණ්ඩායම්, වීදි නාට්‍ය කණ්ඩායම් හා ගිහි පිරිත් කණ්ඩායම් ආදිය සපයනු ලබයි.

ආගමික/සංස්කෘතික/අධ්‍යාපනික හා සමාජ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රාදේශීය වශයෙන් වසර පුරා විවිධ ආගමික/සංස්කෘතික/අධ්‍යාපනික වැඩසටහන් තම සංවර්ධන අරමුදලින් /ප්‍රදේශවාසීන්ගේ මූල්‍ය දායකත්වයෙන්/රජයේ දායකත්වයෙන් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

සංස්කෘතික මධ්‍යස්ථාන ජාතික නර්තන සංචිතය පවත්වා ගැනීම

සංස්කෘතික මධ්‍යස්ථානවල සෞන්දර්යය පාඨමාලා හදාරන සිසුන් අතුරින් ප්‍රතිභාපූර්ණ සිසු සිසුවියන්ගෙන් සමන්විත නර්තන සංචිතයක් පවත්වාගෙන යනු ලබයි. රාජ්‍ය/ජාතික උත්සව සඳහාත් විදේශීය සංස්කෘතික සංචාර සඳහාත් මෙම නර්තන සංචිතය දායකත්වය සපයනු ලබයි.

2.1 සංස්කෘතික කටයුතු අංශය මඟින් 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති හා වැඩසටහන්වල ප්‍රගතිය

අනු අංකය	වැය විෂය විස්තරය	2022 ප්‍රතිපාදන රු.මී.	වියදම 2022.12.31 දිනට රු.මී.	මූල්‍ය ප්‍රගතිය
සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම				
01.	සංස්කෘතික මධ්‍යස්ථානවල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 101-02-05-09-1409	72.30	67.05	93%
02.	සංස්කෘතික මධ්‍යස්ථානවල බෙර/සංගීත උපකරණ/ගෘහ භාණ්ඩ අළුත්වැඩියාව හා	0.35	0.20	50%

	පුස්තකාල ප්‍රවර්ධනය සඳහා පොත් මිලදී ගැනීම 101-02-05-0-2002			
03.	සංස්කෘතික මධ්‍යස්ථාන වෙත ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ ලබාදීම 101-02-05-0-2102	3.00	3.00	98%
04.	සංස්කෘතික මධ්‍යස්ථාන වෙත යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ ලබාදීම 101-02-05-0-2103	5.00	4.00	79%
05.	සංස්කෘතික මධ්‍යස්ථාන සුළු අළුත්වැඩියාව, වැඩිදියුණු කිරීම් හා නඩත්තු කටයුතු 101-02-05-0-2001	20.00	14.00	70%
06.	සංස්කෘතික මධ්‍යස්ථාන ඉදි කිරීම් 101-02-05-23-2104	40.00	38.00	95%
විශේෂිත සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් (පුනරාවර්තන) ක්‍රියාත්මක කිරීම				
07.	සමාජ සංස්කෘතික ඒකාබද්ධතාවය සඳහා විශේෂ වැඩසටහන් 101-2-5-6-1508	3.44	3.40	100%
08.	රාජ්‍ය ආයතනවල සංස්කෘතික කටයුතු නංවාලීම (අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය) 101-2-5-8-1409	3.00	2.95	99%
09.	විදේශ සංස්කෘතික සබඳතා වැඩසටහන 101-2-5-27-1409	4.40	3.96	90%
විශේෂිත සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් (ප්‍රාග්ධන) ක්‍රියාත්මක කිරීම				
10.	ශිල්ප ගම්මාන වැඩසටහන 101-02-05-21-2506	1.50	0.72	48%

11.	සංස්කෘතික වටිනාකම් හා දේශීය දැනුම පිළිබඳ පර්යේෂණ ක්‍රියාකාරකම් 101-02-05-29-2507	0.80	0.60	75%
12.	ජාතික උරුමයන් සංරක්ෂණය හා ප්‍රවර්ධන වැඩසටහන් 101-02-05-31-2509	10.00	7.10	71%
13.	අමරදේව අසපුව 101-02-05-37-2104	110.00	75.09	68%

2.1.1 සංස්කෘතික මධ්‍යස්ථානවල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 101-02-05-09-1409

සංස්කෘතික මධ්‍යස්ථානවල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2022 වසරේ රු.මි.72.00ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරන ලද අතර ක්‍රියාත්මක සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා සෞන්දර්යය පාඨමාලා ක්‍රියාත්මක කිරීමට (මාස 10 කට) සම්පත්දායක දීමනා ගෙවීම මෙම වැය විෂය මගින් සිදු කර ඇත.

2.1.2 සංස්කෘතික මධ්‍යස්ථානවල සඳහා බෙර/සංගීත උපකරණ/ගෘහ භාණ්ඩ අළුත්වැඩියාව හා පුස්තකාල ප්‍රවර්ධනය සඳහා පොත් මිලදී ගැනීම 101-02-05-0-2002

2022 වර්ෂයකට රු.මි.0.35ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර දිවයින පුරා පිහිටි සංස්කෘතික මධ්‍යස්ථානයන්හි ඉල්ලීම් අනුව සීතාවක,තමන්කඩුව, මධ්‍යම නුවරගම් පළාත සහ වැලිමඩ සංස්කෘතික මධ්‍යස්ථානයන්හි සංගීත භාණ්ඩ අළුත්වැඩියා කිරීම සිදු කර ඇත.

2.1.3 සංස්කෘතික මධ්‍යස්ථාන වෙත ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ ලබාදීම 101-02-05-0-2102

සංස්කෘතික මධ්‍යස්ථාන ව්‍යුහය සක්‍රීයව පවත්වාගෙන යාම සඳහා සංස්කෘතික මධ්‍යස්ථාන වෙත ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ ලබාදීම වෙනුවෙන් 2022 වර්ෂයට රු.මි.3.00ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර එම ප්‍රතිපාදන වැය කරමින් තඹුත්තේගම, ගොඩකවෙළ, කොටවෙහෙර, ගඟඉහළකෝරළේ යන සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා ගෘහ හා කාර්යාලීය උපකරණ මිලදීගැනීම සිදු කරන ලදි.

2.1.4 සංස්කෘතික මධ්‍යස්ථාන වෙත යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ ලබාදීම
101-02-05-0-2103

සංස්කෘතික මධ්‍යස්ථාන වෙත යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ ලබාගැනීම වෙනුවෙන් 2022 වර්ෂයට වෙන් කරන ලද ප්‍රතිපාදන මුදල රු.මි. 5.00කි. එම මුදල වැය කරමින් මහකුඹුක්කඩවල, උඩුනුවර, නියාගම, ලුනුගම්වෙහෙර, මොනරාගල, ගනේවත්ත, පලාගල, කරවේඩ්ඩි, තමන්කඩුව, කොළඹ විශ්වවිද්‍යාලය, සොරණතොට, පානදුර යන සංස්කෘතික මධ්‍යස්ථාන 12 සඳහා පරිගණක යන්ත්‍ර මිලදීගැනීම හා මැදදුම්බර සංස්කෘතික මධ්‍යස්ථානය සඳහා මුද්‍රණ යන්ත්‍රයක් මිලදීගැනීම සිදු කරන ලදි. එසේම පන්නල, අම්බලන්තොට, ඇඹරළුව, දික්වැල්ල, කොටපොල යන සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා පරිගණක යන්ත්‍ර හා උපාංග මිලදිගැනීම සිදු කරන ලදි. වේයන්ගොඩ ජාතික පුහුණු මධ්‍යස්ථානයට මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර් යන්ත්‍රයක් හා බොයිලේරු 02ක්ද, යටවත්ත සංස්කෘතික මධ්‍යස්ථානයට වතුර මෝටරයක්ද , මාපලගම හා කොටපොල යන සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා තණකොළ කපන යන්ත්‍ර මිළයට ගැනීම සිදුකරන ලදි.

2.1.5 සංස්කෘතික මධ්‍යස්ථාන සුළු අළුත්වැඩියාව, වැඩිදියුණු කිරීම් හා නඩත්තු කටයුතු සිදු කිරීම
101-02-05-0-2001

මේ යටතේ දිවයින පුරා විහිදී පිහිටා ඇති සංස්කෘතික මධ්‍යස්ථානයන් වන බෝපෙ පෝද්දල, පන්නල, දැරණියගල, අඹන්හගකෝරළය, යටවත්ත, ගලේවෙල, නුවරඑළිය, මල්ලවපිටිය, වීරඹුගෙදර, වැලිකන්ද, මාතලේ, වෙන්කලඩි, වාකරේ, මන්මුනෙයි-උතුර, මහරගම හා නියාගම, යන සංස්කෘතික මධ්‍යස්ථාන 26ක් වෙනුවෙන් 2022 වසරට වෙන් කරන ලද රු.මි. 20.00ක මුදලින් රු.මි 14.00ක් භාවිතා කරමින් සුළු අළුත්වැඩියා, ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සිදු කරන ලදී.

2.1.6 සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් වැඩසටහන ක්‍රියාත්මක කිරීම
101-02-05-23-2104

2022 වසරට වෙන් කරන ලද රු.මි.40.00ක මුදලින් රු.මි.38.00ක් භාවිතා කරමින් සංස්ංකෘතික මධ්‍යස්ථාන ඉදිකිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව මහඔය, උහන, ඉරක්කාමම්, දමන, සයින්දමරුදු, පොල්ගහවෙල, ඇහැටුවැව, මතුගම, පාලින්දනුවර, ඇල්ල, ගඟඉහළකෝරලේ, ඉඹුල්පේ, සහ මාලිම්බඩ, යන සංස්කෘතික මධ්‍යස්ථානයන්හි ඉදිකිරීම් කටයුතු සිදුකර ඇත.

සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් - 2022 , භෞතික ප්‍රගතිය 2022.12.31 දිනට

සම්පූර්ණයෙන් වැඩ අවසන් කර විවෘත කිරීමට නියමිත සංස්කෘතික මධ්‍යස්ථාන ගණන	10
ප්‍රමාණවත් පරිදි වැඩ අවසන් කර විවෘත කළ හැකි මධ්‍යස්ථාන ගණන	07
ඉදිකිරීම් නවතා ඇති මධ්‍යස්ථාන ගණන	03
විවෘත කිරීමට ඇති මුළු සංස්කෘතික මධ්‍යස්ථාන ගණන	**20**

2.1.7 සමාජ සංස්කෘතික ඒකාබද්ධතාවය සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 101-2-5-6-1508

2022 වසරට වෙන් කරන ලද රු.මි. 3.44ක මුදලින් රු.මි 3.43ක් භාවිතා කරමින් සංස්කෘතික මධ්‍යස්ථාන හරහා ක්‍රියාත්මක ප්‍රවර්ධන වැඩසටහන් සඳහා මූල්‍ය අනුග්‍රහය ලබාදීම යටතේ ගනේවත්ත සංස්කෘතික මධ්‍යස්ථානයේ ‘‘කොහොඹාකංකාරිය ශාන්තිකර්මය’’ පැවැත්වීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීම, පඬුවස්නුවර සංස්කෘතික මධ්‍යස්ථානය මගින් පවත්වනු ලැබූ ‘‘අම්මාවරුනේ’’, ‘‘ජාත්‍යන්තර කාන්තා දින’’ වැඩසටහන සඳහා ප්‍රතිපාදන ලබාදීම, බලංගොඩ, අලව්ව හා මැදදුම්බර සංස්කෘතික මධ්‍යස්ථාන මගින් පවත්වනු ලැබූ ‘‘සෙනෙහස’’ වැඩසටහන සඳහා මෙන්ම නාගොල්ල - උකුවෙළ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් පැවැත්වූ කුසලතා සංවර්ධන වැඩසටහන හැදෑරූවන්ගේ දක්ෂතා එළිදැක්වීම හා කලාකරුවන්ට උපහාර පිරිනැමීම සඳහා වූ වැඩසටහන වෙනුවෙන් ද ප්‍රතිපාදන ලබාදීම සිදු කරන ලදි.

වාරියපොළ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් කාන්තා දිනය නිමිත්තකරගනිමින් සංවිධානය කරන ලද ‘‘පුන්සිත් ජන ගී’’ වැඩසටහනක් සංවිධානය කර ලද අතර ඒ සඳහා ප්‍රතිපාදන ලබා දීම ද මතුගම සංස්කෘතික මධ්‍යස්ථානය මගින් පවත්වනු ලැබූ ‘‘පුංචි අපට පියාඹන්න අත්තටුදෙන්න’’ වැඩසටහන සඳහා ද හඟුරන්කෙත සංස්කෘතික මධ්‍යස්ථානය මගින් සංවිධානය කරන ලද ‘‘ගර්භනී ශාන්තිකර්මය’’ සහිත සෞන්දර්යාත්මක වැඩසටහන සඳහා ද, ඉඹුල්පේ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් පැවැත්වූ වැඩසටහන සඳහා ද, ප්‍රතිපාදන ලබාදීම 2022 වර්ෂයට අදාළව මෙම වැය විෂය යටතේ සිදු කරන ලදි.

එසේම, මහනුවර ශ්‍රී දළදා මාලිගාව හා සතරමහා දේවාල එක්ව පවත්වනු ලබන ඇසල මහා පෙරහැරට සමගාමීව මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි දේවාල වල පැවැත්වූ පෙරහැර සඳහා ප්‍රතිපාදන ලබාදීමද, 2022 වර්ෂයේ අලුත් අවුරුදු නැකැත් සීට්ටුව මුද්‍රණය සඳහාද, අවශ්‍ය ප්‍රතිපාදන මෙම වැය විෂය යටතේ ලබාදීම සිදු කරන ලදි.

මෙයට අමතරව, ඓතිහාසික මිහින්තල පොසොන් හේවිසි පූජාව සඳහා ද, ඇසළ මහා පෙරහරට සමගාමීව පවත්වනු ලබන මාතලේ පෙරහැර සහ නුවරඑළිය දේවාල පෙරහැර සඳහාද, ඓතිහාසික දඹදෙණිය රාජමහාවිහාරය මගින් පවත්වනු ලබන ශ්‍රී දළදා පෙරහැර මංගල්‍යය සඳහාද, ප්‍රතිපාදන ලබාදීම මෙම වැය විෂය මගින් සිදු කර ඇත.

2.1.8 රාජ්‍ය ආයතනවල සංස්කෘතික කටයුතු නංවාලීමට (අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය) අදාල කටයුතු සිදු කිරීම
101-2-5-8-1409

රාජ්‍ය සේවකයන්ගේ කුසලතාවයන් ඇගයීම සඳහා අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලිය වාර්ෂිකව සංවිධානය කරනු ලැබේ. 2022 වසරේදී 2021 - අන්තර් රාජ්‍ය සේවා නිර්මාණ තරඟාවලියේ (සිංහල මාධ්‍යයෙන් නිර්මාණ - 1081 ක්ද,(කෙටි කතා, පද්‍ය රචනා, ළමා නිර්මාණ, කෙටි චිත්‍රපට, කෙටි නාට්‍ය, ඡායාරූප, චිත්‍ර) දෙමළ මාධ්‍යයෙන් නිර්මාණ - 311 ක්ද, (කෙටි කතා, පද්‍ය රචනා, ළමා නිර්මාණ, ගීත නිර්මාණ අතරින්) ජයග්‍රාහකයින් සඳහා සම්මාන ප්‍රදානය සිදු කරන ලදි. එසේම 2021 වර්ෂයේ අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලියේ අතැති බිල්පත් ගෙවීම් සිදුකිරීම ද මෙම වැය විෂය යටතේ සිදු කරන ලදි.

2.1.9 විදේශ සංස්කෘතික සබඳතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
101-2-5-27-1409

සංස්කෘතික කටයුතු අංශය මගින් දෙස් විදෙස් සංස්කෘතික සම්බන්ධතා වර්ධනය කර ගනිමින් දේශීය සංස්කෘතිය සංචාරක කර්මාන්තය හා එක්ව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සංවිධානය කරන ලද “Cultural Saubhagya” ජාත්‍යන්තර සංස්කෘතික ප්‍රසංගය 2022 වසරේ පෙබරවාරි මස අතිගරු ජනාධිපතිතුමන්ගේ හා විදේශීය තනාපත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රංග ශාලාවේදී පවත්වන ලදී. මේ සඳහා ජාතික නර්තන සංවිතයේ ශිල්පීන්, සංස්කෘතික මධ්‍යස්ථානවල ඉගෙනුම ලබන සිසු සිසුවියන් හා රාජ්‍ය නර්තන කණ්ඩායමේ ශිල්පීන් සහභාගී කරගන්නා ලදී.
තවද, Republic of koria, Asia Dance Committee Meeting 2022 වැඩසටහන සඳහා උපදේශකවරයකු ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වන ලදි.

2.1.10 ශිල්ප ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම
101-02-05-21-2506
දේශීය ශිල්ප කලාවන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් හා ශිල්පීන් ඇගයීමේ අරමුණින් දුම්බර රටා කර්මාන්තයේ නියුතු ශිල්පීන්ගට මූල්‍ය ත්‍යාග ලබාදීම, සමරු තිළිණ ලබාදීම, සිදු කරන ලද අතර මෙම වැය විෂය සඳහා රු.මි. 1.50ක ප්‍රතිපාදන 2022 වසර සඳහා වෙන් වී ඇත.

2.1.11 සංස්කෘතික වටිනාකම් හා දේශීය දැනුම පිළිබඳ පර්යේෂණ ක්‍රියාකාරකම් සිදු කිරීම

101-02-05-29-2507

සංස්කෘතික නුවණ පුහුණු වැඩසටහන් පැවැත්වීම, ජාතික සංස්කෘතික ප්‍රතිපත්තිය සකස්කිරීම් පුවත්පත් දැන්වීම් භාෂාත්‍රයෙන් පළ කිරීම ආදී වැඩසටහන් හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමග එක්ව සාම්ප්‍රදායික කලාකරුවන් පිළිබඳ පර්යේෂණයක් සිදු කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම මෙම වැය විෂය යටතේ සිදු කරන ලද අතර මේ සඳහා වෙන් වී ඇති ප්‍රතිපාදන රු.මි. 0.80කි.

2.1.12 ජාතික උරුමයන් සංරක්ෂණය හා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

101-02-05-31-2509

මෙම වැය ශීර්ෂය යටතේ ප්‍රධානවම, ජාතික නර්තන සංචිතය ස්ථාපිත කිරීම හා ‘‘ප්‍රතිභා’’ අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන තරඟාවලිය පැවැත්වීම සිදු කර ඇති අතර අස්පර්ෂණීය උරුම සංරක්ෂණ ඒකකය පිහිටුවීම හා එමගින් වැඩසටහන් සම්පාදනය කිරීම යන වැඩසටහන් මෙම වැය විෂය යටතේ සිදු කරන ලදි.

- **ජාතික නර්තන සංචිතය ස්ථාපිත කිරීම.**

සංස්කෘතික කටයුතු අංශයට අනුබද්ධව, පළාත් මට්ටමින් කුසලතාවයන් දක්වන අංකුර කලාකරුවන් තෝරාගනිමින් ජාතික නර්තන සංචිතය ස්ථාපිත කර ඇත. මෙමගින් දේශීය මෙන්ම විදේශීය ප්‍රසංග අවස්තා ඔස්සේ එම අංකුර කලාරුවන්ට ජාතික හා ජාත්‍යන්තර ප්‍රාසාංගික අත්දැකීම් ලබාදීම හා ඔවුන් දිරිගැන්වීම අරමුණු කර ඇති අතර සංචාරක කර්මාන්තය සමග ඒකාබද්ධව ප්‍රාසාංගික ප්‍රදර්ශන ඉදිරිපත් කිරීමට ද ඔවුනට අවකාශ සැලසේ.

- **‘‘ප්‍රතිභා’’ අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන තරඟාවලිය පැවැත්වීම**

පාරම්පරික නර්තන කලාවන් නූතන පරපුරට හඳුන්වා දීමේ අරමුණින්, උඩරට, පහතරට සහ සබරගමු නර්තන සම්ප්‍රදායන් නූතන ශිෂ්‍ය ප්‍රජාව වෙත නැවුම් මුහුණුවරකින් හඳුන්වාදීම අරමුණු කරගනිමින් සංවිධානය කරනු ලබන වැඩසටහනක් ලෙස සංස්කෘතික මධ්‍යස්ථාන අතර පවත්වන ‘‘ප්‍රතිභා’’ සංස්කෘතික මධ්‍යස්ථාන තරඟාවලිය හඳුන්වා දිය හැකිය. පාරම්පරික නර්තන කලාව ප්‍රවර්ධන කිරීම ද, ප්‍රචාරණය කිරීමද, වාර්ෂිකව සංවිධානය කරනු ලබන මෙම වැඩසටහනේ ප්‍රධාන අභිප්‍රායයි.

- **"සංස්කෘතික නුවණ" පුහුණු වැඩමුළුව පැවැත්වීම**

ප්‍රවර්ධන අංශය මඟින් විමර්ශන නිලධාරීන් 18 දෙනෙකු සඳහා පුහුණු කිරීමේ වැඩමුළුව පැවැත්වීම.

- **"ජාතික සංස්කෘතික ප්‍රතිපත්තිය" සැකසීම**

අංක 1525/12 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ජාතික සංස්කෘතික ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත්කර ඇතත්, එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමේදී හා එය වර්තමානයට ගලපාගැනීමේදී විවිධ ගැටළු පැනනැගී ඇත. නූතන සංකීර්ණ සමාජයට ගැලපෙන පරිදි නිර්වචනය සහ විධිමත් ක්‍රියාත්මක යාන්ත්‍රණයක් අන්තර්ගතවී නොතිබීම මත මෙම ප්‍රඥප්තිය සංශෝධනය කර වර්තමානයට යෝග්‍ය වන පරිදි සකස්කිරීම සඳහා මෙරට සියලු සංස්කෘතීන් පිළිබඳව පුළුල් දැනුමක් සහිත විද්වතුන්ගෙන් අදහස් ලබාගැනීම සඳහා භාෂා ත්‍රිත්වයෙන් පුවත්පත් දැන්වීම් පල කිරීම හා විද්වත් කමිටුවක් තෝරාගැනීම සිදුකරන ලදී.

2.1.13 අමරදේව අසපුව

101-02-05-37-2104

මෙම වැය විෂය යටතේ අමරදේව අසපුව ඉදිකිරීමට අදාළ ගෙවීම් සිදුකිරීම මෙමගින් සිදු කරනු ලබයි.මෙහි අරමුණ වනුයේ පර්යේෂණ සිදුකිරීම, කලාකරුවන්ට පුහුණුවීම් කටයුතු සිදු කිරීම හා අධ්‍යනාගාරයක් වශයෙන් පවත්වාගෙන යාම වේ.

2.2 අභියෝග හා ඉදිරි ඉලක්ක

<u>සංස්කෘතික උරුම ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම</u>

ව්‍යාපෘතිය/ වැඩසටහන	ආරම්භකළ/ යෝජිත දිනය	අපේක්ෂිත ප්‍රතිලාභ		ප්‍රතිලාභ ලැබෙන කාල වකවානුව
		ප්‍රමාණාත්මක	ගුණාත්මක	
1. සමාජ සංස්කෘතික ඒකාබද්ධතාවය සඳහා විශේෂ	2023 වර්ෂය සඳහා	• 75 වන ජාතික නිදහස් දින උත්සවයට	• යාපනය මූලික කර ගත් හින්දු සංස්කෘතිය	දිගුකාලීන

ව්‍යාපෘතිය/ වැඩසටහන	ආරම්භකළ/ යෝජිත දිනය	අපේක්ෂිත ප්‍රතිලාභ		ප්‍රතිලාභ ලැබෙන කාල වකවානුව
		ප්‍රමාණාත්මක	ගුණාත්මක	
වැඩසටහන් **101-2-05-009-1409-99**		සමගාමීව, ඉන්දීය රජයේ ආධාර මත ඉදිකළ යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය විවෘත කිරීමේ උත්සවය සඳහා සංස්කෘතික ප්‍රසංගයක් ඉදිරිපත් කිරීම. • සංස්කෘතික මධ්‍යස්ථාන ජාලය පුළුල් කිරීම • සිංහල, හින්දු අලුත් අවුරුදු උත්සවය. • අලුත් අවුරුදු නැකැත් සිට්ටුව මුද්‍රණ කටයුතු. • ජාතික වෙසක් උත්සවය. • ජාතික පොසොන්	අභිවර්ධනයට ඉඩ සැලසීම • දේශීය සංස්කෘතිකාංග රැකගැනීම, සුරක්ෂිත කිරීම හා මතු පරපුරට දායාද කිරීම. • ඉන්දු ලංකා මිත්‍රත්වය තහවුරු වීම • සිංහල - ද්‍රවිඩ ජාතීන් අතර සංස්කෘතික සම්බන්ධතාවයන් වර්ධනය වීම • ජාතීන් අතර සංහිදියාව වර්ධනය වීම • ආගමික	

ව්‍යාපෘතිය/ වැඩසටහන	ආරම්භකළ/ යෝජිත දිනය	අපේක්ෂිත ප්‍රතිලාභ		ප්‍රතිලාභ ලැබෙන කාල වකවානුව
		ප්‍රමාණාත්මක	ගුණාත්මක	
		උත්සවය. • පෙරහර හා වෙනත් විශේෂ උත්සව සඳහා සංස්කෘතිකාංග හා මූල්‍ය අනුගහය ලබාදීම. • සංස්කෘතික මධ්‍යස්ථාන හරහා ක්‍රියාත්මක ප්‍රවර්ධන වැඩසටහන්.	පුනරුදයක් ඇති වීම	
2. රාජ්‍ය ආයතනවල සංස්කෘතික කටයුතු නංවාලීම (අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලිය) **101-2-05-009-1409-099**	2023 වර්ෂය සඳහා	• රාජ්‍ය සේවයේ නියුතු සහ විශ්‍රාමික රාජ්‍ය සේවකයින්ගේ නිර්මාණ එළිදැක්වීම. (කෙටි නාට්‍ය, ඡායාරූප, කෙටි චිත්‍රපට)	• තෘප්තිමත් වූ රාජ්‍ය සේවක් බිහිවීම. • රාජ්‍ය සේවකයින්ගේ කලාත්මක නිර්මාණ හැකියාවන් වර්ධනය වීම හා ඒවා එළිදැක්වීමට අවස්ථාවන්	දිගුකාලීන

ව්‍යාපෘතිය/ වැඩසටහන	ආරම්භකළ/ යෝජිත දිනය	අපේක්ෂිත ප්‍රතිලාභ		ප්‍රතිලාභ ලැබෙන කාල වකවානුව
		ප්‍රමාණාත්මක	ගුණාත්මක	
			ලැබීම. • රාජකාරියේදී ඇතිවන ඒකාකාරීත්වය අවම කිරීම. • අභිප්‍රේරණය වූ රාජ්‍ය සේවකයෙක් නිර්මාණය වීම. • රාජ්‍ය සේවයේ සාමූහිකත්වය හා සංහිදියාව වර්ධනය කිරීම. • තෘප්තිමත් වූ විශ්‍රාම දිවියක් ඇති කිරීම.	
3. ජාතික උරුමයන් සංරක්ෂණය හා ප්‍රවර්ධන වැඩසටහන් **101-02-05-031-2509**	2023 සඳහා ප්‍රතිපාදන	• 2023 අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රතිභා තරඟාවලිය පැවැත්වීම. • (සංගීත, නර්තන,	• දැයේ දරුවන්ගේ සැඟවුන කලා කුසලතාවයන් ඔප්නැංවීම හා සංවර්ධනය. • කලාව තුළින්	දිගුකාලීන

ව්‍යාපෘතිය/ වැඩසටහන	ආරම්භකළ/ යෝජිත දිනය	අපේක්ෂිත ප්‍රතිලාභ		ප්‍රතිලාභ ලැබෙන කාල වකවානුව
		ප්‍රමාණාත්මක	ගුණාත්මක	
		චිත සහ නාට්‍ය නිර්මාණ කැඳවීම)	ජයග්‍රහණයන් ලබාගැනීමට වේදිකාව විවෘත වීම. • කලාත්මක හැකියාවන්ගෙන් යුතු අති දක්ෂ දරුවන්ගේ අනාගතය සුරක්ෂිත වීම. • දේශීය කලා සම්ප්‍රදායන් සුරක්ෂිත කිරීම සහ මතු පරපුරට පැවරීම.	
		• ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන නර්තන සංචිතය පිහිටුවීම.	• සාම්ප්‍රදායික නර්තනාංග සංරක්ෂණය. • නව නිර්මණ බිහිවීම තුළින් යහපත් ධනාත්මක ආකල්පයන්ගෙන්	දිගුකාලීන

ව්‍යාපෘතිය/ වැඩසටහන	ආරම්භකළ/ යෝජිත දිනය	අපේක්ෂිත ප්‍රතිලාභ		ප්‍රතිලාභ ලැබෙන කාල වකවානුව
		ප්‍රමාණාත්මක	ගුණාත්මක	
			යුත් නව පරපුරක් බිහිකිරීම. • ප්‍රදේශයන්ට ආවේණික වූ නර්තන අංග ජාතික හා අන්තර්ජාතික තලයට ගෙනඒම. • විශ්වවිද්‍යාල ප්‍රවේශයේදී කලා හැකියාවෙන් යුත් දරුදැරියන්හට සධාරණ අවස්ථාවන්හිමි වීම • මනා අන්තර් සම්බන්ධතාවය න්ගෙන් යුත් සාමූහිකත්වයෙන් ඉදිරියට යාහැකි සංහිඳියාත්මක පරපුරක් සමාජයට දායාදවීම.	

ව්‍යාපෘතිය/ වැඩසටහන	ආරම්භකළ/ යෝජිත දිනය	අපේක්ෂිත ප්‍රතිලාභ		ප්‍රතිලාභ ලැබෙන කාල වකවානුව
		ප්‍රමාණාත්මක	ගුණාත්මක	
		• දෘශ්‍යාබාධිත ප්‍රජාව වෙනුවෙන් ශ්‍රවන ග්‍රන්ථ නිෂ්පාදනය.	• සමාජ සාධාරණත්වය ඇතිකිරීම. • දෘශ්‍යාබාධිත ප්‍රජාව නිර්මාණශීලී කලා රසඥතාවයකින් යුත් පිරිසක් බවට පත් කිරීම ඇති කිරීම.	දිගුකාලීන
		• අස්පර්ශනීය උරුමයන් සුරක්ෂිත කිරීම හා අනාගත පරපුරට පැවරීම. • අස්පර්ශනීය උරුමයන් සංරක්ෂණ කමිටුවේ වාර්ෂික ක්‍රියාකාරකම්. • අස්පර්ශනීය උරුමයන් පිළිබඳ ජාතික ලැයිස්තුව. • අස්පර්ශනීය උරුමයන් සංරක්ෂණය	• දේශීය අස්පර්ශනීය උරුමයන් හඳුනාගැනීම, ආරක්ෂා කිරීම සහ ඒවායේ අමිල වටිනාකම දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රචාරය වීම. • අස්පර්ශනීය උරුමයන් ලෝක උරුමයක් ලෙස සංරක්ෂණය වීම.	දිගුකාලීන

ව්‍යාපෘතිය/ වැඩසටහන	ආරම්භකළ/ යෝජිත දිනය	අපේක්ෂිත ප්‍රතිලාභ		ප්‍රතිලාභ ලැබෙන කාල වකවානුව
		ප්‍රමාණාත්මක	ගුණාත්මක	
		කිරීමේ UNESCO සම්මුතියේ 20වන සංවත්සරය සැමරීම. • Safe Guard Plan සැකසීම.		

ඉහත පිටු අංක 90 සිට 114 දක්වා පිටුවලින් දක්වා ඇති තොරතුරු පරීක්ෂා කර බලා ඇති බවත්, එම සංඛ්‍යා සමග එකඟවන බවත් මෙයින් සහතික කරමි.

.....

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

නම - සෝමරත්න විදානපතිරණ

තනතුර - ලේකම්, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

දිනය - 2023.02.24

සෝමරත්න විදානපතිරණ
ලේකම්
බුද්ධශාසන ආගමික හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
8 වන මහල,
පෙත්තිරිපාය, බත්තරමුල්ල

පරිච්ඡේදය 03 - වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ-එෆ්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022		සටහන	තක්සේරු 2022	2021	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		867,877,000	720,024,000	ඒසිඒ-3
-	ණැන්පතු		10,747,032	5,581,725	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		33,441,933	34,564,048	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**912,065,965**	**760,169,773**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**912,065,965**	**760,169,773**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**912,065,965**	**760,169,773**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**				
632,600,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	596,426,428	531,406,736	
188,140,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	176,228,829	133,485,062	ඒසිඒ-2(ii)
34,160,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	27,546,339	131,718,037	
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	1,200	
854,900,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**800,201,596**	**796,611,035**	
	මූලධන වියදම්				
24,400,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	18,210,249	8,896,434	
125,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	121,657,696	96,358,800	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	10,984,000	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	**13**	-	-	
700,000	හැකියා වර්ධනය	**14**	777,320	614,658	
12,300,000	වෙනත් මූලධන වියදම්	**15**	8,428,341	5,935,767	
162,900,000	**මුළු මූලධන වියදම් (උ)**		**149,073,606**	**122,789,659**	
	ණැන්පතු ගෙවීම්		8,749,210	17,698,529	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		29,715,472	34,237,927	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**38,464,682**	**51,936,456**	
1,017,800,000	**මුළු වියදම් එ = (ඊ+උ+ඌ)**		**987,739,883**	**971,337,150**	
(1,017,800,000)	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(75,673,919)**	**(211,167,378)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**(75,673,919)**	**211,167,378**	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ-3
			(75,673,919)	**211,167,378**	

3.2 මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2022 රු.	2021 රු.
		තත්‍ය	
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	3,742,637,435	3,415,278,892
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	112,672,583	116,399,044
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**3,855,310,018**	**3,531,677,936**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		76,216,524	81,940,807
දේපළ පිරියත හා උපකරණ සංචිතය		3,742,637,435	3,415,278,892
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	36,456,059	34,458,237
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**3,855,310,018**	**3,531,677,936**

පිටු අංක 115 සිට 117 දැක්වෙන ඉහත ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 118 සිට 121 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන් හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමග එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
නනතුර :
දිනය :

.....
ගණන්දීමේ නිලධාරි
නම :
නනතුර :
දිනය :

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය :

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සි

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

තත්‍ය

	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	41,834,112	39,821,403
අග්‍රිම ලැබීම්	867,877,000	720,024,000
අත්තිකාරම් අයකර ගැනීම්	32,081,881	34,218,570
තැන්පතු ලැබීම්	10,747,032	5,581,725
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**952,540,025**	**799,645,698**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	784,786,518	671,478,753
සහනාධාර සහ මාරුකිරීම්	(47,669,794)	30,045,237
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	107,246,819	32,659,711
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	29,922,697	34,320,327
තැන්පතු ගෙවීම්	8,749,210	17,698,529
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**883,035,449**	**786,202,558**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**69,504,576**	**13,443,140**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	69,504,576	13,443,140
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**69,504,576**	**13,443,140**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(69,504,576)**	**(13,443,140)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(0)**	**0**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	(0)	**0**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

සටහන් 05 රු.

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය				වියදම	මුළු වියදම
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරුකිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	(5)	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7)	මු.රෙ. 66/69 මාරුකිරීම් (8)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
පුද්ගල පඩිනඩි	65,300,000	-	(2,100,000)	63,200,000	51,286,375	567,300,000	-	-	567,300,000	545,140,053	**596,426,428**

සටහන් 06 රු.

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය				වියදම	මුළු වියදම
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරුකිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	(5)	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7)	මු.රෙ. 66/69 මාරුකිරීම් (8)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
ගමන් වියදම්	1,700,000	-	-	1,700,000	885,949	6,300,000	-	(300,000)	6,000,000	3,541,892	4,427,841
සැපයීම්	11,900,000	-	(1,124,000)	10,776,000	8,032,341	12,500,000	-	(2,736,000)	9,764,000	9,089,893	17,122,234
නඩත්තු වියදම්	6,200,000	-	1,400,000	7,600,000	5,602,333	3,200,000	-	(150,000)	3,050,000	2,030,991	7,633,324
සේවා	60,440,000	-	6,159,000	66,599,000	65,919,216	85,900,000	-	5,096,000	90,996,000	81,126,215	147,045,431
											176,228,829

සටහන් 07 රු.

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය				වියදම	මුළු වියදම
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරුකිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	(5)	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7)	මු.රෙ. 66/69 මාරුකිරීම් (8)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
මාරුකිරීම්	460,000	-	-	460,000	435,385	33,700,000	-	(6,560,000)	27,140,000	27,110,954	**27,546,339**

සටහන් 09

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය				වියදම	මුළු වියදම
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරුකිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	(5)	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7)	මු.රෙ. 66/69 මාරුකිරීම් (8)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
පාඩු හා කපා හැරීම්	-	-	-	-	-	-	-	-	-	-	**-**

සටහන් 10 රු.

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය				වියදම	මුළු වියදම
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරුකිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	(5)	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7)	මු.රෙ. 66/69 මාරුකිරීම් (8)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
මූලධන වත්තකම් පුන රුත්තරාපනය හා වැඩිදියුණු කිරීම	2,700,000	-	-	2,700,000	2,588,285	21,700,000	-	150,000	21,850,000	15,621,964	**18,210,249**

සටහන් 11 රු.

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					මුළු වියදම
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය				වියදම	
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරුකිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	(5)	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7)	මු.රෙ. 66/69 මාරුකිරීම් (8)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
මූලධන වත්කම් අත්පත් කර ගැනීම	2,500,000	-	-	2,500,000	1,837,013	123,000,000	-	35,000,000	158,000,000	119,820,683	121,657,696

සටහන් 12 රු.

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					මුළු වියදම
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය				වියදම	
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරුකිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	(5)	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7)	මු.රෙ. 66/69 මාරුකිරීම් (8)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
ප්‍රාග්ධන මාරුකිරීම්	-	-	-	-	-	-	-	-	-	-	-

සටහන් 14 රු.

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					මුළු වියදම
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය				වියදම	
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරුකිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	(5)	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7)	මු.රෙ. 66/69 මාරුකිරීම් (8)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
සටහන් **13 -** මූල්‍ය වත්කම් පත් කර ගැනීම	-	-	-	-	-	-	-	-	-	-	-
සටහන් **14-** හැකියා වර්ධනය	400,000	-	165,000	565,000	480,575	300,000	-	-	300,000	296,745	777,320

සටහන් 15 රු.

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					මුළු වියදම
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය				වියදම	
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරුකිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	(5)	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7)	මු.රෙ. 66/69 මාරුකිරීම් (8)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
වෙනත් මූලධන වියදම්	-	-	-	-	-	12,300,000	-	-	12,300,000	8,428,341	8,428,341

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - අදාළ නැත

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. '000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	854,900	854,585	800,202	94
ප්‍රාග්ධන	162,900	198,215	149,074	75

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. '000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය (409-01-05-0-1409- (67))	74 වන නිදහස් දින සමරු උළෙල සංස්කෘතික සංදර්ශනය ඉදිරිපත් කිරීම සඳහා	19,007	19,007	18,959	100
2	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව (253-01-02-04-1502-11)	විශ්‍රාම වැටුප් පාරිතෝෂික නිරවුල් කිරීම	393	393	393	100
3	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව (206-02-03-06-1409)	ජාතික සාහිත්‍ය කලා මහෝත්සවයේ පුවත්පත් දැන්වීම සඳහා ගෙවීම් කිරීමට	101	101	101	100
4	රාජ්‍ය සේවා , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (130-01-02-0-1001-11)	සංවර්ධන නිලධාරී වැටුප් හා උපාධිධාරී අභ්‍යාසලාභී දීමනා ගෙවීම් කිරීම	1,417	1,417	1,417	100
5	රාජ්‍ය සේවා , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (130-01-02-0-1003-11)	සංවර්ධන නිලධාරී හා උපාධිධාරී අභ්‍යාසලාභී දීමනා ගෙවීම් කිරීම	909	909	909	100
6	රාජ්‍ය සේවා , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (130-01-16-0-1409-11)	රු.5,000.00 ක අතිරේක දීමනාවක් ලබා දීම සඳහා	18,901	18,901	18,901	100
			40,728	40,728	40,680	100

සටහන

1. මෙම අමාත්‍යාංශයේ සංස්කෘතික අංශයට අදාළ විෂය පථය වෙනස් වීම් මත අප අංශය විසින් දරන ලද පහත සඳහන් ආයතන වලට අදාළ වියදම් 2022 ඔක්තෝම්බර් මස දී ජනමාධ්‍ය අමාත්‍යාංශයට (ශී.අංක 105) මාරු කරන ලදී.

* ජාතික චිත්‍රපට සංස්ථාව (105-02-04-09-1503-11) - රු.73,120,000.00 හා (105-02-04-09-2201-11) - රු.9,837,000.00
* ප්‍රසිද්ධ රඟමු පාලක මණ්ඩලය (105-02-04-10-1508-11)රු. 2,161,986.85 හා (105-02-04-10-2509-11)රු. 387,500.00

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර විස්තරය	**31.12.2022** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු)	**31.12.2022** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු)	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	3,005,370,224.12	3,005,370,224.12	-	-
9152	යන්ත්‍රෝපකරණ	404,598,831.28	404,598,831.28	-	-
9153	ඉඩම්	168,075,768.00	168,075,768.00	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	164,592,611.82	164,592,611.82	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } සීඒඒ/සී/එම්ඩබ්/02/2022/06 ඔබේ අංකය உமது இல. Your No. }
දිනය திகதி Date } 2023 ජූනි ෙ෧෭ දින

ලේකම්

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

ශීර්ෂය 101 - බුද්ධශාසන, හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 101 - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ බුද්ධශාසන අංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1.1 (අ)	අමාත්‍යාංශය සතු අංක 18 – 4263 දරන වාහනයෙහි වටිනාකම (තක්සේරු කර නැත) මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් නොකිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.	1.6.1 (අ) (ii)

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) බුද්ධශාසන අංශය

(i) 2022 දෙසැම්බර් 31 දිනට බුද්ධශාසන අංශයේ මූල්‍ය නොවන වත්කම් තුළ ඇතුළත් වාහනවල වටිනාකම රු.243,386,950 ක් වූ අතර අමාත්‍යාංශය විසින් පිළිවෙලින් මහාභාරකාර දෙපාර්තමේන්තුවට හා බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවට භාර දී තිබූ, වටිනාකම රු.38,000,000 ක් වූ අංක PA- 7082 දරන ජීප් රථය සහ වටිනාකම රු.1,500,000 ක් වූ අංක 32-5816 දරන ජීප් රථය මෙතෙක් නීත්‍යානුකූලව පවරා දී නැතත් ගිණුම්වලින් ඉවත් කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ii) අංක 18-4263 දරන මෝටර් රථයෙහි වටිනාකම (තක්සේරු කර නැත) මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් නොකිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ආ) සංස්කෘතික අංශය

(i) සංස්කෘතික අංශය සතු අංක CAM 5384, 254 -0003 හා YC 1104 දරන වාහන 03 (තක්සේරු කර නැත) මූල්‍ය ප්‍රකාශන තුළ වාහනවල වටිනාකමට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ii) අංක KE-8095 දරන ටාටා සුමෝ ජීප් රථය හා අංක 253-1191 දරන ටොයොටා ඩබල් කැබ් රථය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත පවරා දී තිබුණද, පිළිවෙලින් රු.2,500,000 ක් හා රු.1,500,000 ක් වූ එම වාහනවල තක්සේරු වටිනාකම 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර නොතිබුණි.

(ඇ) 2022 සැප්තැම්බර් 21 දිනැති අංක 06/2022 දරන අයවැය චක්‍රලේඛයේ 20 සහ 21 වගන්ති ප්‍රකාරව අහෝසි වූ වැය ශීර්ෂ යටතේ මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

	ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණය
(i)	හානි පිළිබඳ ලේඛනය	මුදල් රෙගුලාසි 110	බුද්ධශාසන අංශය විසින් පවත්වා නොතිබුණි.
(ii)	ඇප ලේඛනය	මුදල් රෙගුලාසි 891 (1)	බුද්ධශාසන අංශය විසින් පවත්වා නොතිබුණු අතර සංස්කෘතික අංශය විසින් යාවත්කාලීන කර නොතිබුණි.
(iii)	වැය ලෙජර	මුදල් රෙගුලාසි 447(3)	සංස්කෘතික අංශය විසින් යාවත්කාලීන කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) පුනරාවර්තන වියදම්

අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශයේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනවලින් මු.රෙ 66 යටතේ පුනරාවර්තන වැය විෂයයන් 04 කට රු.19,166,000 ක ප්‍රතිපාදන මාරුකර තිබුණු අතර ඉන් සියයට 40 සිට සියයට 100 දක්වා පරාසයකට අයත් රු. 11,266,723 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

(ආ) මූලධන වියදම්

අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශයේ ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් මු.රෙ 66 යටතේ මූලධන වැය විෂයයන් 04 කට රු.70,315,000 ක ප්‍රතිපාදන මාරුකර තිබුණු අතර එම සමස්ත ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

(ඇ) වැය විෂයයන් 6 ක් සඳහා වෙන් කරන ලද රු.3,270,000 ක ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථාපනයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.1 (අ) ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ	
(i) 4.2.5, 4.5, 4.6 හා 6.3 උප වගන්ති	බුද්ධශාසන අංශයේ විශ්‍රාම ගිය නිලධාරියෙකුගේ රු.167,055 ක ණය ශේෂය වර්ෂ 03 කට වැඩි කාලයක සිටද සංස්කෘතික අංශයේ විශ්‍රාම ගිය නිලධාරියෙකුගේ රු,128,732 ක ණය ශේෂය වර්ෂ 17 කට වැඩි කාලයක සිටද අයවිය යුතුව පැවති අතර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ii) 4.4 උප වගන්තිය	සංස්කෘතික අංශයේ මිය ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අය විය යුතු වර්ෂ 1 සිට 2 දක්වා කාල පරිච්ඡේදයක සිට පැවත එන රු.234,305 ක ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
(iii) 4.5, 4.6 සහ 6.3 උප වගන්ති	සංස්කෘතික අංශයේ වැඩ තහනමට ලක් වූ නිලධාරීන් 08 දෙනෙකුගේ එකතුව රු.483,021 ක් වූ ණය ශේෂය වර්ෂ 03 සිට 05 දක්වා කාල පරිච්ඡේදයක සිට අයවිය යුතුව පැවතියද, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ	
(i) මුදල් රෙගුලාසි 135	(i) සංස්කෘතික අංශයේ පවිත්‍රතා සේවයට අදාලව, තහවුරු කිරීමේ ලේඛන පරීක්ෂාවකින් තොරව 2021 දෙසැම්බර් 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා මසකට රු.147,000 බැගින් ගෙවීම් කර තිබුණි. (ii) සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ නිලධාරිනියකට රු.68,917 ක ණය මුදලක් සාවද්‍ය ලෙස ගෙවා තිබූ අතර එම ණය මුදල ආපසු අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(ii)	මුදල් රෙගුලාසි 113 (6) හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 වගන්තිය	සේවය අතහැර ගොස් වර්ෂ 05 ඉක්මවා තිබූ සංස්කෘතික අංශයේ නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.220,488 ක් වූ ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඇ)	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14	බුද්ධශාසන අංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාවෙහි අනුකූල වන බවට දක්වා තිබූ අවශ්‍යතා 09ක් අනුකූල නොවන බව නිරීක්ෂණය විය. තවද, සංස්කෘතික අංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාවේ අනුකූල බව දක්වා තිබූ අවශ්‍යතා 03 ක් අනුකූල නොවන බව නිරීක්ෂණය විය.
(ඇ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.3 වගන්තිය	ඉන්ධන භාවිතයේ අහිතකර වෙනස්කම් ඇත්නම් එය හඳුනා ගැනීම සඳහා චක්‍රලේඛයෙහි ඇමුණුම 1 අනුව ප්‍රවාහන සේවා සටහන මාසිකව සම්පූර්ණ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.4 තැන්පතු

බුද්ධශාසන අංශයේ 2022 දෙසැම්බර් 31 දිනට තැන්පත් ශේෂය රු.23,240,820 ක් වූ අතර ඉන් වර්ෂ 02 ඉක්ම වූ එකතුව රු.21,106,115 ක කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් තැන්පතු 05 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් පවත්වාගෙන යාමේදී චෙක්පත් අත්සන් කරන නිලධාරීන් මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් බුද්ධශාසන අංශයේ අදාල නිලධාරීන්ගෙන් ඇප අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 වගන්තිය ප්‍රකාරව වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපති වෙත පිටපතක් සහිතව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2021 වර්ෂයේ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණේ 2022 සැප්තැම්බර් 30 දින වේ.

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අදාළ ප්‍රගතිය හා කාර්යසාධනය

(i) සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන, සංස්කෘතික කටයුතු අංශය මගින් ක්‍රියාත්මක කරන ප්‍රධාන වැඩසටහන වන බැවින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම සංස්කෘතික මධ්‍යස්ථානයක් පිහිටුවීමට නියමිත බව වාර්ෂික කාර්යසාධන වාර්තාවේ දක්වා තිබුණි. එසේ වුවද, මුලතිව්, මන්නාරම හා කිලිනොච්චි යන දිස්ත්‍රික්ක තුන තුළ එකදු සංස්කෘතික මධ්‍යස්ථානයක් හෝ පිහිටුවා නොතිබුණු අතර මෙම වර්ෂයේ සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීමේදීද මේ සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි.

(ii) ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇති බොහෝ ක්‍රියාකාරකම් විස්තරාත්මක ලෙස සටහන් කර නොතිබුණි. මේ හේතුවෙන් ඒ යටතේ සිදුකළ යුතු වැඩසටහන්/ව්‍යාපෘතින් මොනවද යන්න පැහැදිලි නොවුන අතර එම ක්‍රියාකාරකම්වලට අදාල අරමුණු සහ ඉලක්ක සපුරාගෙන තිබුනේද යන්න නිශ්චය කිරීමට නොහැකි විය.

(iii) ක්‍රියාකාරී සැලැස්මෙහි අභිමතාර්ථ අංක 04 හි ඉලක්කයන් ලෙස තිරසාර සංවර්ධන අභිමතාර්ථ ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කිරීම දක්වා තිබුණි. 2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසාර සංවර්ධනයට ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුම හා කුසලතාවයන් ලබාගෙන සිටීම සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සඳහා වැඩසටහන් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම සිදුකර නොතිබුණි.

(iv) අභිමතාර්ථ අංක 11 හි ඉලක්ක 11.4 ලෙස සියලු සංස්කෘතික සහ ස්වාභාවික උරුමයන් රැකගැනීම, ආරක්ෂාව සහ සංරක්ෂණය වෙනුවෙන් වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීමේ ඉලක්ක වශයෙන් දෙමළ, මුස්ලිම් හා අනෙකුත් සංස්කෘතික උරුමයන් සඳහා වැඩසටහන් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) සමාජ සංස්කෘතික ඒකාබද්ධතාවය සඳහා විශේෂ වැඩසටහන් (101-2-5-6-1508)

(i) මෙම වැය විෂයය මගින් සංස්කෘතික මධ්‍යස්ථාන හරහා ක්‍රියාත්මක කිරීමට යෝජිත සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් සඳහා මූල්‍යාධාර ලබා දීමට රු.10,000,000ක අයවැය ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු අතර 2022 දෙසැම්බර් 19 දින ඉන් රු.6,560,000ක ප්‍රතිපාදන 101-2-5-9-1409 වැය විෂයයට මාරුකර තිබුණි. මේ නිසා එම වැය විෂයය යටතේ ඉතිරි ප්‍රතිපාදනය අඩු අගයක් දක්වා කාර්යසාධන වාර්තාවේ මුල්‍ය ප්‍රගතිය සියයට100 ක් ලෙස දක්වා තිබුණි. එසේ වුවද, සංස්කෘතික මධ්‍යස්ථාන මගින් ක්‍රියාත්මක කරන සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් සඳහා මූල්‍යාධාර ලබා දීම අවම මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

(ii) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අදාල වැය විෂයයේ කාර්යසාධන දර්ශකය, "ක්‍රියාත්මක කිරීමට යෝජිත සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව" ලෙස දක්වා තිබුණද, ඒ සඳහා වූ අපේක්ෂිත ඉලක්ක පිහිටුවා නොතිබුණි. එසේ වුවද, අදාළ වැය විෂයයේ භෞතික ප්‍රගතිය සියයට 100 ලෙස වාර්ෂික කාර්යසාධන වාර්තාවේ සඳහන් කර තිබුණි.

(iii) මෙම වැය විෂයය යටතේ ක්‍රියාකාරකම් ලෙස සමාජ සංස්කෘතික ඒකාබද්ධතාවය සඳහා විශේෂ වැඩසටහන් පැවැත්වීම හඳුනාගෙන තිබුණද විවිධ ජාතීන්ගේ සංස්කෘතින් නියෝජනය වන පරිදි විවිධත්වයෙන් යුතු වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය (101-02-05-08-1409)

2022 වර්ෂයේ අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය සඳහා අයදුම්පත් කැඳවීම හා පූර්ව ප්‍රචාරක කටයුතු මෙම වැය විෂයය මඟින් සිදුකළ යුතු වුවද වර්ෂය තුළ එම කටයුතු සිදුකර නොතිබුණද අදාළ වැය විෂයයයේ භෞතික ප්‍රගතිය සියයට 99 ක් ලෙස වාර්ෂික කාර්යසාධන වාර්තාවේ සඳහන් කර තිබුණි.

(ඉ) ශිල්ප ගම්මාන වැඩසටහන (101-02-05-21-2506)

ශිල්ප ගම්මාන වැඩසටහනේ පළමු ක්‍රියාකාරකම යටතේ නියමිත අනු ක්‍රියාකාරකම් තුනෙන් කිසිදු ක්‍රියාකාරකමක් සිදු කර නොතිබූ අතර ශිල්පීන් 18 දෙනෙකු සහ ආයතන හා නිලධාරීන් 12 දෙනෙකු සඳහා සම්මාන ප්‍රදානෝත්සවයක් පවත්වා තිබුණි. ඒ අනුව දුම්බර රටා කර්මාන්තය සංචාරක ආකර්ශණය සඳහා ප්‍රවර්ධනය කිරීම යන අරමුණ සාක්ෂාත් කරගෙන නොමැති බව නිරීක්ෂණය විය. අදාල ක්‍රියාකාරකම් සිදු නොකිරීම හේතුවෙන් භෞතික ප්‍රගතියක් නොමැති වුවත්, සියයට 48 ක භෞතික ප්‍රගතියක් වාර්ෂික කාර්යසාධන වාර්තාවේ දක්වා තිබුණි.

(ඊ) සංස්කෘතික වටිනාකම් හා දේශීය දැනුම පිලිබඳ පර්යේෂණ ක්‍රියාකාරකම් (101-02-05-29-2507)

මේ යටතේ පර්යේෂණ ඒකකය ස්ථාපිත කර පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමග ඒකාබද්ධ පර්යේෂණයක් ආරම්භ කිරීම හා ජාතික සංස්කෘතික ප්‍රතිපත්තිය සකස් කිරීම යන කටයුතු වර්ෂය තුළදී සම්පූර්ණ කර නොතිබුණු අතර එම ක්‍රියාකාරකම් දෙක 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මටද ඇතුලත් කර නොතිබුණි. ඒ අනුව ජාතික සංස්කෘතික ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා පුවත්පත් දැන්වීම් සඳහා ගෙවන ලද රු.461,916ක වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්ව ඇති බව නිරීක්ෂණය විය.

3.2 ප්‍රසම්පාදනයන්

(අ) අමාත්‍යාංශයේ සංස්කෘතික අංශය සඳහා පවිත්‍රතා සේවාව ලබා ගැනීම - 2021/2022

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) අමාත්‍යාංශයේ සංස්කෘතික අංශයේ පිරිසිදු කිරීම් සේවා කටයුතු රු.147,000 ක්වූ මාසික කුලියකට 2021 දෙසැම්බර් 01 දින සිට 2022 නොවැම්බර් 30 දින දක්වා කාලසීමාවක් සඳහා 2022 මාර්තු 07 දින ගිවිසුම්ගතවී තිබුණද පිරිසිදු කිරීමේ කටයුතු ආරම්භ කර තිබුණේ 2021 නොවැම්බර් 26 දින වේ.

(ii) ලංසු ලේඛනය ප්‍රකාරව, පවිත්‍රතා සේවකයින්ගේ පෞද්ගලික තොරතුරු ලබා ගත යුතු වුවත් එම තොරතුරු ලබා ගෙන නොතිබූ අතර ලංසු ලේඛනය සහ ගිවිසුම් අතර පැමිණීම් හා පිටවීමේ වේලාව සහ සේවයේ යෙදවිය යුතු සේවක සංඛ්‍යාව සම්බන්ධයෙන් වෙනස්කම් පැවතුණි.

(iii) ගිවිසුම් හා ලංසු ලේඛන ප්‍රකාරව වැඩ සුපරීක්ෂක හා පවිත්‍රතා සේවකයින් 04 දෙනෙකු සේවයේ යෙදවිය යුතු වුවත්, සේවකයින් දෙදෙනෙකු පමණක් 2022 ජනවාරි සිට 2022 දෙසැම්බර් 31 දින තෙක් සේවයේ යෙදී තිබූ අතර වැඩ සුපරීක්ෂකවරයෙකු අධීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි. මෙවැනි අවස්ථාවක දණ්ඩන අයකිරීම් සඳහා අදාල කරගත හැකි කොන්දේසි ලංසු ලියවිලි වලට හා ගිවිසුමට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර දිගින් දිගටම සේවා කොන්දේසි උල්ලංඝනය කර තිබුණද ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් නොගෙන සම්පූර්ණ මාසික කුලී මුදලම ගෙවා තිබුණි.

(iv) පවිත්‍රතා කටයුතු වෙනුවෙන් සැපයුම්කරු විසින් මාසිකව සැපයිය යුතු උපාංග හා ද්‍රව්‍ය මෙන්ම ද්‍රව්‍ය සැපයීම හා භාවිතය සම්බන්ධ කොන්දේසි ලංසු ලේඛනයට සහ ගිවිසුමට ඇතුළත් කර නොතිබුණු අතර එම ද්‍රව්‍ය පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යාමටද එම කටයුතු සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය සඳහා පවිත්‍රතා සේවාව ලබා ගැනීම - 2022/2023

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) පිරිසිදු කිරීමේ සේවාව ලබාගැනීම සඳහා වෙළඳපොල මිල සැදහුම් ලංසු ක්‍රමය භාවිතා කර අමාත්‍යාංශයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවීමට අමාත්‍යාංශයේ සුළු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය හිමිව තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 හා 4.3.2 ප්‍රකාරව මෙම ප්‍රසම්පාදන කාර්යය සඳහා වූ මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද, ලංසු කැඳවීමේ ආරාධනා යවන ලද සැපයුම්කරුවන් 05 දෙනාගෙන් එක් සැපයුම්කරුවෙකු පමණක් ලියාපදිංචි සැපයුම්කරුවන් අතර විය.

(ii) 2021/2022 හා 2022/2023 සේවා ගිවිසුම් ප්‍රකාරව ගෙවිය යුතු උපරිම මාසික ගාස්තුව පිළිවෙලින් රු.798,000 ක් හා රු.831,000 ක් විය යුතු වුවද, ඊට පටහැනිව වැඩිපුර ගෙවන ලද මුදල රු.79,800 ක් වූ අතර එම ප්‍රමාණය වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ජාතික ප්‍රාසාංගික කලා මධ්‍යස්ථානය සඳහා පවිත්‍රතා සේවාව ලබා ගැනීම

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණු අතර පසුගිය මාස 11කට අදාලව ඉදිරිපත් වූ ඉන්වොයිසිවල වටිනාකම් දළ ඇස්තමේන්තුව ලෙස සලකා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සිය නිරීක්ෂණ ලබා දී තිබුණි.

(ii) පිරිසිදු කිරීමේ සේවය ලබා ගැනීමට පෙර අදාල සේවා සැපයුම්කරු සමග ගිවිසුම්ගත විය යුතු වුවත්, 2022 අප්‍රේල් 01 දින සිට සේවය ලබා ගෙන මාස 6ක කාල ප්‍රමාදයකින් පසු 2022 සැප්තැම්බර් 30 දින ගිවිසුමකට එළඹ තිබුණි.

(iii) ලංසු ලේඛන අනුව දෛනිකව සේවයේ යෙදවිය යුතු මුළු සේවක සංඛ්‍යාව 21 ක් වුවද සේවකයන්ගෙන් 6–7 අතර ප්‍රමාණයක් එනම් සියයට 32 ක් පමණ දෛනිකව සේවයට නොපැමිණෙන බව නිරීක්ෂණය විය. ඒ අනුව, නියමිත සේවක සංඛ්‍යාව යොදවා ගුණාත්මක තත්ත්වයෙන් සේවය ලබා ගැනීම සඳහා කිසිදු උත්සාහයක් ගෙන නොතිබූ අතර නොපැමිණෙන සේවකයන් වෙනුවෙන් වූ ගාස්තු අඩුකිරීම් පමණක් සිදුකර තිබුණි.

(iv) වැටුප් ගෙවීමේදී සේවකයෙකු සඳහා දිනකට රු.1,400ක් හා වැඩ පරීක්ෂක සඳහා රු.1,500ක් වශයෙන් ගෙවීම් සිදු කළද නොපැමිණීම් සඳහා මුදල් අඩු කිරීමේදී දෛනිකව රු.740ක් හා වැඩ පරීක්ෂක සඳහා රු.840ක් බැගින් අඩුකල යුතු බව ගිවිසුමෙහි දක්වා තිබුණි. ඒ හේතුවෙන් 2022 අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා කාලඵසීමාව තුල රු.845,460 ක මුල්‍යමය අලාභයක් සිදුව තිබුණි.

(ඇ) සේවා ලබා ගැනීම, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව සිදු කළ යුතු වුවද, ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය සඳහා 2022/23 වර්ෂයට අදාලව ආරක්ෂක සේවාව ලබා ගැනීමේදී සේවා කොන්ත්‍රාත්තුව පෙර වර්ෂයේ සැපයුම්කරු වූ සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා ආයතනය වෙත ලබා දීමට තිරණය කර ඇති බව සෘජුවම ප්‍රධාන ගණකාධිකාරී (ජාතික උරුම අංශය) විසින් 2022 දෙසැම්බර් 12 වන දින අදාල සැපයුම්කරු වෙත දන්වා යවා තිබුණි.

(ඉ) ප්‍රසම්පාදන තීරණයක් මගින් අමාත්‍යාංශය විසින් පවත්වන වැඩසටහන් සඳහා ආහාර ලබා ගත යුතු ආයතන නිර්දේශ කර තිබුණද ඊට පටහැනිව 2022 ජනවාරි 04 දින රු.134,875 ක් ගෙවා වැඩසටහනක් සඳහා කෙටි ආහාර ලබා ගෙන තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම

රු.මිලියන 1350 ක (අදියර 1-5) දක්වා මූලික ඇස්තමේන්තුවක් මත 2005 වර්ෂයේ ආරම්භ කර 2017 සැප්තැම්බර් 30 දින නිම කිරීමට නියමිතව තිබූ විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව අදියර 05ක් දක්වා ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1245.18 ක පිරිවැයක් දරා තිබුණි. කාර්යසාධන වාර්තාව අනුව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් බව දක්වා තිබූ අතර 2022 වර්ෂයේදී ඊට අදාලව වියදම් දරා නොතිබුණි. ඊට අදාලව 2022 නොවැම්බර් 29 දින සිදුකරන ලද ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහත සඳහන් පරිදි විය.

(i) අත්තිවාරමේ පවතින දෝෂ සහිත බව නිසා ප්‍රධාන ගොඩනැගිල්ලට සමානව ඉදිරිපස හා පිටුපස පඩිපේලි ගිලා බැස ඒවායේ ටයිල් ගැලවී තිබුණු අතර ප්‍රවේශ පඩිපෙළ හා සම්බන්ධ බිත්ති පුපුරා ඉරිතැලීම් පැවතුණි. ගිලා බැස්මේ උපරිම ප්‍රමාණය මැනීම සඳහා සම්බන්ධිත පඩිපේලි මත වැලි කොට්ට අසුරා තිබුණි.

(ii) ගොඩනැගිල්ල තුළට පිටතින් ජලය කාන්දුවෙමින් පැවති අතර මධ්‍යම වායු සමීකරණ පද්ධතිය සහිත කාමරයේ ද ජලය කාන්දුවීම් පැවතුණි. ජල ටැංකි ස්ථාපනය කර තිබූ ස්ථානයේ දිය සීරාව මත විවිධ පැළැටි වැවී තිහිප නැනක දියසෙවල බැඳී තිබුණි.

(iii) ගොඩනැගිල්ලේ ඉහලම මහලෙහි ලින්ටල්වල බදාම තවිටු ගැලවී තිබූ අතර ප්‍රවේශ දොරටුවේ බිත්ති සහ සිවිලිම කුරුල්ලන් විසින් අපවිත්‍ර කර තිබුණි.

(iv) ප්‍රධාන ශ්‍රවණාගාරයේ සවිකර තිබූ ආසන මත පුස් සෑදී තිබූ අතර සවි කරන ලද තිර රෙදි අපවිත්‍ර වී තිබූ බවත් ඇතැම් තිර රෙදි අනාරක්ෂිතව අපවිත්‍ර වන සේ බිම ගොඩ ගසා තිබූ බවත් නිරීක්ෂණය විය.

(v) ගොඩනැගිල්ලේ සවි කර තිබූ ගිනි නිවීමේ උපකරණ 2019.11.10 දින කල් ඉකුත් වී තිබූ බව නිරීක්ෂණය විය.

(vi) ගොඩනැගිල්ල පිහිටි භූමි පරිශ්‍රය වල් බිහිවී තිබූ අතර විවිධ වැල් වර්ග ගොඩනැගිල්ල ඇතුළත දක්වා ද වැවී තුබුණි.

(vii) කෙසේ වුවද, මෙම සම්මන්ත්‍රණ ශාලා ගොඩනැගිල්ල මෙම වාර්තාවේ දින වන විටත් භාවිතයෙන් තොරව නිශ්කාර්යව පැවතුණි.

(ආ) අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශයට අයත් අංක 18-4263 දරන මෝටර් රථය 2019 වර්ෂය හෝ ඊට පෙර සිට මහානායක වාරිකාරාම පරිශ්‍රය තුළ දිරාපත් වෙමින් පැවතුණි.

(ඇ) 2018 ඔක්තෝබර් 10 දිනැති 03/2018 අංක දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව 2019 මාර්තු 31 දිනට පෙර රජයට අයත් වාහනවල ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටලු නිරාකරණය කර ගත යුතු වුවද සංස්කෘතික අංශය විසින් පරිහරණය කරනු ලබන අංක KU – 1910, CAM – 5384 හා 32 – 5805 දරන වාහන 03 හි අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අපහරණය කළ යුතු ලෙස හඳුනාගෙන තිබූ සංස්කෘතික අංශය සතු අංක 301-4103, QY-1829 හා 18-7052 දරන වාහන 03 නාගරික සංවර්ධන අධිකාරියට අයත් බත්තරමුල්ල ප්‍රදේශයේ පිහිටි රථ ගාලක අනාරක්ෂිතව ගාල්කර තිබූ අතර එම වාහන සම්බන්ධයෙන් 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 (II) අනුව කටයුතු කර නොතිබුණි.

(ඉ) තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පැවති තිස්සමහාරාම, රන්මිණිතැන්නේ පිහිටි මහින්ද රාජපක්ෂ ටෙලි සිනමා උද්‍යානය, 2020 අගෝස්තු 09 දිනැති අංක 2187/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරා තිබුණි. ඒ අනුව, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ අංක MMI/05/08/16 හා 2020 දෙසැම්බර් 04 දින දරන ලිපිය මගින්, වාහන 09 ක් රන්මිණිතැන්න උද්‍යානයට අනුයුක්ත කර තිබුණි.

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) අමාත්‍යාංශ අතර වත්කම් මාරු කිරීමේදී හා පැවරීමේදී 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ II කොටසේ 8 වගන්තියේ සඳහන් නිර්ණායක ප්‍රකාරව කටයුතු කළ යුතු වුවත් අදාල පැවරීම ඊට අනුකූලව සිදුකර නොතිබුණි.

(ii) අදාල වාහන 09 අතුරින් වාහන 04 ක් ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත පවරා දී තිබූ අතර ඉතිරි වාහන නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) අදාල වාහන භාරගැනීම් අදාල අමාත්‍යාංශය විසින් සිදු කළ යුතු වුවද මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානයේ වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිදු කර තිබුණි. මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය යනු විධිමත්ව ස්ථාපිත නොවූ ආයතනයක් වන බැවින් හා එහි අධ්‍යක්ෂ ජනරාල් තනතුර ද තාවකාලික පත්වීමක් වන බැවින් වාහන භාර ගැනීම් නීත්‍යානුකූල නොවන බව නිරීක්ෂණය විය.

(ඊ) 2022 දෙසැම්බර් 31 දිනට ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය සතුව පවතින නිල නිවාස 10 න් නිල නිවාස 7ක් නිලධාරීන්ගේ පදිංචිය සඳහා හා ඉතිරි නිවාස 3 වෙනත් අවශ්‍යතා සඳහා භාවිතා කරමින් පැවතුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 1 වගන්තිය ප්‍රකාරව සියලුම රජයේ නිවාස උප ලේඛනගත නිවාස හෝ පොදු සේවා නිවාස ලෙස වර්ගීකරණය කළ යුතු වුවද ජනකලා කේන්ද්‍රය සතු නිල නිවාස ඒ අනුව වෙන්කර නොතිබුණි.

(ii) ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5.6 උපවගන්තිය ප්‍රකාරව නිලධාරියෙකුගේ වැටුපෙන් අයකරන නිවාස කුලිය ඔහුට දී තිබෙන නිවාසයේ සාධාරණ ආර්ථික කුලියට වඩා සැලකියයුතු ප්‍රමාණයකින් වැඩි වන්නේ නම් එම නිලධාරියාගේ වැටුපෙන් සියයට ගණනක් අයකර ගැනීම වෙනුවට, නිශ්චිත නිවාස කුලියක් අයකර ගැනීමට ලේකම්වරයාගේ අවසරය ලබා ගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iii) ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 60.1 උපවගන්තිය ප්‍රකාරව තනතුරකට වෙන් කරන ලද නිවාස හැර අනෙකුත් සියළුම නිල නිවාසවල බදු කාලය වසර 5කින් අවසන් වන අතර නිල නිවාස නිලධාරීන්ට භාරදීමේදී ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ සඳහන් කොන්දේසි අනුව අදාල නිලධාරියා සමග ගිවිසුම්ගත විය යුතු වේ. එමෙන්ම නිල නිවාසවලින් ඉවත් වී නොගියහොත් 1971 අංක 03 හා 1974 අංක 40 දරන පනත්වලින් සංශෝධිත 1969 අංක 07 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත යටතේ ඔවුන් එම නිවාස වලින් ඉවත් කළ යුතු වේ. එසේ වුවද, එලෙස ගිවිසුම්ගතවීම ප්‍රතික්ෂේප කරමින් නිල නිවාසයක පදිංචි වී සිටින නිලධාරියෙකු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iv) එක් නිල නිවාසයක් සංගීත අධ්‍යයන කටයුතු සඳහා භාවිතා කරන බවට විගණනය වෙත දන්වා තිබුණද පාවිච්චියට නොගෙන වසා දමා තිබීම හේතුවෙන් වේයන් වැනි කෘමි සතුන්ගේ උවදුරට ලක්ව ඇති බවත්, ගොඩනැගිල්ල අබලන් තත්ත්වයට පත් වීම වළක්වා ගැනීම සඳහා සුදුසු නිලධාරියෙකුට ලබා දෙන ලෙසත් ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රයේ අධ්‍යක්ෂතුමිය විසින් බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමාගෙන් ඉල්ලීමක් කර තිබුණි.

3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වන අධිකාරිය අනුව අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශයේ ඇප තැබිය යුතු නිලධාරීන් 25 දෙනෙකුගෙන් ඇප මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

(අ) දඹදිව වන්දනා සංවාරකයින් ලියාපදිංචිය හා මාර්ගෝපදේශ සැලසීම

(i) දඹදිව වන්දනා සංවිධායකයින් අමාත්‍යාංශයෙහි ලියාපදිංචිවීම තුළින් දඹදිව වන්දනා වාරිකාවේ යෙදෙන්නන්ට නිදහස් වීසා ලබා ගැනීමේ පහසුව සැලසීම, විදේශ ගමන් බලපත්‍ර ලබාගැනීමේ පහසුව හා වන්දනාකරුවන්ට වැඩි ආරක්ෂාවක් සැපයීම වැනි අවස්ථාවන් හිමිවන නමුත් ඔවුන්ට ලැබෙන මෙම පහසුකම් පිළිබඳව සංවිධායකයින් සහ වන්දනාකරුවන් දැනුවත්කිරීමේ විධිමත් වැඩපිළිවෙලක් අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. තවද, නිදහස් වීසා පහසුකම් ලබාදීම තුළින් වියදම් අඩුවීමේ වාසිය වන්දනාකරුවන්ට හිමිවන්නේද යන්න පිළිබඳ පසු විපරම් කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ii) දඹදිව වන්දනාකරුවන් වන්දනාවේ යෙදෙන අතරතුර නිරන්තරයෙන් සෞඛ්‍ය ගැටළුවලට මුහුණ දීම හා කිහිප අවස්ථාවකදී මරණයට පත්වීම ආදි සිද්ධීන් හේතුවෙන් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) විසින් වන්දනා වාරිකා සංවිධාන හා වන්දනාකරුවන් සඳහා සෞඛ්‍ය උපදෙස් සහිත මාර්ගෝපදේශයක් සකස් කර දෙන ලෙස සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් කර තිබුණු අතර ඒ අනුව, සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය විසින් අදාල මාර්ගෝපදේශයක් පිළියෙල කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද, මෙම මාර්ගෝපදේශය අමාත්‍යාංශයේ ලියාපදිංචි සියළු වන්දනා සංවිධානයකයින් වෙත බෙදා දුන් බවට විගණනයේදී තහවුරු කරගත නොහැකි වූ අතර ඊට අදාල පසු විපරම් කිරීමටද කටයුතු කර නොතිබුණි.

(iii) ලියාපදිංචි සංවිධායකයින්ගෙන් දඹදිව වන්දනාවේ යෙදෙන බැතිමතුන්ට සිදුවන අඩුපාඩු සම්බන්ධයෙන් සොයා බැලීමක් අමාත්‍යාංශය මඟින් සිදු කර නොතිබුණු අතර 2020 සිට 2022 දක්වා කාලසීමාව තුළ වන්දනාකරුවන්ට සංවිධායකයින්ගෙන් සිදු වූ විවිධ දුෂ්කරතාවන් හා අසාධාරණයන් දක්වමින් පැමිණිලි 29 ක්ද, වන්දනා සංවිධාකයින්ගෙන් පැමිණිලි 02 ක් ද ලැබී තිබුණද ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් කිසිදු පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(ආ) රජරට වාරිකා නිවාසය පරීක්ෂා කිරීම

(i) රජරට වාරිකා නිවාස ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් බීම් ඉරිතැලී ඇති අතර රියදුරු නවාතැන් ගොඩනැගිල්ලේ විදුලි සවිකිරීම් ආශ්‍රිතව අළුත්වැඩියාවන් සිදු කළ යුතු තත්වයක පැවතුණි. තවද, වාරිකා නිවාසයේ පිවිසුම් මාර්ගය වැසි ජලයට සේදියාම හේතුවෙන් වාහන ඇතුළු කිරීමේ දුෂ්කරතාවයක් පැවතුණ ද මෙතෙක් අළුත්වැඩියාවන් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) වාරිකා නිවාසය වෙන් කිරීමේ ගාස්තුවලට අතිරේකව අමුත්තන්ගේ එක් ඇදක් සඳහා රු.50 බැගින් ඇද ඇතිරිලි ගාස්තුවක් වාරිකා නිවාස භාරකරු විසින් අයකරන ලබන අතර ඒ සඳහා මුදල් රෙගුලාසි 168 (1) සහ (2) වගන්තිය ප්‍රකාරව විධිමත් කුවිතාන්සියක් නිකුත් කර නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි 177 ප්‍රකාරව එකතු කර ගන්නා රජයේ මුදල් දිනපතාම හෝ හැකිතාක් කලින් ප්‍රේෂණය කළ යුතු වුවත් චාරිකා නිවාසයට සුළු මුදල් අග්‍රිමයක් හෝ ලබා දීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් ඇතැම් අවස්ථාවල ඇද ඇතිරිලි ගාස්තුවලින් වෙනත් වියදම් දරා තිබුණි.

(ඌ) නිදහස් උත්සවයේ නර්තනාංග සඳහා ඇඳුම් වෙනුවෙන් අමාත්‍යාංශයේ සංස්කෘතික අංශය විසින් රු.4,429,800 ක් වැය කර තිබුණු අතර එම ඇඳුම් විධිමත්ව නර්තන ඇඳුම් ගබඩාවේ තැන්පත් කර නොතිබීම හේතුවෙන් රංග වස්ත්‍රාභරණවල ශේෂයන්හි නිවැරදිභාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. තවද, සාපේක්ෂව ඉතා ඉහළ පිරිවැයක් දරා නිර්මාණය කරන මෙම නර්තන ඇඳුම් කට්ටල වෙනත් විකල්ප අවස්ථාවන් සඳහා බාහිර ආයතනවලට ලබා දී ආදායම් උත්පාදනය කර ගැනීමට හැකියාව ඇතත් ඒ සම්බන්ධයෙන් අවධානය යොමුනොකර නිශ්කාර්ය ලෙස මෙම ඇඳුම් කට්ටල ගොඩගසා ඇති බව නිරීක්ෂණය විය.

(ඍ) තිස්සමහාරාම, රන්මිණිතැන්න ප්‍රදේශයේ අක්කර 235 ක භූමි ප්‍රදේශයක ඉදිකර තිබූ මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය 2010 මාර්තු 30 වන දින විවෘත කර තිබූ අතර ඒ වන විට ආයතනයක් ලෙස විධිමත්ව ස්ථාපිත වී නොතිබුණි. ඒ සම්බන්ධයෙන් "මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය රජයට අයත් සමාගමක් බවට පත්කිරීම" යන මැයෙන් එවකට ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යවරයා විසින් 2013 ජනවාරි 31 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) අදාල අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කළ යුතු ආයතනය ලෙස ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය නම්කර තිබූ අතර එම අමාත්‍යාංශය විසින් හෝ මෙම උද්‍යානය එවකට පැවති ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් අදාල අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාවට නංවා නොතිබුණි.

(ii) මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය පිහිටි ඉඩම රජයේ ඉඩමක් වන අතර මෙම උද්‍යානය ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය යටතේ පැවති කාලසීමාවේදී එම අමාත්‍යාංශයේ බලයලත් නිලධාරියා වෙත විශේෂ කොන්දේසි කීපයක් යටතේ පැවරීම සිදුකර තිබුණි. මෙම වාර්තාවේ දිනය වන විටත් එම ඉඩම, ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයේ බලයලත් නිලධාරියාගේ නමින් පැවති අතර ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත උද්‍යානය පැවරී වසර 02 කට වැඩි කාලයක් ගත වී තිබුණද අදාල ඉඩම අමාත්‍යාංශය වෙත පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඎ) ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රයේ මෙහෙයුම් කටයුතු හා කාර්යසාධනය පිලිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2022 සැප්තැම්බර් 13 දිනැති අංක අමප/22/1294/620/007දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් වශයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගන්නා ලෙස බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත නිර්දේශ කර තිබුණද, සංස්කෘතික කටයුතු

දෙපාර්තමේන්තුව යටතේ වන ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක නොකර විගණිත දින වන විටත් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පැවතුණි.

(ii) පූර්ව ආසන්නතම වසර තුනක කාලපරිච්ඡේදය තුළ ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය වෙනුවෙන් දරන ලද මුළු වියදම රු.26,365,301ක් වුවත් එම කාලපරිච්ඡේදය තුළ පාඨමාලා සඳහා සහභාගීවී ඇති සිසුන් ගණන 112ක් වැනි අඩු අගයක් ගෙන තිබූ අතර පාඨමාලා සඳහා සහභාගිවන සිසුන් සංඛ්‍යාව වැඩිකර ගැනීම සඳහා සුදුසු ක්‍රමෝපායන් භාවිතා කර නොමැති බව නිරීක්ෂණය විය.

(iii) 2020 ඔක්තෝබර් 26 දිනැති අංක 02/2020 දරන කළමනාකරණ සේවා වක්‍රලේඛයෙහි 1(vii) උපවගන්තිය ප්‍රකාරව ආයතනයන්හි කාලීන සේවා අවශ්‍යතාවයන් අනුව අනුමත සේවක සංඛ්‍යාව සඳහා සංශෝධනයන් අවශ්‍ය වන විට වඩා කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් ලබා දීමට අවශ්‍ය අවම තනතුරු සංඛ්‍යාවක් හඳුනාගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේනතුව වෙත ඉදිරිපත් කර අනුමත කර ගත යුතුය. එසේ වුවද, රංගශාලාවක් නොමැති ජනකලා කේන්ද්‍රය සඳහා කළමණාකරු තනතුරක් හා රංගශාලා සහයක තනතුරු දෙකක් අනුමත තනතුරු ලෙස පවත්වා ගෙන ගොස් තිබූ අතර එම තනතුරු කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් සංශෝධනය කරගෙන නොතිබුණි.

(ඊ) ජාතික ප්‍රාසාංග කලා මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2020 සැප්තැම්බර් 25 දින සිට නෙළුම් පොකුණ රඟහල, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ පැවති ජාතික උරුම ප්‍රාසාංගික කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පරිපාලනය විය. අනතුරුව, 2022 ජූලි 22 දිනැති අංක 2289/49 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතට පත්කර තිබුණි. එසේ වුවද, රඟහල විධිමත් පරිදි සංස්ථාපනය කිරීම උක්ත අමාත්‍යාංශ විසින් 2022 දෙසැම්බර් 31 දින වන විටත් සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

(ii) රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක SA/AMP/Deposit/Transfer දරන 2020 ජනවාරි 09 දිනැති ලිපිය ප්‍රකාරව රඟහලේ ආදායම් සඳහා ආදායම් ශීර්ෂයක් ඇතිකර ගැනීමට කටයුතු කළ යුතු වුවත් සම්බන්ධව 2022 දෙසැම්බර් 31 දින වන විටත් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(iii) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛයේ 5.1 ඡේදය ප්‍රකාරව, සේවා සම්පාදනය සඳහා අයකරනු ලබන විවිධ ගාස්තු ඉහළ නැංවීමක් සිදු කර නොමැති සියළුම රාජ්‍ය ආයතනයන් විසින් අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන එම ගාස්තු සියයට 15 කින් හෝ ට වැඩි ප්‍රමාණයකින් ඉහළ නැංවීමට කටයුතු කළ යුතු වුවද, අමාත්‍යාංශය විසින් 2012 වර්ෂයේ සිට අයකරන ගාස්තු සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර 2020, 2021 හා 2022 වර්ෂවලදී ද ගෙන නොතිබුණි.

(iv) රහහල. කුලී පදනම් මත ලබා දීමේදී ඇතැම් පාර්ශවයන් වෙතින් පමණක් සහනදායී මිල ගණන් මත කුලී මුදල් අයකර (වර්ධිත් ලබා දීම) තිබූ අතර එවැනි සහනදායී අයකිරීම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(v) රහහල, කුලී පදනම් මත ලබා දීමේදී අදාල කුලී ගැනුම්කාර පාර්ශව සමඟ ගිවිසුමකට එළඹ තිබූ අතර ගිවිසුමෙහි පලමු පාර්ශවය වෙනුවෙන් ගිවිසුම් අත්සන් කිරීම රහහල වෙන්කරවා ගැනීමේ නිලධාරී සහ රහහලෙහි ප්‍රධාන පරිපාලන නිලධාරී විසින් සිදු කර තිබුණි. එසේ වුවද, විධිමත් නෛතික පුද්ගලභාවයක් සහිත ආයතනයක් ලෙස රහහල ස්ථාපනය කර නොතිබූ බැවින් ගිවිසුමෙහි නෛතික වලංගුභාවයක් නොපැවතුණි.

(vi) මුදල් රෙගුලාසි 3(1) අනුව රජයේ සියළුම කාර්යයන් කලින් තීරණය කර සැලසුම් හා වැඩසටහන්වල දැක්විය යුතු වුවද, රහහලට අදාල වියදම් දැරීම සඳහා එසේ සැලසුම් කර නොතිබුණු අතර එම වියදම වාර්ෂික ඇස්තමේන්තුවේ ඇතුළත් කර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(vii) විදුලි බිල්පත් සඳහා ගෙවීම් කිරීමේදී, යම් මසක බිල්පත ලැබී දින 15 ක් තුල ගෙවීම් කළ යුතු බවත්, ප්‍රමාද වන ගෙවීම් සඳහා 16 වන දින සිට 1.20% ක මාසික පොලී මුදලක් හිඟ බිල්පත් වටිනාකම මත අයකරනු බවත් බිල්පතෙහි සඳහන්ව තිබුණි. එසේ වුවද, රහහලේ මාසික විදුලි බිල්පත් සඳහා දින 15 ක් ඇතුලත ගෙවීම් කර ප්‍රමාද පොලී අයකර ගැනීම් වලක්වා ගැනීමට පියවර ගෙන නොතිබුණි. මේ හේතුවෙන් 2022 වර්ෂය තුලදී පාරිභෝජනය කල විදුලිය සඳහා වන ගෙවීම් වලට අමතරව රු.460,419ක අතිරේක මුදලක් අධිභාර ලෙස ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 හා 210(2) ප්‍රකාරව කටයුතු කළ යුතු බව නිරීක්ෂණය විය.

(viii) මධ්‍යස්ථානය තුල පෞද්ගලික සන්නිවේදන ආයතන තුනක් මඟින් පවත්වාගෙන යන සම්ප්‍රේෂණ ඇන්ටනා සඳහා සේවා සැපයීම වෙනුවෙන් අයකරනු ලබන බදුකුලී සහ විදුලි වියදම් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

- සම්ප්‍රේෂණ ඇන්ටනා පවත්වාගෙන යනු ලබන පෞද්ගලික සන්නිවේදන ආයතන දෙකක් සමඟ එළඹ තිබූ ගිවිසුම් 2022 දෙසැම්බර් 31 දින වන විට අවසන් වී තිබුණද, නව ගිවිසුම්වලට එළඹ නොතිබුණි. මේ හේතුවෙන් මිල ගණන් සංශෝධනය කර වැඩි ආදායමක් උපයා ගැනීමට රහහලට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.
- ගිවිසුම් ප්‍රකාරව සෑම මසකම 10 වන දින බදු කුලිය ගෙවිය යුතු වුවත් රහහලේ මාසික ආදායම් වාර්තා අනුව, උක්ත සඳහන් සන්නිවේදන ආයතන විසින් වාරික මුදල් නිසි පරිදි ගෙවා නොතිබුණු අතර ගිවිසුම්වලට එළඹීමේදී බදු කුලිය ගෙවීම ප්‍රමාද වීම මත අයකළ යුතු දඩ මුදලක් දක්වා නොතිබීමෙන් ප්‍රමාද දඩ මුදල් අයකළ නොහැකිව තිබුණි.
- රහහල හා එක් එක් සන්නිවේදන ආයතනය අතර වූ ගිවිසුම් අනුව, සම්ප්‍රේෂණ ඇන්ටනා පවත්වාගෙන යාම සඳහා භාවිතා වන විදුලිය වෙනුවෙන් වූ වියදම් එම ආයතන විසින් රහහල වෙත ගෙවිය යුතු අතර රහහල විසින් අදාල බිල්පත් පියවිය යුතු වේ. එසේ වුවද, උක්ත සඳහන් ආයතන විසින් විදුලි බිල්පත් නිසි පරිදි ගෙවා නොනිබීම හේතුවෙන් 2021 හා 2022 වර්ෂ සඳහා රු.1,255,465ක මුදලක් අයවිය යුතුව පැවතුණි.

(ix) මධ්‍යස්ථාන පරිශ්‍රය තුල වර්ග අඩි 400 ක පමණ භූමියක් භාවිතා කරමින් යුධ හමුදාව විසින් ආපන ශාලාවක් පවත්වාගෙන යනු ලබන අතර ඒ සඳහා අදාල හමුදාව වෙතින් කිසිදු කුලී මුදලක් අයකරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. ආපනශාලාව සුහසාධන පදනම මත ක්‍රියාත්මක කරන බැවින් හා එම ආපනශාලාවේ කටයුතු රහහලේ කටයුතු සමඟ සම්බන්ධ නොවන පරිදි වෙන්ව පවත්වාගෙන යනු ලබන බැවින් පරිශ්‍රය වෙනුවෙන් කුලී මුදලක් නොගෙවන බව අදාල යුධ හමුදා අංශය විසින් විගණනය වෙත දක්වන ලදි. එසේ වුවද, අදාල භූමි පරිශ්‍රය ඉතා ඉහළ ආර්ථික වටිනාකමකින් යුක්ත බවත් එම පරිශ්‍රයට අදාලව පිරිසිදු කිරීම්, විදුලි බිල්, ජල බිල් යනාදියද රහහල මඟින්ම දරන බැවින් තක්සේරු වටිනාකම මත කුලී මුදලක් අයකළ යුතු බව නිරීක්ෂණය විය.

(උ) කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා වූ අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා වූ අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය සිදු කරනු ලබන ව්‍යාපෘති බොහෝමයක් ඉටු කිරීම සඳහා වෙනත් ආයතන පවතින බැවින් තවදුරටත් කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා වෙනමම ව්‍යාපෘතියක් පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැති බව නිරීක්ෂණය විය.

(ii) කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩල කාර්යාල පරිශ්‍රය සඳහා මහනුවර මහ නගර සභා සීමාව තුළ පිහිටි ගොඩනැගිල්ලක් බදු කුලී පදනමට ලබා ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර තිබුණි. අදාල බදු ගිවිසුමට අනුව අමාත්‍යාංශය විසින් දේපළෙහි සිදු කරන ලද රු.6,194,607ක සවිකිරීම් හා ඉදිකිරීම්, බදු ගිවිසුම අවසානයේ පවත්නා තක්සේරු වටිනාකම මත බදුදීමනාකරු වෙතින් අය කර ගැනීමට අමාත්‍යාංශය පියවර ගෙන නොතිබූ අතර නව බදු ගිවිසුමට එම කොන්දේසි ඇතුළත් කිරීමට ද කටයුතු කර නොතිබුණි.

(ඌ) පූර්ණ හිමිකාරිත්වය අමාත්‍යාශය සතු සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් (පුද්) සමාගම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) සංස්කෘතික අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල ඉදිකිරීම් හා නඩත්තු කටයුතු කාර්යක්ෂමව ඉටු කරවා ගැනීමේ අරමුණින් අමාත්‍යාංශය වෙත පූර්ණ කොටස් අයිතිය ඇතිව ලියාපදිංචි කර තිබූ සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් (පුද්) සමාගමේ 2018/2019, 2019/2020, 2020/2021 හා 2021/2022 මූල්‍ය වර්ෂවලට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) වර්තමානයේ සමාගමේ කටයුතු සම්පූර්ණයෙන්ම අක්‍රිය වී ඇති බැවින් සමාගම ඇවර කිරීමට 2021 ජූලි 05 දින අග්‍රාමාතය ලේකම්වරයා වෙතින් ඉල්ලා තිබුණද ඇවර කිරීමේ ක්‍රියාවලිය මෙම වාර්තාවේ දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

4. යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) සහ 40 (3) වගන්ති ප්‍රකාරව අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින්, 2021 හා 2022 වර්ෂවල අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර තිබූ විගණන විමසුම් 07 ක් සම්බන්ධයෙන් අදහස් දැක්වීම් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 6 වගන්තිය ප්‍රකාරව වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීමේදී මුදල් රෙගුලාසි 134(2) හි සඳහන් පරිදි විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශයේ සංස්කෘතික අංශය සඳහා දහසකට ආසන්න කාර්ය මණ්ඩලයක් සහ දිවයින පුරා පිහිටුවා ඇති සංස්කෘතික මධ්‍යස්ථාන 208 ක් ක්‍රියාත්මකව පැවතියද, අනුමත අභ්‍යන්තර විගණක තනතුර වසර කිහිපයක සිට පුරප්පාඩුව පැවතුණි.

5. මානව සම්පත් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශය සඳහා අනුමත කාර්ය මණ්ඩලය 219ක් හා නත්‍ය කාර්ය මණ්ඩලය 164 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව 55කි. ඒ අනුව, අධ්‍යක්ෂ තනතුරක, ඉංජිනේරු සහ සහකාර ඉංජිනේරු තනතුරු 02 ක, සහකාර ලේකම් තනතුරු 03 ක පුරප්පාඩු පැවතුණි. ඊට අමතරව, සංවර්ධන නිලධාරි තනතුරු 13 ක සංවර්ධන සහකාර තනතුරු 12 ක සහ කළමනාකරණ සේවා නිලධාරි තනතුරු 9 ක සහ රියදුරු තනතුරු 07 ක පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම අමාත්‍යාංශයේ කාර්යසාධනය කෙරෙහි බලපෑමක් ඇති කරන බව නිරීක්ෂණය කෙරේ.

(ආ) සංස්කෘතික අංශය සඳහා සහකාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීන් 201 ක් අනුමත කර තිබුණද නත්‍ය සංඛ්‍යාව 133 ක් වූ අතර තනතුරු 68 ක් එනම් සියයට 34 ක පුරප්පාඩු පැවති අතර සංස්කෘතික අංශය සඳහා අනුමත සංවර්ධන නිලධාරි සංඛ්‍යාව 141 ක් වුවද නත්‍ය සංඛ්‍යාව 187 ක් වුයෙන් තනතුරු 46 ක එනම්, සියයට 33 ක අතිරික්තයක් පැවතුණි.

(ඇ) අමාත්‍යාංශය සතුව සංස්කෘතික මධ්‍යස්ථාන 208 ක් පැවතුණද මධ්‍යස්ථාන මුරකරුවන් 297 ක් සේවයේ යොදවා තිබුණි. 2020 දෙසැම්බර් 10 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දරන්නාට පමණක් පෞද්ගලික වන සේ මුරකරුවන් 106 ක් අනුමත කිරීම හේතුවෙන් මෙම අතිරික්තය වාර්තා වී තිබුණි. සිදුකළ විගණන පරීක්ෂාවේදි අතිරික්ත මුරකරුවන් 89 දෙනාගේ සේවය කාර්යක්ෂම අයුරින් ලබා ගැනීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. මෙම මධ්‍යස්ථානවල සේවයේ නිරත සේවකයන් සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීමේ වැදගත්කම 2021 වර්ෂයේ විගණන වාර්තාවලින් පෙන්වා දී තිබුණද අමාත්‍යාංශය විසින් මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ඈ) මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය සඳහා "කාර්යාල කාර්ය සහායක තනතුර" අනුමත තනතුරක් නොවුවද 2022 දෙසැම්බර් 31 දින වන විටත් පුද්ගලයන් 02 දෙනෙකු එම තනතුරේ සේවය කරමින් පැවතුණි.

එච්.එම්.රණසිංහ මිණ්ඩා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පරිච්ඡේදය 04 - කාර්යය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්ත්‍ය නිමැවුම		
	100% -90%	**75% - 89%**	**50% - 74%**
1. සංස්කෘතික මධ්‍යස්ථානවල පාඨමාලා හදාරන සිසුන් ගණන, සත්‍ය අගය - 15,853 (සංස්කෘතික මධ්‍යස්ථාන -207) (අපේක්ෂිත අගය - 45,000) **තත්ත්‍ය නිමැවුම (35%)** • රට තුළ පැවති ආර්ථික අස්ථායිකරණය හමුවේ අපේක්ෂිත අගයට ලඟාවීමට අසීරු විය.	-	-	-
2. සංස්කෘතික මධ්‍යස්ථාන පුස්තකාල හරහා පුස්තකාල පහසුකම් ලබන ප්‍රාදේශීය පුස්තකාල සාමාජිකයන් ගණන, සත්‍ය අගය - 57,818 (අපේක්ෂිත අගය - 40,000)	100%	-	-
3. සංස්කෘතික කටයුතු අංශය මගින් වාර්ෂිකව පවත්වන ලද / දායකත්වය ලබාදෙන ලද ජාතික/ විශේෂ වැඩසටහන් ගණන, සත්‍ය අගය - 05 (අපේක්ෂිත අගය - 10) • රට තුළ පැවති ආර්ථික අස්ථායිකරණය හමුවේ අපේක්ෂිත අගයට ලඟාවීමට අසීරු විය.	-	-	50%
4. සංස්කෘතික මධ්‍යස්ථාන විසින් ප්‍රාදේශීයව පවත්වන ලද විශේෂ සංස්කෘතික වැඩසටහන් ගණන සත්‍ය අගය - 926 (අපේක්ෂිත අගය - 1,300)	-	-	71%
5. සංස්කෘතික කටයුතු අංශය මගින් පවත්වන ලද විදේශ සංස්කෘතික සබඳතා වැඩසටහන් ගණන සත්‍ය අගය - 3 (අපේක්ෂිත අගය - 35) **තත්ත්‍ය නිමැවුම (8%)** • රට තුළ පැවති ආර්ථික අස්ථායිකරණය හමුවේ අපේක්ෂිත අගයට ලඟාවීමට අසීරු විය.	-	-	-

6. ක්‍රියාත්මක සංස්කෘතික ද්විපාර්ශ්වික ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් ගණන සත්‍ය අගය - 48 (අපේක්ෂිත අගය -68)	-	-	70%
7. අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීම (සිංහල හා දමිළ මාධ්‍ය වලින්) සත්‍ය අගය - 1,392 (අපේක්ෂිත අගය -3,000) **තත්ත්‍ය නිමැවුම (46%)** • රට තුළ පැවති ආර්ථික අස්ථායිකරණය හමුවේ අපේක්ෂිත අගයට ලඟාවීමට අසීරු විය.	-	-	-

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
4. පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමට අවස්ථාව සලසා දීම	**4.7.** 2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබා සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපන හා තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය, ප්‍රචණ්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය හා සංස්කෘතික විවිධත්වය ඇගයීම හා තිරසර සංවර්ධනයට සංස්කෘතික වශයෙන් දායක වීම ඇතුලත් වේ	1. දීප ව්‍යාප්තව ඉදිවන, ක්‍රියාත්මක සංස්කෘතික මධ්‍යස්ථාන ගණන	-	65%	-
		2. සංස්කෘතික මධ්‍යස්ථාන හරහා පැවැත්වෙන පාඨමාලා සාර්ථකව නිමකරන සිසුන් සංඛ්‍යාව	35%	-	-
		3. සංස්කෘතික මධ්‍යස්ථානවල ප්‍රාදේශීය පුස්තකාලවලින් බිහිවන පාඨක සංඛ්‍යාව	-	-	100%
		4. සංස්කෘතික මධ්‍යස්ථාන විසින් ප්‍රාදේශීයව පවත්වන ලද විශේෂ සංස්කෘතික වැඩසටහන් ගණන	-	71%	-
		5. සංස්කෘතික කටයුතු අංශය මඟින් වාර්ෂිකව දායකත්වය දක්වන ලද විශේෂ සංස්කෘතික වැඩසටහන් සංඛ්‍යාව	-	50%	-
		6. විදේශ සංස්කෘතික සබඳතා,	-	70%	-

		සංස්කෘතික ද්විපාර්ශ්වික ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් මඟින් කලාකරුවන් ලද පුහුණු අවස්ථා සංඛ්‍යාව			
		7. අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය සඳහා ඉදිරිපත් වූ නිර්මාණ සංඛ්‍යාව	46%	-	-
11 නගර හා ජනාවාස, පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් හා තිරසර ලෙස සකස් කිරීම	**11.4.** ලෝකයේ ස්වභාවික හා සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම	1. ශිල්ප ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම • කලාසිරිගම හා ආලෝකගම කර්මාන්තයේ නියුතු ශිල්පීන් 18 දෙනෙකු තෝරාගැනීම , මුදල් ත්‍යාග ලබාදීම, සම්මාන ප්‍රදානය, කර්මාන්තයේ දියුණුව සඳහා උපකරණ ලබාගැනීමට ප්‍රතිපාදන ලබාදීම .	30%	-	-
		2 සංස්කෘතික වටිනාකම් හා දේශීය දැනුම පිළිබඳව එළිදක්වන ලද පර්යේෂණ වාර්තා සංඛ්‍යාව	-	-	-
		3. ජාතික උරුමයන් සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම.	-	70%	-

		• අස්පෘෂ්‍ය උරුම සංරක්ෂණය පිළිබඳ යෝජනාවක් යුනෙස්කෝ සංගමය වෙත ඉදිරිපත් කිරීම			

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

ජයග්‍රහණ

1. අමරදේව අසපුව නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වූ ප්‍රතිපාදන බුද්ධශාසන අංශය වෙතින් හුවමාරු කර ගනිමින් එම ව්‍යාපෘතියේ කටයුතු සිදු කිරීම
2. 74 වන නිදහස් දින උළෙල සඳහා විචිත්‍රවත් සංස්කෘතිකාංග සමග පැවැත් වූ සංස්කෘතික ප්‍රසංගය දෙස් විදෙස් අමුත්තන්ගේ පැසසුමට ලක් වීම
3. ඉදිරියේදී මතු විය හැකි ලෝක ආහාර අර්බුධය මගහරවා ගැනීම සඳහා යම් දායකත්වයක් දරමින් ‘‘දැහැමි ගොවිතැනින් යහපත් සංස්කෘතියක්’’ නමින් වගා ව්‍යාපෘතියක්, සංස්කෘතික අංශය හා අනුබද්ධ සියළු ආයතන හා සම්බන්ධ වෙමින් 2022 වසර පුරා ක්‍රියාත්මක කිරීම
4. ජාතික සංස්කෘතික ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා පියවර ගැනීම.
5. ලෝක උරුම දුම්බර රටා කර්මාණ්තයේ නියුතු ශිල්පීන් ඇගයීමට ලක් කිරීම, ශිල්පීන් 18 දෙනෙකු සඳහා සම්මාන ප්‍රදානය සහ කර්මාන්තයේ දියුණුවට අවශ්‍ය උපකරණ ලබා ගැනීම සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දීම.
6. දැයේ දරුවන්ගේ කලා කුසලතාවයන් සංවර්ධනය හා දිරිගැන්වීමෙන් ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හි සිසුන්ගේ තරඟ පවත්වා ජයග්‍රාහකයින් සඳහා සම්මාන සහ සහතික පත්‍ර පිරිනැමීමේ ප්‍රතිභා 2021 උත්සවය පැවැත්වීම.
7. අන්තර්රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලිය හරහා රාජ්‍ය සේවයින්ගේ සහ විශ්‍රාමික රාජ්‍ය සේවකයින්ගේ කලා කුසලතාවයන් ඇගයීම.

අභියෝග

1. 2022 වර්ෂය තුළ සිදු වූ අරබුධ හමුවේ වූවද කලා සංස්කෘතික ක්‍රියාකාරකම් පවත්වා ගැනීම.
2. රට තුළ පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් කාර්යාල වෙත සේවකයින් ගෙන්වීම සීමා කිරීම.
3. කාර්තු පදනමින් ප්‍රතිපාදන ලබාදීම හා ඉහත අර්බුධ තත්ත්වයන්ද හේතුවෙන් නිශ්චිත කාලසීමාවන් තුළ ඵලදායීව හා කාර්යක්ෂමව ප්‍රතිපාදන භාවිතා කිරීමට සිදු වීම
4. රජය මගින් වියදම් සීමා කිරීමට උපදෙස් ලබා දී ඇති පසුබිමක දිවයින පුරා පිහිටි සංස්කෘතික මධ්‍යස්ථාන ජාලය පවත්වා ගැනීම

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	17	12	5
තෘතීයික	02	01	01
ද්විතියික	589	518	114/ (43)
ප්‍රාථමික	435	498	43

6.2 සංස්කෘතික කටයුතු අංශයේ අරමුණු ඉටුකරගැනීම උදෙසා මානව සම්පත උපරිමයෙන් ප්‍රයෝජනයට ගෙන ක්‍රියා කරනු ලැබේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
1. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබූ දෙමළ භාෂා ප්‍රායෝගික පුහුණුව	59	මාස 06	112,500		දේශීය	ආයතනයේ නිලධාරීන් 60දෙනෙකු සඳහා දෙමළ භාෂා පුහුණුව ලබා දෙන ලදී
2. Government Payroll	01	2022.11.28,29,30	18,000		දේශීය	ගිණුම් අංශයේ ටී.පී.එච්. චතුරංගි මෙය සහභාගී වන ලදී.
3. රාජ්‍ය ගිණුම්කරණ ක්‍රමවේදය දැනුවත් කිරීම හා අවසාන ගිණුම් පිලියෙල කිරීම පිළිබඳ පුහුණුව	01	2022.11.28,29	7,500		දේශීය	ගිණුම් අංශයේ එම්.පී. මහේෂි වීරරත්න මෙය සහභාගී වන ලදී.

පුහුණු වැඩසටහන් මගින් නිලධාරීන් දැනුවත් කිරීම් හා ඔවුන් ලබන අත්දැකීම් රාජකාරි කටයුතු සඳහා උපයෝගී කර ගැනීමෙන් ආයතනයේ කාර්ය සාධනය වැඩිදියුණු කර ගත හැකිය.

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	අමාත්‍යාංශය යටතේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් හැර වෙනත් අත්තිකාරම් ගිණුම් පවත්වනු නොලැබේ.	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ		-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ		-
1.6	වෙනත්	අනුකූල නොවේ		-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩිපත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.5	සියලුම මාසික ගිණුම් සාරංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමතවන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරියන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූල වේ	-	-
6	**අභ්‍යන්තර විගණනය**			

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.1	මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව , අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ	-	-
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ	-	-
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම	අනුකූල වේ	-	-
	සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ	-	-
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	මු.රෙ.772 ට අනුව සිදුකිරීම			
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.	-	-
9.2	වාහන ගර්භිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කිරීම	අනුකූල වේ.	-	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	-	-
9.4	සෑම අනතුරක් සම්බන්ධයෙන්ම මු.රේ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ.	වාහනවලට ඉන්ධන නිකුත් කරන ප්‍රමාණය අනුව මෙම පරීක්ෂණය කිරීම ප්‍රයෝගිකව අසීරු වී ඇත.	බණිජතෙල් නීතිගත සංස්ථාව වෙත දන්වා QR ක්‍රමවේදය බැහැරව මෙම කටයුත්ත පමණක් සිදුකිරීමඅවසර ඉල්ලීම කටයුතු කරමි.
9.6	කල් බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ.	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල්කර තිබීම	අනුකූල වේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	-
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ	-	-
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූලවීම	අනුකූල වේ	-	-
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත	අනුකූල නොවේ	ඉදිරියේදී	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම		ණයකරුවන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකරගැනීමට කටයුතු කරමින් පවතී.	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතුකර තිබීම	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
14	**අග්‍රීම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ	-	-
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාරය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	මාසිකව සැසඳුම් කිරීම			
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ	-	-
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ	-	-
15.3	මු.රෙ 176 අනුව හිග ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ.	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ.	-	-
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 2017/04 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.	-	-
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු	අනුකූල වේ.	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම			
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක (1) 05/2018 හා 05/2008දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.	-	-
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.	-	-
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.	-	-
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ.	පවතින ආර්ථික අර්බුදය හමුවේ ප්‍රතිපාදන ඉතිරි කරගැනීම සඳහා පුහුණුවීම් අත්හිටුවා ඇත.	
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ.	-	-
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කිරීම	අනුකූල වේ.	-	-
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.	-	-

ජාතික උරුම අංශය

පරිච්ඡේදය 01 ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

01. ජාතික උරුම අංශය

1.1 හැඳින්වීම

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම සහ සංස්කෘතිය, සාහිත්‍ය සහ කලාව ඉහළ ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාම යන ප්‍රතිපත්තිය අනුව හා අංක 2289/43 හා 2022.07.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින්, මෙම අමාත්‍යාංශයෙහි ජාතික උරුම අංශය ස්ථාපනය කිරීම හා කාර්යභාරය නෛතික පැවරීම සිදු කර ඇත. මේ සඳහා අදාළ නීති සහ අණ පනත්වලට අනුකූලව සංස්කෘතිය, ජාතික උරුම, ප්‍රාසාංග කලා, ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහය වීම, ජාතික අයවැය, ජාතික ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පරිපාලන වගකීම පවරා ඇති දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම ජාතික උරුම, ප්‍රාසාංග කලා අංශය වෙත පවරා ඇත.

1.2 දැක්ම

ජාතික උරුමයන් සංරක්ෂණය, සාහිත්‍ය සහ කලාව ප්‍රවර්ධනය තුළින් අභිමානවත් ශ්‍රී ලංකාවක්.

මෙහෙවර

ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම සහ සංස්කෘතික, සාහිත්‍ය සහ කලාව ඉහළ ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාම සඳහා අදාළ නීති සහ අණ පනත්වලට අනුකූලව සංස්කෘතිය, ජාතික උරුම, ප්‍රාසාංග කලා, පාරම්පරික හා ග්‍රාමීය කලා ශිල්පී කටයුතු ප්‍රවර්ධනය කිරීමට සහය වීම සහ ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය කළමණාකරණය කිරීම සඳහා සහය වීම.

අරමුණු

1. ශ්‍රී ලාංකීය ජාතික උරුමයන් නෛතිකව හඳුනා ගැනීම හා ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම.
2. ජාතික උරුම, ප්‍රාසාංග කලා, ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම.
3. ස්පර්ශනීය හා අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් සංරක්ෂණය හා ප්‍රවර්ධනය.
4. දැයේ දරුවන් සහ තරුණයින් ඇතුළු ප්‍රජාව ජාතික උරුම සංරක්ෂණය හා සාරධර්ම පිළිබඳ දැනුවත් කිරීම.

5. සංස්කෘතික විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රකාශනවල නිර්මාණශීලීත්වය හා විවිධත්වය පෝෂණය කිරීම.
6. සෑම ආයතනයකම පවත්නා ව්‍යවස්ථාපිත තත්වය හා නෛතිකව තහවුරු කිරීම හා යාවත්කාලීන කිරීම.
7. ආදිවාසී හා සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාවන්ගේ අයිතීන් සුරැකීම හා තෘප්තිමත් ජන කොටසක් බවට පත් කිරීම.
8. කලා ශිල්පීන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය තහවුරු කිරීම.
9. දේශීය කලා නිර්මාණයන් ජාත්‍යන්තර ප්‍රජාවට වින්දනය කිරීමට අවස්ථාවන් හා පහසුකම් සැලසීම.
10. දේශීය කලා නිර්මාණ සංරක්ෂණය හා ප්‍රවර්ධනය හා ඉහළ ප්‍රමිතියකින් යුතුව ප්‍රජාවට වින්දනය කිරීම සඳහා පහසුකම් සැලසීම.
11. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය කළමණාකරණය කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

1. මධ්‍යම සංස්කෘතික අරමුදල පරිපාලන සහ ඒ පිළිබඳ අධ්‍යයනයක් කර ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කිරීම.
2. සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක උරුමයන් ආරක්ෂා වන අයුරින් සංස්කෘතික හා ජාතික උරුමයන් වල අභිමානය ප්‍රමුඛ වන වැඩසටහන් සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම.
3. ජාතීන් අතර සහයෝගය ඇති කිරීමෙහිලා සංස්කෘතිමය දායකත්වය යොදාගැනීමේ ප්‍රවණතාවයන් හඳුනාගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
4. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම පසු විපරම් කිරීම හා ඇගයීම.
5. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාර්ය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණය ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
6. බෞද්ධ ආගමික හා සංස්කෘතික කටයුතු සම්බන්ධයෙන් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම.
7. ඓතිහාසික, පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
8. නවීන හා සාම්ප්‍රදායික කලා නිර්මාණ ප්‍රවර්ධනයට සහ කලා ශිල්පීන් දිරිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
9. නාට්‍ය, සංගීත හා නර්තන ක්ෂේත්‍රයන්ගේ අභිවර්ධනයට අදාළ ක්‍රියාමාර්ග හඳුනාගෙන ක්‍රියාවට නැංවීය.

1.4 සංවිධාන සටහන

බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශය (ජාතික උරුම අංශය)



1.5 පරිපාලන වගකීම් පැවරී ඇති ආයතන

1 ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය

2 ගාලු උරුමය පදනම

3 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

4 කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය

5 අපේ ගම

6 ජාතික ප්‍රසාංගික කලා මධ්‍යස්ථානය (නෙළුම් පොකුණ)

7 මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය

8 ටවර් හෝල් රඟහල පදනම

9 ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සංගමය

1.1 පරිපාලන වගකීම් පැවරී ඇති ආයතන පැතිකඩ හා කාර්යභාර්ය

1.6.1 ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය

හැඳින්වීම

වර්ෂ 1988 නොවැම්බර් 17 වන දින ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය ආරම්භ කරන ලදී. 1996 වර්ෂයේ සිට නර්තන, චිත්‍ර හා මූර්ති, සංගීත, නාට්‍ය හා රංගකලාව යන සෞන්දර්ය පාඨමාලාවන් ඇතුළත් කරන ලදී. වර්තමානයේ නර්තනය, සංගීතය, යන පාඨමාලා සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂම් සභාවේ සහ ජාතික අධුනිකත්ව පුහුණු අධිකාරියේ අනුමැතියෙන් ජාතික නිපුණතා 4, 5 සහ 6 මට්ටම් ප්‍රදානය කෙරේ. අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධව 13 වසරක සහතික කළ අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ ප්‍රාසාංගික කලා විෂයන් හදාරන සිසුන්ගේ අඛණ්ඩ අධ්‍යයන අවස්ථාවන් තහවුරු කර ඇත.

අරමුණු

1. ලලිත කලාවන් හා බැඳි ශිල්ප ක්‍රම ගවේෂණය.
2. ලලිත කලාවන් හා බැඳි ශිල්ප ක්‍රම ආරක්ෂා කිරීම.
3. ලලිත කලාවන් හා බැඳි ශිල්ප ක්‍රම මතු පරපුර වෙත පැවරීම.
4. ලලිත කලාවන් හා බැඳි ශිල්ප ක්‍රම අන්තර් ජාතික වශයෙන් දැනුවත් කිරීම.

මෙහෙවර

ශ්‍රී ලංකාවේ ලලිත කලාවන් හා බැඳි පාරම්පරික ශිල්ප ක්‍රම ගවේෂණය, සුරක්ෂිත කිරීම හා එම ශිල්ප ඥානය මතු පරපුර වෙත පැවරීම හා අනාගත ශිල්පීන් බිහි කිරීම පිණිස දැනුම හා පරිසරය ගොඩනගමින් ලොව පුරා ශ්‍රී ලාංකීය ලලිත කලාවන් හා බැඳි ශිල්ප ක්‍රම ප්‍රචලිත කිරීම.

ප්‍රධාන කාර්යයන්

1. දේශිය ලලිත කලාවන් අගයන තරුණ පරම්පරාවක් බිහිකරීම
2. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විෂයය සඳහා සෞන්දර්යය විෂයයන් හැදෑරීම සඳහා
3. උත්ප්‍රේරණයක් ඇති වීමරටට අවශ්‍ය නිර්මාණශීලී වෘත්තියිකයින් බිහිකිරීම සඳහා දායක වීම.
4. ආයතනය සමාජ ගත කිරීම මඟින් වැඩි අභ්‍යාසලාභීන් පිරිසක් බඳවා ගැනීමට හැකිවීම.

1.6.2 ගාලු උරුමය පදනම

හැඳින්වීම

ගාලු උරුමය පදනම 1994 අංක 07 දරන පාර්ලිමේන්තු පනත මගින් රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස පිහිටුවනු ලැබීය. එහි ප්‍රධාන අරමුණු වූයේ ගාලු කොටුව සහ එහි ඓතිහාසික පශ්චාත් භූමිය ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීමයි. මෙතෙක් විවිධ අමාත්‍යාංශ යටතට පත්වූ ගාලු උරුමය පදනම වර්තමානයේ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. එසේම ගාලු උරුමය පදනමේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය 1994 අංක 07 දරන ගාලු උරුමය පදනම පනත මගින් ''කළමනාකරණ මණ්ඩලය'' වෙත පවරා ඇත (පනතේ 05 වන වගන්තිය පරිදි). ඒ අනුව ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩලය යටතට නිල බලයෙන් පත් වූ සාමාජිකයන් 14 දෙනෙක් ද, ගරු අමාත්‍යවරයා විසින් පත් කරන සාමාජිකයන් හය දෙනෙක්ද, නිල බලයෙන් පත්වූ සාමාජිකයන් විසින් ''තෝරාපත් කර ගන්නා සාමාජිකයන්'' හය දෙනෙක්ද ඇතුළුව මුළු කළමනාකරණ මණ්ඩලය සාමාජිකයන් 26 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම සාමාජිකයින්ගේ ධුර කාලය වසර 02 කි.

ගාලු කොටු පවුර පුරාවිද්‍යා ස්මාරකයක් ලෙස 1971 දී ගැසට් කිරීමත්, 1988 දී යුනෙස්කෝ සංවිධානය විසින් ලෝක උරුම ස්ථානයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම හේතුකොට ගෙන රජයේ සහ මහජනයාගේ වැඩි අවධානය එයට යොමුවීමත් සමඟ මෙහි ආරක්ෂාව හා සංරක්ෂණය සඳහා ගාලු උරුමය පදනම විසින් විවිධ පියවර ගනු ලැබිණ.

දැක්ම

ගාල්ල කොටුව දකුණු ආසියාවේ ප්‍රශස්ථම බලකොටු නගරයකි.

මෙහෙවර

සංස්කෘතික ලෝක උරුමයක් වශයෙන් එහි කැපී පෙනෙන විශ්වීය වටිනාකම ආරක්ෂා කර ගනිමින් ප්‍රජා සහභාගීත්ව උරුම කළමනාකරණ ක්‍රමවේදයක් තුළින් වඩාත් ආකර්ෂණීය සංස්කෘතික උරුම සංචාරක ගමනාන්තයක් ලෙස ගාලු කොටුව හා එහි හාත්පස භූමියේ තිරසාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම.

අරමුණු

1. ඓතිහාසික නගර මධ්‍යස්ථානයක් ලෙසද පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති ප්‍රදේශයක් ලෙසද ගාලු කොටුව සහ එහි ඓතිහාසික පශ්චාත් භූමිය ප්‍රවර්ධනය කිරීම, සංරක්ෂණය කිරීම,ආරක්ෂා කිරීම හා සංවර්ධනය කිරීම;

2. ලිඛිත නීතියේ විධිවිධානවලට යටත්ව , ගාලු කොටුව හා එහි ඓතිහාසික පශ්චාත් භූමිය ඇතුළත පිහිටියා වූද ඓතිහාසික, සංස්කෘතික හෝ සෞන්දර්යාත්මක වටිනාකමක් ඇති වූ ද යම් නිශ්චල හා චංචල දේපලක් අත්කර ගැනීම, පවත්වාගෙන යාම සහ බැහැර කිරීම;

3. ගාලු කොටුව හා එහි ඓතිහාසික පසුබිම ඇතුළත පිහිටි නිවාස, ගොඩනැගිලි සහ වෙනත් දේපළ සංරක්ෂණය කිරීමෙහිලා ගාලු කොටුව තුළ පදිංචිකරුවන්ගේ උනන්දුව ප්‍රවර්ධනය කිරීම හා එකී කොටුව සහ එහි ඓතිහාසික පසුබිම සංරක්ෂණය කිරීම හා ආරක්ෂා කිරීම සම්බන්ධයෙන්ද එකී කොටුවේ සහ එහි ඓතිහාසික පසුබිමේ ඓතිහාසික, සංස්කෘතික පුරාවිද්‍යාත්මක හා සෞන්දර්ය අංශ සම්බන්ධයෙන් ද එකී කොටුව තුළ පදිංචිකරුවන් අධ්‍යනය කිරීම ද එකී කොටුව සහ එහි ඓතිහාසික පසු බිම තුල පිහිටා ඇති නිවාස සහ ගොඩනැගිලි නැවත තැනීම, අලුත්වැඩියා කිරීම, සංරක්ෂණය කිරීම, තත්වය උසස් කිරීම, යථා තත්වයට පත් කිරීම හා ඒ නිවාස හා ගොඩනැගිලි යොදා ගැනීමේ නව ක්‍රම සොයා ගැනීම;

4. ගාලු කොටුව සහ එහි ඓතිහාසික පසුබිම පශ්චාත් භූමියට ඇතුළු වී එහි සිරි නැරඹීම සඳහා පහසුකම් සැලැස්වීම;

5. ගාලු කොටුව හා එහි ඓතිහාසික පශ්චාත් භූමිය තුළ පදිංචිකරුවන්ගේ සාමාන්‍ය සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම.
6. ඉහත කී අරමුණු සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් සියලු ක්‍රියා හෝ දේ ඉටු කිරීම.

ප්‍රධාන කාර්යයන්

1. සුවිශේෂී විශ්වීය වටිනාකමකින් යුතු ලෝක උරුමයක් ලෙස ගාලු කොටුවේ සංවර්ධනයට දායක වීම.
2. ගාලු කොටුවේ සුවිශේෂී පුරාවිද්‍යාත්මක වටිනාකම ආරක්ෂා කරන අතරම, ආකර්ෂණීය සංචාරක පුරවරයක් සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම.
3. ප්‍රජා මතයන්ට ගරු කරමින් තීන්දු තීරණ ගැනීමේදී ප්‍රජා සහභාගීත්වයද ලබාගනිමින් ලෝක උරුමයක් ලෙස ගාලු කොටුව පවත්වාගෙන යාම.
4. ජනතාවගේ ජීවනෝපාය නගාසිටුවීමට සෘජුව හා වක්‍රව දායක වීම.

1.6.3 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

හැඳින්වීම

වර්ෂ 1940 අංක 09 දරණ පුරාවිද්‍යා අඥාපනතින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නීති ගත කර ඇත. 1890 ජූලි 07 වැනි දින ආරම්භ කරන ලද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට 2022 ජූලි 07 වන දිනට වසර 132 සපිරිනි. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වන්නේ ශ්‍රී ලාංකීය ජාතික උරුමයන් නෛතිකව හඳුනා ගැනීම හා ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම ඒ පිළිබඳ නිසි කළමනාකරණය ප්‍රවර්ධනය කිරීමයි. එම කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීම සඳහා 1998 අංක 24 දරණ පුරාවස්තු (සංශෝධන) පනතින් අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සම්පාදනය කර ඇත. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වතමන් කටයුතු බුද්ධසාශන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ සිදුවේ.

අරමුණු

ඉහත මෙහෙවර ඉෂ්ට කර ගැනීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අරමුණු කිහිපයකි.

1. සම්පත් ප්‍රවර්ධනය.
   I. මානව
   II.ආයතනික
2. සමස්ත පුරාවිද්‍යාත්මක උරුමය ආරක්ෂණය.
3. පුරාවිද්‍යාත්මක උරුමය ලේඛනගත කිරීම.
   I. ස්ථාන සහ ස්මාරක
   II. චංචල පුරාවස්තු
4. පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳ මහජන අවබෝධය ප්‍රවර්ධනය කිරීම.
5. පුරාවිද්‍යාත්මක ස්ථාන / ස්මාරක හා චංචල පුරාවස්තු සංරක්ෂණය හා නඩත්තුව.
6. පර්යේෂණ.

දැක්ම

සමස්ත පුරාවිද්‍යාත්මක උරුමය මනා ලෙස කළමනාකරණය කර මතු පරපුරට දායාද කිරීම.

මෙහෙවර

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණයේ වගකීම දරන උපරිම ආයතනය සහ එහි ප්‍රධාන නියාමන ආයතනය ලෙස කටයුතු කිරීම.

ප්‍රධාන කාර්යයන්

1. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය හඳුනා ගැනීම.
2. ශ්‍රී ලංකාවේ චංචල හා නිශ්චල පුරාවිද්‍යාත්මක උරුමය ලේඛනගත කිරීම.
3. පුරාවිද්‍යාත්මක උරුමය විනයානුකූලව සංරක්ෂණය කිරීම, නඩත්තු කර පවත්වාගෙන යාම හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
4. පුරාවිද්‍යා ආඥා පනත ක්‍රියාත්මක කිරීම.
5. සංස්කෘතික දේපල පනත ක්‍රියාත්මක කිරීම.
6. පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක මහජනයා වෙත ඉදිරිපත් කිරීම.
7. විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේ දී පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුතු ස්ථානවලට සිදුවන හානිය පිළිබඳ හානි ඇගයුම් සමීක්ෂණ කටයුතු කිරීම.

1.6.4 කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය

හැඳින්වීම

2020/76 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් ‘‘කන්ද උඩරට උරුමය’’ මැයෙන් විෂයක් ව්‍යවස්ථාපිත කරනු ලැබූ අතර එහි විෂය ක්ෂේත්‍රය ලෙස දක්වා ඇත්තේ ‘‘කන්ද උඩරට උරුමය සුරැකීම හා සංවර්ධනය’’ ලෙස ය. ඒ සඳහා, 2017.07.05 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට 2017.08.18 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය නිල වශයෙන් 2018 මාර්තු 02 වන දින ස්ථාපනය කරන ලදී.

දැක්ම

"උරුමය සුරකිමින් සෞභාග්‍ය කරා"

මෙහෙවර

කන්ද උඩරට උරුමයට අනන්‍ය වූ සමාජ ආර්ථික සංස්කෘතික උරුමයන් හඳුනාගැනීම, මතු පරපුර වෙත දායාද කොට දීම සඳහා දායක වීම, යුගයට ගැලපෙන අයුරින් භාවිතය හා යටිතල පහසුකම් සංවර්ධනයෙන් සමාජ ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීමට හැකි වන ලෙස කටයුතු සැලසුම් කිරීම මඟින් තිරසාර සංවර්ධනය සඳහා දායක වීම.

අරමුණු

1. කන්ද උඩරට උරුමය සුරැකීම හා වර්ධනය කිරීමට අදාලව ව්‍යාපෘති හඳුනාගැනීම, සැලසුම් කිරීම, සම්බන්ධීකරණය , ක්‍රියාත්මක කිරීම.
2. ඓතිහාසික ස්ථාන සංරක්ෂණය සහ සංවර්ධනය
3. සාම්ප්‍රදායික උඩරට ග්‍රාමීය ආර්ථිකයට විශාල දායකත්වයක් සපයන ග්‍රාමීය වැව් හා වාරිමාර්ග පද්ධති නඟා සිටුවීම.
4. සාම්ප්‍රදායික පැරණි ගම්මානවල රන්, රිදී, තඹ, පිත්තල හා වානේ කර්මාන්ත සංවර්ධනය සහ වෙළඳපල අවස්ථා පුළුල් කරදීම.
5. සාම්ප්‍රදායික කර්මාන්ත සංරක්ෂණය සහ ප්‍රවර්ධනය.
6. සාම්ප්‍රදායික ගම සංවර්ධනය කිරීම.
7. සාම්ප්‍රදායික කලා ශිල්පවල හා කලාකරුවන්ගේ ප්‍රවර්ධනය හා සුභසාධනය ඇතිකිරීම.

ප්‍රධාන කාර්යයන්

1. කන්ද උඩරට උරුමය අධිකාරි පනත කෙටුම්පත් කිරීම හා පාර්ලිමේන්තුවෙන් අනුමත කර ගැනීම.
2. කන්ද උඩරට උරුමය බල ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම
3. ඓතිහාසික ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සහ සාම්ප්‍රදායික ගම සංවර්ධන කටයුතු උඩරට පවතින විනාශ වී ගිය වෙහෙර විහාර, පන්සල් හා කෝවිල් ප්‍රතිසංස්කරණය
4. පාරම්පරික උඩරට නැටුම් හා ජන කලා ආරක්ෂා කරගැනීම.
5. සාම්ප්‍රදායික පැරණි ගම්මානවල රන්, රිදී, තඹ, පිත්තල හා වානේ කර්මාන්ත සංවර්ධනය හා වෙළඳ පොළ අවස්ථා පුළුල් කරදීම.
6. උඩරට සාම්ප්‍රදායික ඇඳුම් ආයිත්තම් නිෂ්පාදනය, අත්කම් නිෂ්පාදනය ආදියෙහි යෙදෙන කර්මාන්තකරුවන් ආරක්ෂා කරගැනීම හා වෙළඳ පොළ සකසාදීම.
7. ලාක්ෂා කර්මාන්තය, ගෘහ භාණ්ඩ නිෂ්පාදනය, වේ වැල්, පන් හා හණ භාණ්ඩ නිෂ්පාදන ශිල්ප ක්‍රම හා නිෂ්පාදන රැකගැනීම සහ වෙළඳපළ ශක්තිමත් කිරීම.

1.6.5 අපේ ගම

හැඳින්වීම

අපේ ගම ජනඋරුම ප්‍රදර්ශන මධ්‍යස්ථානය කොළඹ දිස්ත්‍රික්කයේ බත්තරමුල්ල, පැලවත්ත ප්‍රදේශයේ නාගරික සංවර්ධන අධිකාරිය සතු අක්කර 13, රූඩ් 03, පර්චස් 25.1 කින් යුක්ත භූමි භාගයක ස්ථාපිත කර ඇත. එය මධ්‍යම සංස්කෘතික අරමුදලේ ව්‍යාපෘතියක් ලෙස ආරම්භයේ සිට පාලනය වූ නමුත් අංක 2187/27 හා 2020.08.09 දිනැති හා අංක 2202/25 හා 2020.11.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයක් මඟින් මෙම අමාත්‍යාංශ විෂය පථයට පවරා අති අතර, 2021. 04.01 දින සිට ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරා ඇති අතර ඉන පසුව 2022.07.22 දිනැති 2289/43 අති විශේෂ ගැසට් පත්‍රය මඟින් නැවත බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙත පවරා ඇත.

දැක්ම
ශ්‍රී ලංකාව තුළ ගුණාත්මක දේශීය නිෂ්පාදන අලෙවියේ ප්‍රමුඛයා වීම

මෙහෙවර
සියලුම ආකාරයේ දේශීය නිෂ්පාදන හා සේවාවල ගුණාත්මක බව රැකෙන අයුරින් අලෙවි කිරීම තුළින් වාණිජ වශයෙන් ශක්‍ය හා සමාජ වගකීමක් ඇති ප්‍රමුඛ ව්‍යාපාරයක් වීම.

අරමුණු

1. අපේ ගම පරිශ්‍රය මුළුමනින් ම හෝ වෙන් වෙන් වශයෙන් කුලියට දීම
2. පුරාණ ගම නැරඹීමට අවස්ථාව ලබාදීම.
3. සාම්ප්‍රදායික දේශීය ආහාරපාන අලෙවි කිරීම
4. සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත නිෂ්පාදන අලෙවි කිරීම
5. දේශීය සංස්කෘතික අංග ඇතුළත් සේවා සැපයීම
6. නැවුම් පරිසරය විඳීමට අවශ්‍ය පහසුකම් ලබාදීම
7. පාරම්පරික ශිල්ප ක්‍රම ප්‍රදර්ශනය කිරීම
8. අධ්‍යාපනික සේවා සැපයීම

1.6.6 ජාතික ප්‍රසාංගික කලා මධ්‍යස්ථානය(නෙළුම් පොකුණ)

හැඳින්වීම

ප්‍රාසාංගික කලාව සබැඳිව, ශ්‍රී ලංකාව වසර 2500ක පමණ ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියයි. විවිධ ස්වරූපයෙන් දක්නට ලැබෙන ප්‍රාසංගික කලාව, ප්‍රදේශය හා ශෛලිය පදනම් කර ගනිමින් සුවිශේෂ වූ ගති ලක්ෂණ විදහා දක්වයි. ඉපැරණි අතීතය මුළුල්ලේම මේ සඳහා රාජකීය අනුග්‍රහය ලැබී ඇත. ප්‍රාසාංගික කලාවේ උන්නතියට රාජ්‍ය අනුග්‍රහය අත්‍යාවශ්‍ය වේ. ශ්‍රී ලංකා රජය ප්‍රාසාංගික කලා රහහල පිහිටුවනු ලබන්නේ වෙසෙසින්ම මෙම අරමුණ පෙරදැරි කරගෙනය. මෙය ශ්‍රී ලංකා කලාකරුවන් වසර ගණනාවක් මුළුල්ලේ දුටු සිහිනයකි. වත්මනෙහි සැබෑ වෙමින් පවතින මෙම සිහිනය ශ්‍රී ලංකා ජනතාවට කලාව සහ සංස්කෘතිය ඇගයීම සඳහා වූ ඉතාමත් උචිත ස්ථානයක් වනු ඇත. මෙම රඟහල විවිධ ජනවාර්ගික කණ්ඩායම් වලට අයත් දේශීය ප්‍රාසාංගික කලාවක් හුවමාරු කර ගනිමින් ජාතික ඒකාබද්ධතාවය ගොඩනගා ගැනීම සඳහා තෝතැන්නක් වන්නේය.

දැක්ම

ශ්‍රී ලාංකීය ප්‍රාසාංගික කලාව ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සියළුම පහසුකම් සැපයීම සඳහා ප්‍රාසාංගික කලා නිර්මාණ කරුවන්ට හා ප්‍රේක්ෂකයන්ට උසස් අන්දමේ ප්‍රාසාංගික කලා අත්දැකීම් ලබා ගැනීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම සඳහා පහසුකම් සැපයීම.

මෙහෙවර

ශ්‍රී ලාංකීය ප්‍රාසාංගික කලා සංකල්පය ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම හා ප්‍රසංග කලා ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා හා එහි නියුතු වූවන්ට අවශ්‍ය සහාය ලබා දීම, ප්‍රසංග කලා ක්ෂේත්‍රයෙහි ප්‍රගමනය සඳහා ජාත්‍යන්තර සහයෝගීතාවන් වර්ධනය කිරීම.

1.6.7 මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය

හැඳින්වීම

ටෙලි සිනමා නිර්මාණ ක්ෂේත්‍රය සඳහා සියලු පහසුකම් වලින් පරිපූර්ණ රූගත කිරීමේ උද්‍යානයක් ලෙස මෙම මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය තිස්සමහාරාම ප්‍රදේශයේ පිහිටි අක්කර 235 ක භූමිභාගයක ඉදිකර ඇත. මෙම ව්‍යාපෘතියේ පළමුවන අදියර 2010 මාර්තු 30 වන දින නිල වශයෙන් විවෘත කරන ලදී. ලංකාවේ කලා ක්ෂේත්‍රය නියෝජනය කරන විවිධ පාර්ශවයන් වෙතින් සිදු කරන ලද ඉල්ලීම් වල ප්‍රතිඵලයක් ලෙස ඉදි කරන ලද මෙම උද්‍යානය සඳහා වන මූලික අරමුදල් සපයා ගන්නා ලද්දේ ලංකාවට විදෙස් රටවල් වලින් ගෙන්වා දෙබස් කවා රූපවාහිනියේ විකාශය කරන ලද ටෙලි නාට්‍ය හා චිත්‍රපට වලින් අයකරන ලද බදු මුදල් තුළින් ආරම්භ කරන ලද අරමුදලක් මගිනි. දේශීය මෙන්ම විදේශීය සිනමා හා ටෙලි නිර්මාණකරුවන් වෙත චිත්‍රාගාර, දර්ශන පසුතල හා නවාතැන් පහසුකම් සැපයීම තුළින්, මෙරට ටෙලි සිනමා කර්මාන්තයේ උන්නතිය සඳහා සිදු කළ යුතු අත්‍යාවශ්‍ය කාර්යයක් ලෙස රජය විසින් මෙය භදුනා ගන්නා ලද අතර, මෙම උද්‍යානය ස්ථාපිත කරන ලද්දේ එම අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම වෙනුවෙනි.

දැක්ම

කලාවෙන් පෝෂිත ජන සමාජයක්

මෙහෙවර

ජනහිතකාමී වූ සංවර්ධනයට නම්‍ය, සකල කලාවන්ගෙන් පෝෂිත සංස්කෘතිය අනාගත පරපුර වෙත දායාද කිරීම.

අරමුණු

1. දේශීය මෙන්ම විදේශීය සිනමා හා ටෙලි සිනමා නිර්මාණකරුවන් වෙත චිත්‍රාගාර, දර්ශන පසුතල හා නවාතැන් ආදී පහසුකම් සැපයීම තුළින් ටෙලි සිනමා කර්මාන්තයේ උන්නතිය සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.
2. දේශීය සහ විදේශීය සංචාරකයින් වෙත ජාතික ටෙලි සිනමා උද්‍යානය නැරඹීමේ ඉඩ ප්‍රස්ථා ලබා දීම මඟින් දැනුම, විනෝදය සහ අත්දැකීම් ලබා දිය හැකි ස්ථානයක් ලෙස කටයුතු කිරීම.
3. ශ්‍රී ලංකාවේ කලාව, සංස්කෘතිය, රංග කලාව, සිනමාව, ටෙලි නිර්මාණ, වාණිජ නිෂ්පාදන සහ රූපවාහිනිය හා සමාජ මාධ්‍ය ඔස්සේ විකාශය කිරීමට අදහස් කරන ඕනෑම ආකාරයක කලා නිෂ්පාදනයක් ප්‍රවර්ධනය කිරීම.
4. ආයතනය විසින් සපයනු ලබන ස්ථාන භාවිතා කරමින් දේශීය හා විදේශීය කලාකරුවන් සහ නිෂ්පාදකයින් විසින් සිදු කරන සිනමා, රංග, ටෙලි නිර්මාණ, වාණිජ නිෂ්පාදන යන ක්ෂේත්‍රවල නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම.

5. කලා හා වාණිජ නිෂ්පාදන කටයුතු සම්බන්ධව පුහුණුව හා අධ්‍යාපනය ලබාදීම අරමුණු කොටගත්, තාක්ෂණය, තාක්ෂණික දැනුම හා විශේෂීයතාව බෙදාහැරීම සඳහා ආයතනයේ පවත්නා සම්පත් යොදා ගනිමින් පහසුකම් සැලසීම.
6. ඉහත දක්වා ඇති අරමුණු ක්‍රියාත්මක කිරීමට සහ සුරක්ෂිත කිරීම සඳහා උද්‍යානය සතු සම්පත් මනා ලෙස නඩත්තු කිරීම සහ කාර්යක්ෂමව භාවිත කිරීම.
7. ඉහත සඳහන් ප්‍රාථමික අරමුණුවලට අමතරව, පවත්නා පහසුකම්, සම්පත් සහ එහි වටපිටාව ආයතනය ප්‍රවර්ධනය සඳහා යොදා ගැනීම සහ එමඟින් දේශීය මෙන්ම විදේශීය වශයෙන් ආදායම් උත්පාදනය කිරීම.

ප්‍රධාන කාර්යයන්

1. දේශීය විදේශීය ටෙලි සිනමා නිර්මාණ සඳහා අවශ්‍ය දර්ශන පසුතල පහසුකම්, ප්‍රමිතිගත නවාතැන් පහසුකම් සහ චිත්‍රාගාර පහසුකම් සැපයීම මගින් ආදායම් උත්පාදනය
2. නරඹන්නන් සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම, අභ්‍යන්තර සංචාරය සඳහා ගොල්ෆ් කාර්ට් රථ පහසුකම් ලබා දීම මගින් ආදායම් උත්පාදනය
3. දේශන ශාලා පහසුකම් සැපයීම.
4. වාණිජ නිෂ්පාදන, පෙර මංගල ඡායාරූප සහ වීඩියෝ සඳහා දර්ශන පසුතල සැපයීම මගින් ආදායම් උත්පාදනය.
5. ආපන ශාලා පහසුකම් සැපයීම.

1.6.8 ටවර් හෝල් රඟහල පදනම

දැක්ම

ශ්‍රී ලංකාවේ ජාතික නාට්‍ය මධ්‍යස්ථානය බවට පත්වෙමින් ගුණාත්මක නාට්‍ය හා රංගකලා සංස්කෘතියක් බිහිකිරීමෙහිලා පුරෝගාමී ආයතනය බවට පත්වීම.

මෙහෙවර

ශ්‍රී ලංකාව තුළ ගුණාත්මක නාට්‍ය හා රංගකලා සංස්කෘතියක් බිහිකිරීමට සහ ප්‍රවර්ධනයට දායකවෙමින් ඒ සඳහා අවශ්‍ය දැනුම යටිතල පහසුකම් සපයමින් නූතන විශ්ව නාට්‍ය හා රංගකලා භාවිතයේ නව අත්දැකීම් තාක්ෂණය සහ ඥානය නොඅඩුව ලබාගැනීමට අවශ්‍ය නව මංපෙත් සකසා දෙමින් නාට්‍ය හා රංග කලා නිර්මාණවේදීන් දිරිගන්වමින් රටේ සංවර්ධනයට මෙන්ම මානව වර්ගයාගේ යහපත සඳහා නිර්මාණකරණයේ යෙදීමට ඔවුන් පෙළඹවීම.

අරමුණු

1. ගුණාත්මක නාට්‍ය හා රංගකලා සංස්කෘතිකයක් බිහිකිරීම සහ ප්‍රවර්ධනයට දායකවීම.
2. සියවසක් සපුරා ඇති ටවර් රඟහල ශ්‍රී ලාංකේය නාට්‍ය කලාවේ ජාතික සළකුණ ලෙසින් සංස්ථාපනය කිරීම.

3. ගෝලීය වශයෙන් ශ්‍රී ලංකාව වැදගත් කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරීමට දායකවීම සඳහා ජාතික නාට්‍ය හා රංගකලා කේෂ්ත්‍රයේ දැනුමේ කේන්ද්‍රස්ථානය බවට පත් වෙමින් නාට්‍ය හා රංගකලා විෂය කේෂ්ත්‍රයේ ප්‍රවර්ධනයට අවශ්‍ය වන්නා වූ න්‍යායාත්මක හා ප්‍රායෝගික ශිල්ප ඥානය පූර්ණ කාලීනව ලබාදෙන අංග සම්පූර්ණ නාට්‍ය හා රංගකලා පාසලක් ස්ථාපිත කර එමගින් එම කේෂ්ත්‍රයේ විශිෂ්ටයන් බිහිකිරීම.
4. අගනුවර මෙන් ම පිටතදීත් නාට්‍ය නරඹන ප්‍රේක්ෂකයන්ට එක හා සමාන රසවින්දනයක් ලැබිය හැකි නූතන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි නවීකරණය වූ රංග ශාලා ජාලයක් රටපුරා ඇති කිරීම.
5. විශිෂ්ට ගණයේ නාට්‍යවේදීන්ට ගුණාත්මක භාවයෙන් යුත් උසස් නාට්‍ය නිෂ්පාදනය හා ප්‍රදර්ශනය සඳහා මූල්‍යමය ආධාර සැපයීම සහ අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.
6. ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික දේශීය ජන නාට්‍ය සම්ප්‍රදායන්හි සංරක්ෂණය කළයුතු නිර්මාණ ආනුෂාංග, ඇඳුම් - පැළඳුම්, උපකරණ, පොත්පත්, සඟරා සහ එම නිර්මාණවේදීන්ගේ තොරතුරු, සිහිවටන, ඔවුන්ගේ නිර්මාණ රැස්කර ඇති තැටි, පටි, විද්‍යුත් මෙන්ම අස්පර්ශ උරුමයන් අනාගත පරපුර සඳහා සුරක්ෂිත කිරීම හා සංරක්ෂණය කිරීම.
7. නාට්‍ය හා රංගකලා කේෂ්ත්‍රයේ ගුණාත්මක ප්‍රවර්ධනය සඳහා තම නිර්මාණ කාර්යයෙන් පුළුල් මෙහෙවරක් කළ ජ්‍යෙෂ්ඨතම නිර්මාණවේදීන් සඳහා වෛද්‍ය රක්ෂණ ක්‍රම ඇති කිරීම සහ වියපත් කළ ඔවුන් රැකබලා ගැනීම සහ ඔවුන් දිරිගැන්වෙන දීමනා ලබාදීම සහ සත්කාර සේවා ඉටුකිරීම.
8. ජාත්‍යන්තර නාට්‍ය ආයතනයේ ශ්‍රී ලාංකේය නියෝජිතයා ලෙසින් එම ආයතනය සමඟ සහ අනෙකුත් රටවල් සමඟ ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වමින්, නාට්‍ය හා රංගකලාවේ නව ප්‍රවණතා මෙන් ම ඒ පිළිබඳ නව තාක්ෂණික දැනුම සහ අත්දැකීම් බෙදාහදා ගැනීමට සහ පර්යේෂණ කාර්යයන් සඳහා අප නිර්මාණවේදීන් පෙළඹවීම.
9. නාට්‍ය හා රංගකලා නිර්මාණවේදීන්ගේ කේන්ද්‍රස්ථානය වශයෙන් ජාතික නාට්‍ය පුස්තකාලයක්, ජාතික නාට්‍ය කෞතුකාගාරයක්, ජාතික නාට්‍ය සංරක්ෂණාගාරයක්, පුහුණුවීම් සහ පර්යේෂණ කිරීමට සහ දැනුම බෙදා හැරීම සඳහා සුදුසුකම් සහිත ජාතික නාට්‍ය මධ්‍යස්ථානයක් ඇති කිරීම.
10. නාට්‍ය හා රංගකලාව සියලු ජන කොටස් වල සුභදතාව සුරැකෙන මෙවලමක් ලෙස භාවිත කරමින්, ඔවුන් ප්‍රඥාසම්පන්න ජනතාවක් ලෙසින් ශ්‍රී ලාංකේය මානව සම්පත් සංවර්ධනයට දායක කර ගැනීම.

පරිච්ඡේදය 02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ජාතික උරුම අංශය විශේෂ ජයග්‍රහණ - 2022 වර්ෂය

2.1 ජාතික උරුම අංශය මගින් ක්‍රියාත්මක කළ වැඩසටහන්.....

ජාතික උරුම අංශයේහි වගකීම වනුයේ "ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම සහ සංස්කෘතිය, සාහිත්‍ය සහ කලාව ඉහළ ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාම සඳහා අදාළ නීති සහ අණ පනත්වලට අනුකූලව සංස්කෘතිය, ජාතික උරුම, ප්‍රාසාංග කලා, ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, ජාතික ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමයි". වැඩසටහන් හා ව්‍යාපෘති කිහිපයක් සෘජුවම ජාතික උරුම අංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ අතර 2022 වර්ෂය සඳහා වෙන් වී තිබූ ඉතාම සීමිත ප්‍රතිපාදනය උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව උපයෝජනය කිරීම සිදු කරන ලදි.

❖ ජාතික උරුම ප්‍රවර්ධනය සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වා දීම මගින් නව ප්‍රබෝධයක්.....

ශ්‍රී ලංකාවේ ස්පෘශ්‍ය හා අස්පෘශ්‍ය (Tangible & Intangible) ජාතික උරුම දේශීය හා විදේශීය ප්‍රජාව වෙත වඩාත් ආකර්ෂණීය හා ඵලදායි ලෙස සන්නිවේදනය කිරීම තුළින් ජාතික උරුම සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂණය හා සංචාරයට මහපෙන්වීම අරමුණු කර ගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය යටතේ,

- ජාතික උරුම ස්ථාන කෙරෙහි දේශීය විදේශීය සංචාරක ආකර්ෂණය වර්ධනය කිරීම උදෙසා 2021 වර්ෂයේ ප්‍රතිපාදන වලින් නිෂ්පාදිත විඩියෝ පට 30 සංචාරකයින් අතර ප්‍රචලිත කිරීම සඳහා පහත ආයතන සමග සම්බන්ධීකරණය සිදු කරමින් පවතී.
  - ❖ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
  - ❖ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය
- එමෙන්ම මෙම වීඩියෝ පට 30 රුසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යලයට ලබා දෙන ලද අතර එම කාර්යාලය විසින් සකස් කරන ලද විධිමත් වැඩ පිළිවෙලක් යටතේ සංචාරක ව්‍යාපාරය නගා සිටුවීම සඳහා මේවන විට භාවිතා කෙරේ.



- ස්පෘශ්‍ය හා අස්පෘශ්‍ය උරුම සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම සඳහා වන ඩිජිටල් යෙදුමට (Digital App) ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය පහත සඳහන් ජාතික උරුම ඇතුළත් වීඩියෝපට 22 ක් 2022 වර්ෂයේ ප්‍රතිපාදන යොදවා නිෂ්පාදනය කරන ලදි.

- ශ්‍රී දළදා මාලිගාව
- පොළොන්නරුව ගල් විහාරය
- පොළොන්නරුව ශිව පිළිමය
- අනුරාධපුර සමාධි බුදු පිළිමය
- සඳකඩපහණ
- කුට්ටම් පොකුණ

- රිටිගල
- දඹුලු විහාරය
- කැළණිය
- ඇම්බැක්ක දේවාලය
- ත්‍රිකුණාමලය කෝනේශවරම් දේවාලය
- මිහින්තලය
- කලා වැව
- සෝමාවතී චෛත්‍ය
- ගාලු කොටුව
- නාමල් උයන
- කතළුව පූර්වාරාමය
- ඉසුරුමුණිය
- සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය
- යාපහුව
- සිතුල්පව්ව
- බිතුසිතුවම් කෞතුකාගාරය
- ජාතික උරුම අනුරූ මධ්‍යස්ථාන

මේ ව්‍යාපෘතිය සඳහා රූ.මී.5.5 ක මුදලක් වැය කර ඇත.

❖ කලාකරුවන්ගේ දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම .....

මෙරට වෙසෙන සියලුම ක්ෂේත්‍ර වලට අයත් කලාකරුවන් හා ශිල්පීන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් නොතිබීම කලා ක්ෂේත්‍රය තුළ ඇති බරපතල අඩුවක් ලෙස හඳුනාගෙන ඇත. මෙම අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා අප අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යොදවා මේ වන විට කලාකරු දත්ත පද්ධතිය ස්ථාපනය කර ඇත. කලාකරු දත්ත පද්ධතිය සඳහා මාර්ගගත(Online) ක්‍රමයට කලාකරුවන් ලියාපදිංචි කිරීමට සැකසූ දැන්වීම් පත්‍රිකාව අමාත්‍යාංශ නිල වෙබ් අඩවියෙහි සහ නිල facebook පිටුවෙහි පලකරන ලදි. එම දැන්වීම් පත්‍රිකාව මුද්‍රණය කර, සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල, වෙනත් රාජ්‍ය ආයතන, සංස්කෘතික මධ්‍යස්ථාන, කලායතන හා තෝරාගනු ලබන ග්‍රාම නිලධාරී කාර්යාලවල දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මුදල් දිවයිනේ සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිදහස් කරන ලදි. ඒ අනුව කලාකරුවන් 3500 අධික ප්‍රමාණයක් මාර්ගගත ක්‍රමයට (online) ලියාපදිංචි කිරීමේ කටයුතු මේ වන විට සිදු කර ඇත.

මෙම ව්‍යාපෘතිය සඳහා රූ.මී.1 ක මුදලක් වැය වුණි.







❖ කලාකරුවන් සඳහා Digital App නිර්මාණය කිරීම.....

කලාකරු දත්ත පද්ධතියට සමගාමීව කලාකරුවන් සඳහාම විශේෂ වූ ජංගම යෙදුමක් (Mobile App) ද නිර්මාණය කර ඇත. එමගින් කලාකරුවන්ගේ කලා නිර්මාණ ප්‍රචාරණය කර ගැනීම සහ වෙළඳපොළ අවකාශය පුළුල් කර ගැනීම අපේක්ෂා කෙරේ. මෙම ජංගම යෙදුම සඳහා ප්‍රවේශ විය හැක්කේ දත්ත පද්ධතියේ ලියාපදිංචි වන කලාකරුවන් සඳහා පමණි. එම නිසා රට පුරා විසිරී සිටින සියලුම කලාකරුවන් මෙම දත්ත පද්ධතිය තුළ ලියාපදිංචි කිරීම ජාතික වැඩසටහනක් මෙන්ම එම කලාකරුවන්ට ද පෞද්ගලිකවම ප්‍රතිලාභ ගෙනදෙන වැඩසටහනක් ද වේ. මෙහි ලියාපදිංචි වන කලාකරුවන්ට ඉදිරියේදී ඩිජිටල් හැඳුනුම්පතක් නිකුත් කිරීමට සහ එමගින් විවිධ සුභසාධන පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට ද අපේක්ෂිතය.





❖ ආදිවාසී/ සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාව සංරක්ෂණ සේවාවන් පැවැත්වීම.....

ශ්‍රී ලංකාවේ ජීවත්වෙන ආදිවාසී/ විශේෂ අනන්‍යතාවන් සහිත ජන කණ්ඩායම් කෙරෙහි අත්හල නොහැකි වගකීම් හා යුතුකම් ඉටුකිරීමට ඇති වග අප වටහා ගෙන ඇත. ඒ අනුව ඔවුන්ගේ අනන්‍යතාව රැක ගැනීම සඳහා සුවිශේෂී වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.

1. ආදිවාසීන් වෙනුවෙන් උරුමයන් ආරක්ෂා කර ගැනීම අත්‍යාවශ්‍ය සාධකයක් බැවින් ජාතික උරුම අංශය තුළ සුවිශේෂී අනන්‍යතා සහිත ප්‍රජාවන්ගේ උරුම සංරක්ෂණ ඒකකයක් පිහිටුවන ලදී.
2. ආදිවාසී ප්‍රජා සංරක්ෂණ කටයුතු සේවාවන් සඳහා දළුකාන ආදිවාසි ගම්මානයේ ක්ෂේත්‍ර අධ්‍යන චාරිකාවක් මගින් අධ්‍යාත්මික වැඩසටහන් පැවැත්වීම සහ පාසල් ළමුන් සඳහා පාසල් උපකරණ ලබා දීම කටයුතු කරන ලදී.
3. ලෝක ආදිවාසී දිනය සැමරිම සහ වාර්ෂික හැත්ම ශාන්ති පැවැත් වීම.
4. පාහියන්ගල මානව ඇටසැකිලි සංරක්ෂණයට අදාළ විශේෂ යන්ත්‍රයක් ජර්මනියෙන් ලබා ගැනීම සඳහා කෞතුකාගාර දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ විෂය ප්‍රවීණයින් සමග කටයුතු සිදු කළද විදේශ විනිමය

ගැටළුව මත එම විලදී ගැනීම තාවකාලිකව නතර කරන ලදි. එම කාර්යය 2023 වර්ශයේදී සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය.





මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි.5.5ක ප්‍රතිපාදන වෙන් වූ අතර ආදිවාසි හා සුවිශේෂි අනන්‍යතාවයකින් යුත් ප්‍රජාවන්ගේ අයිතීන් සුරැකීම හා තෘප්තිමත් ජන කොටසක් බවට පත් වීම මෙහි මූලික අරමුණ විය.

❖ කලාකරුවන් සඳහා වන හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක්....

මෙරට කලා ක්ෂේත්‍රය නියෝජනය කරනු ලබන බොහෝ කලාකරුවන්ට ස්ථීර ආදායම් මාර්ගයක් නොමැති අතර බොහෝ කලාකරුවන් ජීවිකාව පවත්වා ගනු ලබන්නේ ඉතා අසීරු ලෙස ය. නමුත් ඇතැම් කලාකරුවන් දීර්ඝ කාලීනව යම් ක්ෂේත්‍රයක නියැලීමෙන් වන ජීවිත අනාරක්ෂිත බව සැලකිල්ලට නොගෙන වුව ද කලාව උදෙසා සුවිශාල කාර්යය භාර්යයක් ඉටු කරන අවස්ථා ඉමහත්ය. එවන් වාතාවරණයක් තුළ ඇතැම් කලාකරුවන් හා ශිල්පීන් කලාව කෙරෙහි දක්වන උනන්දුව අවම වීම කලා ක්ෂේත්‍රයට වන විශාල පාඩුවකි. ඒ මන්ද යත් මෙරට සංස්කෘතිය හා කලාව අතර පවතින අන්‍යෝන්‍ය සබඳතාවය සඳහා එය සෘජුවම බලපානු ලැබේ.

එවන් කාලවකවානුවක කලාකරුවන් උදෙසා හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම අවශ්‍යතාවයත්ව පවතී. මෙරට සමස්ථ ජනතාවගෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශවල සේවයේ නියැලෙන සේවකයන් සඳහා රක්ෂණ ක්‍රමයන් හඳුන්වා දී ඇති නමුත් කලාකරුවන් සඳහා ම වෙන් වූ රක්ෂණ ක්‍රමයක් මේ වනතෙක්ම හඳුන්වා දී නොමැත. ඒ හේතුවෙන් කලාකරුවන් සඳහා හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම 2021 වර්ෂයේ දී ආරම්භ විය. ඒ අනුව දිස්ත්‍රික් මට්ටමින් තෝරාගත් ග්‍රාමීය කලාකරුවන් 550 ක් සඳහා රක්ෂණාවරණය පිරිනැමීම සිදු විය. එසේම 2022 වර්ෂයේ දී ප්‍රතිලාභ ලබා දීම ආරම්භ වූ අතර මේ වන විට සමස්ථ ප්‍රතිලාභීන්ගෙන් 41 දෙනෙකු සඳහා රු.3437439.43ක මුදලක් ගෙවීම් කර ඇත.




❖ ගාලු උරුමය පදනම

ගාලු උරුමය පදනම විසින් සම්බන්ධීකරණ සහය ලබා දී ඇති ඇතැම් විශේෂ ව්‍යාපෘති පහත පරිදි වෙයි.

1. නෙදර්ලන්ත ආධාර යටතේ ගාල්ල කොටුවේ පැරණි නිවාස 55 ක් සංරක්ෂණය කිරීම.
2. පැරණි ඝණ්ඨා කුළුණ සංරක්ෂණය කිරීම.
3. පැරණි ඔරලෝසු කණුව සංරක්ෂණය කිරීම.
4. පැරණි අඟුරු ගබඩාවක් සංරක්ෂණය කර තොරතුරු මධ්‍යස්ථානයක් බවට පත් කිරීම.
5. පැරණි යුධ කාමරයක් සංරක්ෂණය කර කෞතුකාගාරයක් බවට පත් කිරීම.
6. ගාල්ල කොටුවේ වැසිකිළි පද්ධති දෙකක් ඉදි කිරීම.
7. ගාල්ල කොටුවේ පොදු වෙරළ තීරයට මහජන පහසුකම් සැලසීම.
8. පැරණි වෙඩි බෙහෙත් ඇඹරුම්හල ගොඩනැගිල්ල සංරක්ෂණය කර කාර්යාල පරිශ්‍රය ස්ථාපනය කිරීම.
9. පැරණි පොලිස් නිළ නිවාස ගොඩනැගිල්ල සංරක්ෂණය කර වාණිජ භාවිතාව සඳහා යෙදවීම (2022).
10. ක්ලිපර්න්බරග් යුධ කාමර සංරක්ෂණය කර වාණිජ භාවිතාව සඳහා යෙදවීම.
11. ගාල්ල කොටුවේ පැරණි වීදි පහන් පද්ධතිය අළුත් වැඩියා කිරීම
12. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගාල්ල කොටුවේ කැට ගල් අල්ලා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට සහාය වීම
13. ලෝක බැංකු ආධාර ව්‍යාපෘතිය යටතේ කොටු බැම්ම සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතියට සහාය ලබා දීම.





❖ කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය



1. ඌව පරණගම, කොරදේකුඹුර ගම්මානය අංගම්පොර සටන් කලාව සංරක්ෂිත ගම්මානයක් ලෙස වැඩිදියුණු කිරීම හා අංගම්පොර සටන් කලාව ප්‍රවර්ධනය කිරීම.
2. ශ්‍රී සංඝබෝධි පිරිවෙන,ධම්මසිද්ධ්‍යාරාමය, පුරිජ්ජල, මාතලේ, පිරිවෙනෙහි ඉපැරණි පුස්කොළ පොත් සංරක්ෂණය කිරීම සඳහා පුස්තකාල පහසුකම් සැපයීම (උකුවෙල)



3. මිණිපේ උඩගලදෙබොක්ක පාරම්පරික ගම්මානය ගෙවතු වගා වැඩසටහන සහ මිණිපේ උඩගලදෙබොක්ක පාරම්පරික ගම්මානය විදුලි පඹයා උපකරණ සැපයීම.
4. කොත්මලේ ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ ඓතිහාසික කෞතුක භාණ්ඩ සංරක්ෂිත කෞතුකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම.



5. හාලිඇල සාම්ප්‍රධායික බට කර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන
6. පදියතලාව පදියදොර ශ්‍රී මහබෝධිය විහාරයේ වැට ප්‍රතිසංස්කරණය කිරීම-වළාකුළු බැම්ම.
7. මිණිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බුලත්වැල්කඳුර සහල්, කුරක්කන් ඇතුළු ධාන්‍ය පිටි නිෂ්පාදන ගම්මානය - ධාන්‍ය විජලන යන්ත්‍රයක් ලබා දීම.
8. කෙවුල්ගම ශ්‍රී දළදාගමන් රජමහවිහාරයේ ධර්මශාලාව ප්‍රතිසංස්කරණය කිරීම.

❖ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

1. ගවේෂණ හා ලේඛනගත කිරීම්

පුරාවිද්‍යා ස්ථානවල මායිම් හඳුනා ගැනීම හා නිරවුල් කිරීම, ආරක්ෂිත ස්මාරක සහ රක්ෂිත ප්‍රකාශයට පත් කිරීම, ශාස්ත්‍රීය ගවේෂණ ස්ථාන පරීක්ෂාව, ඛනිජ නිස්සාරණ ව්‍යාපෘති ස්ථාන පරීක්ෂාව, පුරාවිද්‍යා හානි ඇගයීම් ස්ථාන පරීක්ෂාව, පුරාවස්තු විනාශය වැලැක්වීම, චංචල පුරාවස්තු ලේඛනගත කිරීම, GIS අන්තර්ජාල බිහිදොර යාවත්කාලීන කිරීම හා තොරතුරු එක්රැස් කිරීම, පුරාවිද්‍යා ස්ථාන නාමාවලිය සඳහා තොරතුරු රැස් කිරීම හා වාර්තා මුද්‍රණය ඇතුළත්ව ගවේෂණ ව්‍යාපෘති 28 ක් භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වූ අතර වැඩ අවසන් ව්‍යාපෘති ගණන 27 ක් විය. එසේම බාහිර ප්‍රතිපාදන යටතේ ද ක්ෂේත්‍ර ගවේෂණ හා පුරාවිද්‍යා බලපෑම් ඇගයීම් ව්‍යාපෘති 17 ක් ක්‍රියාත්මක කරන ලදි.



ගනේතැන්න පුරාන විහාරය



ලත්පදුර පැරණිලෙන පරීක්ෂා

2. කැණීම්

දීඝවාපී ස්තූප මළුව කැණීම, මිහින්තලේ අනුලා දේවි ස්තූපය කැණීම, කවුඩාගල දාගැබ ගොඩැල්ල කැණීම, අම්පාර සමන්ගල ස්තූප කැණීම හා ගිරිබාව පබුළුගල පුරාණ විදුරු තාක්ෂනය පිළිබඳ පර්යේෂණ කැණීම අතුළුව කැණීම් ව්‍යාපෘති 5 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක විය.





3. කෞතුකාගාර

කෞතුකාගාර අධීක්ෂණය හා ස්ථාන පරීක්ෂාව, කෞතුක භාණ්ඩ පිරි සංරක්ෂණය, ප්‍රදර්ශනයේ අඩුපාඩු සැකසීම හා කෞතුකාගාර ප්‍රදර්ශන ප්‍රවර්ධන වැඩසටහන් ඇතුළත් ව්‍යාපෘති 19 ක් වර්ෂය තුළ සිදු කරන ලද අතර, ඉන් ව්‍යාපෘති 14 ක වැඩ අවසන් කර ඇත.





4. නඩත්තු

පළාත් තුළ ඇති පුරාවිද්‍යා ස්ථාන කලාප මට්ටමින් (කලාප 96) දෙනිකව නඩත්තුකර පවත්වා ගෙන යාම, මාර්ග ප්‍රවේශ සැකසීම, රක්ෂිත පුවරු හා දිශානති පුවරු යෙදීම, මායිම් කණු යෙදීම, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා ගොඩනැගිලි නඩත්තු කිරීම ආදී නඩත්තු ව්‍යාපෘති 70 ක් පමණ භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ සිදු කරන ලද අතර, වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති ගණන 44 ක් විය. අඛණ්ඩව වාර්ෂිකව සිදු කරනු ලබන කන්නියා උණු වතුර පරිශ්‍රය නඩත්තු කිරීමේ කටයුතු ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අධීක්ෂණය යටතේ සිදු විය.

5. අභිලේඛන හා නාණක විද්‍යා

ශීලාලේඛන පිටපත් කිරීම, කාසි සුචිගත කිරීම, අභිලේඛන පර්යේෂණ සංග්‍රහ කෘතියේ කටයුතු ඇතුළත්ව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 3 හි 100% භෞතික ප්‍රගතියක් අත් කර ගෙන ඇත.



6. වාස්තු විද්‍යා හා රසායන සංරක්ෂණ

රිටිගල පුරාවිද්‍යා ස්ථානයේ බන්දා පොකුණ සංරක්ෂණය ඇතුළුව වාස්තු විද්‍යා සංරක්ෂණ ව්‍යාපෘති 33 ක් හා රසායන සංරක්ෂණ ව්‍යාපාති 34 ක් භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ සිදු කරන ලද අතර. වාස්තු විද්‍යා සංරක්ෂණ ව්‍යාපෘති 15 ක් හා රසායන සංරක්ෂණ ව්‍යාපෘති 19 ක වැඩ වර්ෂය තුළදී අවසන් කරන ලදි. එසේම බාහිර ප්‍රතිපාන යටතේ ද සංරක්ෂණ ව්‍යාපෘති 06 ක් ක්‍රියාවට නංවා ඇත.





❖ අපේ ගම

1. අපේ ගම පරිශ්‍රයේ පිහිටි මහවලව්ව ගොඩනැගිල්ලේ විදුලි පද්ධතිය ස්ථාපිත කිරීම
2. අපේ ගම පරිශ්‍රයේ පිහිටි රංග ශාලාවේ විදුලි පද්ධතිය ස්ථාපිත කිරීම
3. වෙළඳ කුටි 03කින් සමන්විත (වර්ග අඩි 450) වෙළඳ කුටි නවීකරණය කිරීම (වෙළඳ කුටි 06ක් සඳහා)
4. වෙළඳ කුටියක් හා කාමරයක් සහිත වර්ග අඩි 600 වෙළඳ කුටි 02ක් නවීකරණය කිරීම
5. නාමපුවරුව නවීකරණය කර ප්‍රතිසංස්කරණය කිරීම
6. අපේ ගම පරිශ්‍රයේ පිහිටි මහවලව්ව ගොඩනැගිල්ලේ වහලයේ වඩිම්බු ලෑලි, වැහිපීලි හා ජලබස්නා නල සවි කිරීම.









❖ **මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය**

ආයතනය මෙම අමාත්‍යාංශයේ විෂය පථයට පැවරෙන අවස්ථාව වන විට දිගු කලක් තිස්සේ නිසි ලෙස නඩත්තු හා ප්‍රතිසංස්කරණ කටයුතු සිදු නොකිරීම හේතුවෙන් විශාල වශයෙන් අබලන් තත්වයකට පත්ව කිසිදු රූගත කිරීමක් කළ නොහැකි මට්ටමට පත්ව තිබුණි. නමුත් මෙම අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් අනුමත කරවා ගන්නා ලද රු. මි. 350 ක ප්‍රතිපාදන වලින් රු.මි. 50ක් 2021 වර්ෂයේ ද රු. මි. 24 ක් 2022 වර්ෂයේ දී අයවැය මගින් ආයතනයට ලැබුණු අතර එම රුපියල් මිලියන 74 ක ප්‍රතිපාදන භෞතිකව හා මූල්‍යමය වශයෙන් සියයට සියයක්ම උපයෝජන කර මේ වන විට නැවත ටෙලි සිනමා නිර්මාණ රූගත කිරීමට සුදුසු

තත්වයට පත් කර ඇත. එම රු.මි. 74 ක ප්‍රතිපාදන මගින් සිදු කරන ලද සංවර්ධන කාර්යයන් පහත පරිදි වේ.

1. සම්පූර්ණයෙන්ම අබලන්ව තිබූ සාම්ප්‍රදායික ගම්මානයේ දර්ශන පසුතල නැවත ඉදි කිරීම. (ගැමි ගෙවල් 05 ක්, මහ වලව්ව සහ ආරච්චිල වලව්ව)
2. විනාශයට පත් වෙමින් තිබූ නගර ප්‍රදේශයේ අර්ධ ස්ථීර ගොඩනැගිලි ස්ථීර ගොඩනැගිලි ලෙස නවීකරණය කිරීම. (නිපෝන් හෝටලය, බැංකු ගොඩනැගිල්ල සහ කාර්ගිල්ස් ගොඩනැගිල්ලේ ආකෘතිය)
3. සම්පූර්ණයෙන්ම හම්බු වලින් වැසී තිබූ ජම්බුගස්වැව ප්‍රතිසංස්කරණය කිරීම.
4. චිත්‍රාගාර ගොඩනැගිල්ල තුළ අබලන්ව තිබූ හරිත තිරය ඉවත් කර ඒ වෙනුවට අඩි 132 ක දිගින් හා අඩි 17 ක උසකින් යුතු දකුණු ආසියානු කලාපයේ ඇති සුවිශාලතම හරිත බිත්තිය (Green Wall) ඉදිකිරීම (මෙම හරිත බිත්තිය යොදා ගනිමින් ඔනෑම මට්ටමක ගෘහස්ථ රූගත කිරීමක් සිදු කළ හැකිය.
5. නරඹන්නන්ගේ සහ රූගත කිරීම් සඳහා පැමිණෙන නිර්මාණ ශිල්පීන් වෙනුවෙන් මනා තත්වයේ සනීපාරක්ෂක වැසිකිළි පද්ධතියක් නිර්මාණය කිරීම.
6. උද්‍යානය වෙනුවෙන් වෙබ් https://www.ranmihithanna.gov.lk/වෙබ් අඩවිය නිර්මාණය කිරීම.

මෙම අලුත්වැඩියා කටයුතු සිදු කෙරෙමින් පවතිද්දී පවා 2022 වර්ෂය තුළදී රුපියල් මිලියන 09.05 කට ආසන්න ආදායමක් උපයා ගැනීමට ආයතනයට හැකි විය.







❖ ටවර් හෝල් රඟහල පදනම

1. නිර්මාණවේදී ඇගයුම් උත්සවය හා නාඩගම් ගී ඇතුළත් සී.ඩී. තැටිය එළිදැක්වීම.
2. දෙමළ නාට්‍ය හා රංගකලා පාසල පැවැත්වීම
3. සාම්ප්‍රදායික සිංහල නර්තනය පිළිබඳ වැඩමුළුව (උඩරට නර්තනය)
4. පැරණි ගී ප්‍රසංග පැවැත්වීම
5. ලෝක නාට්‍ය දින සැමරුම් උත්සවය
6. වියපත් ටවර් ශිල්පීන් සඳහා අලුත් අවුරුදු තිළිණ ප්‍රදානය
7. ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය
8. ටවර් ප්‍රභාෂ්වර ප්‍රසංගය පැවැත්වීම
9. දෙමළ නිර්මාණවේදී ඇගයුම් උත්සවය හා සරස්වතී පූජාව









❖ **ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය**

නර්තනය, සංගීතය යන සෞන්දර්ය පාඨමාලා සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සහ ජාතික ආධුනිකත්ව පුහුණු අධිකාරියේ අනුමැතියෙන් ජාතික නිපුණතා 4, 5 සහ 6 මට්ටම් ලබා ගැනීම ඔවුන් ලද විශේෂ ජයග්‍රහණයකි.

2.2 අභියෝග හා ඉදිරි ඉලක්ක

ජාතික උරුම ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘතිය/ වැඩසටහන	ආරම්භකළ/ යෝජිත දිනය	අපේක්ෂිත ප්‍රතිලාභ		ප්‍රතිලාභ ලැබෙන කාල වකවානුව
		ප්‍රමාණාත්මක	ගුණාත්මක	
1.ජාතික උරුම සංරක්ෂණය හා ප්‍රවර්ධනය සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වා දීම. **101 -2-09-15- 2509**	2023 වර්ෂය සඳහා	නිෂ්පාදනය කරන ලද ජාතික උරුම සංරක්ෂණ වීඩියෝ පට (15)	විද්‍යුත් මාධ්‍ය හා සමාජ මාධ්‍ය මගින් ජාතික උරුම සංරක්ෂණ වීඩියෝ ව්‍යාප්ත වීමෙන් ජාතික උරුම ඩිජිටල් මාධ්‍ය භාවිතයෙන් සංරක්ෂණය වීම හා තරුණ පරපුර අතර ප්‍රචලිත වීම	දිගුකාලීන
2. දැයේ උරුමය දරුවන්ටයි වැඩසටහන - සංස්කෘතික විද්‍යාගාරය **101-2-09-011-2401**	2023 වර්ෂය සඳහා	පළාත් මට්ටමෙන් නිර්මාණය කරන ලද සංස්කෘතික විද්‍යාගාර 09	ශ්‍රී ලාංකීය දරු පරපුරු සාම්ප්‍රදායික අගයන් පිළිබඳව දැනුවත් වීම සහ ඒම සම්ප්‍රදායන් අඛණ්ඩව පවත්වාගෙන යාමට පෙළඹීම	දිගුකාලීන
3. දැයේ උරුමය දරුවන්ටයි වැඩසටහන - කලා සංස්කෘතික කඳවුරු **101-2-09-021-1409**	2023 සඳහා ප්‍රතිපාදන	පළාත් මට්ටමෙන් කලා සංස්කෘතික කඳවුරු *09* ක් පැවැත්වීම	ශ්‍රී ලාංකීය දරු පරපුරු සාම්ප්‍රදායික අගයන් පිළිබඳව දැනුවත් වීම සහ ඒම සම්ප්‍රදායන් අඛණ්ඩව පවත්වාගෙන යාමට සමත් සංස්කෘතික මිනිසෙකු බිහිවීම	දිගුකාලීන
4. ආදිවාසී/ සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාව සංරක්ෂණ සේවාවන් පැවැත්වීම **101-2-09-020-1409**	2023 සඳහා ප්‍රතිපාදන	ලෝක ආදිවාසී දින සැමරුම, දඹාන/ හෙනානිගල හැක්ම ශාන්ති කර්ම වැඩසටහන් අවසන් කර තිබීම. දළුකාන ආදිවාසී ගම්මානයේ සමාජ සජීවිකරණ වැඩසටහන සම්පූර්ණ කර තිබීම.	ආදිවාසී හා සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාවන්ගේ අයිතීන් සුරැකීම හා තෘප්තිමත් ජන කොටසක් බවට පත් වීම. ආදිවාසී ප්‍රජාව තම අනන්‍යතාවයන් සුරකිමින් නව සමාජ තත්වයන්ට අනුගත වීම	දිගුකාලීන
5. ගාල්ල කොටුව පල්ලිය වීදියේ පැරණි පොලිස් නිල නිවාස ගොඩනැගිල්ල	2023 සඳහා ප්‍රතිපාදන	ආයතනික කටයුතු පවත්වාගෙන යාමට අත්‍යාවශ්‍ය කාර්යාලීය	කාර්ය මණ්ඩලය ඵලදායීව හා කාර්යක්ෂමව තම	දිගුකාලීන

ව්‍යාපෘතිය/ වැඩසටහන	ආරම්භකළ/ යෝජිත දිනය	අපේක්ෂිත ප්‍රතිලාභ		ප්‍රතිලාභ ලැබෙන කාල වකවානුව
		ප්‍රමාණාත්මක	ගුණාත්මක	
සංරක්ෂණය කිරීම **101-2-09-004-2201/2202**		ලිපිද්‍රව්‍ය, මෝටර් රථය සඳහා ඉන්ධන ලබා ගැනීම සඳහා ගෙවීම් කිරීම සහ කළමනාකරණ මණ්ඩල සංග්‍රහ දීමනා ආදී වෙනත් වියදම් ගෙවීම	කටයුතුවල නිරත වීම	
ඓතිහාසික ස්ථාන සංරක්ෂණය සහ සංවර්ධනය	2023 සඳහා ප්‍රතිපාදන	සංරක්ෂණය සහ සංවර්ධනය කරන ලද පෞරාණික සිද්ධස්ථාන		දිගුකාලීන
සාම්ප්‍රදායික ගම සංවර්ධන වැඩසටහන (ආධ්‍යාත්මික , සංස්කෘතික, සමාජීය හා ආර්ථික සංවර්ධනය)	2023 සඳහා ප්‍රතිපාදන	සංවර්ධිත සාම්ප්‍රදායික ගම		දිගුකාලීන
සාම්ප්‍රදායික කලා ශිල්ප ප්‍රවර්ධනය හා දේශීය කර්මාන්ත පුහුණු වැඩසටහන	2023 සඳහා ප්‍රතිපාදන	සහභාගි වන පුද්ගලයන් සංඛ්‍යාව/ පැවැත්වූ වැඩසටහන්සංඛ්‍යාව		දිගුකාලීන
සාම්ප්‍රදායික කර්මාන්ත සංරක්ෂණය , ප්‍රවර්ධනය හා සංවර්ධනය	2023 සඳහා ප්‍රතිපාදන	සාම්ප්‍රදායික කලා ශිල්ප ප්‍රවර්ධනය වීම		දිගුකාලීන
මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය සංවර්ධන කටයුතු, ප්‍රතිසංස්කරණ කිරීම.	2023 සඳහා ප්‍රතිපාදන	ප්‍රතිසංස්කරණය කරන ලද වේෂ නිරූපණ ගොඩනැගිල්ල, ගාලු වෙළඳ පොළ , ප්‍රධාන වීදියේ ගොඩනැගිලි (නගර ප්‍රදේශයේ ප්‍රධාන හන්දිය) , සහ බොම්බෙ වෙල්වට්ටි සමාජ ශාලාව	(අ)ටෙලි සිනමා ක්ෂේත්‍රයට වැඩි දියුණු කළ දර්ශන පසුතල හිමි වේ, (ආ)පාරිභෝගිකයින් තෘප්තිමත් වේ. (ඇ) ඉහළ ගුණාත්මකබවකින් යුතු ටෙලි සිනමා නිර්මාණ බිහි වේ.	දිගුකාලීන
අපේ ගම පරිශ්‍රයේ ප්‍රතිසංස්කරණ කටයුතු, වෙළඳ කුටි අලුත්වැඩියා කිරීම හා අලෙවිය හා ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම.	2023 සඳහා ප්‍රතිපාදන	නවීකරණය කරන ලද ගොඩනැඟිලි හා උපකරණ	පාරිභෝගිකයින්ගේ ආකර්ශනය වැඩිවීම මඟින් ආදායම වැඩිවීම	දිගුකාලීන
ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රයේ නවීකරණය කිරීම, භාණ්ඩ මිල දී ගැනීම හා ඉදිකිරීම.	2023 සඳහා ප්‍රතිපාදන	නවීකරණය වූ ගොඩනැඟිල්ල. කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ලබාගැනීමට හැකිවීම	ආයතනය සතු රංගවස්ත්‍රාභරණ,භාණ්ඩ ,උපකරණ වල සුරක්ෂිතභාවය. ඉහළ ගුණාත්මක භාවයෙන් සපිරි ආරක්ෂක සේවාවක් ලබාගැනීම.	දිගුකාලීන

ඉදිරි දැක්ම

ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම සහ සංස්කෘතිය, සාහිත්‍ය සහ කලාව ඉහල ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාම සඳහා අදාළ නීති සහ අණ පනත්වලට අනුකූලව සංස්කෘතිය, ජාතික උරුම, ප්‍රාසාංග කලා, ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහය වීම, ජාතික අයවැය, ජාතික ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පරිපාලන වගකීම පවරා ඇති දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම ජාතික උරුම, ප්‍රාසාංග කලා අංශය වෙත පවරා ඇත.

ඒ තුළ ක්‍රියාත්මක කල යුතු ව්‍යාපෘති හඳුනා ගෙන ඉහත ඉලක්ක සපුරා ගැනීම අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණ වේ. එක් එක් ප්‍රමුඛතාවය වෙන වෙනම ආවරණය වන පරිදි හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළ රටක පෞඩත්වය සහ අනන්‍යතාවය කියාපාන ජාතික උරුමයන් සුරැකිව සංරක්ෂණය කර අනාගත පරපුර සඳහා උරුම කර දීම මෙන්ම උසස් කලා නිර්මාණ බිහි කිරීමට කලාකරුවන්ට අවශ්‍ය පහසුකම් සලසා දීම තුළින් පුරවැසියන්ගේ රසවින්දන අවස්ථා වැඩි දියුණු කිරීම හා ඒ තුළින් කලාකරුවා ප්‍රවර්ධනය කිරීම සඳහා අපගේ ගමන් මඟ සකස් වී ඇත.

ශ්‍රී ලංකාවේ ස්පෘශ්‍ය හා අස්පෘශ්‍ය (Tangible & Intangible) ජාතික උරුම දේශීය හා විදේශීය ප්‍රජාව වෙත වඩාත් ආකර්ෂණීය හා ඵලදායි ලෙස සන්නිවේදනය කිරීම තුළින් ජාතික උරුම සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂණය හා සංචාරයට මගපෙන්වීම අරමුණු කර ගනිමින් නවීන තාක්ෂණික ක්‍රම ප්‍රායෝගිකව යොදා ගෙන එම තාක්ෂණය හරහාම මෙම ක්ෂේත්‍රය පිළිබඳව උනන්දුවක් සහ අවබෝධයක් ඇති කිරීම උදෙසා ඩිජිටල් යෙදුම නිර්මාණය කිරීම හා ප්‍රචාරනය කිරීම අරමුණු කර ඇත.

ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින සියලුම අංශවල කලාකරුවන්ගේ විස්තර ඇතුළත් කලාකරු දත්ත පද්ධතියක් සකස් කිරීම හා යාවත්කාලීන කිරීමද අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත විශේෂ ව්‍යාපෘතියකි. සංචාරක අමාත්‍යාංශය හා ඒකාබද්ධව සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රසංග හා අනෙකුත් කලා කටයුතු සඳහා කලාකරුවන් සම්බන්ධකර ගැනීම එම දත්ත පද්ධතිය හරහා සිදුකිරීමට යෝජිතය. මේ තුළින් කලාකරුවාගේ වෘත්තීය සුරක්ෂිතභාවය තහවුරු කිරීම අපේක්ෂා කරනු ලැබේ.

කලාකරු දත්ත පද්ධතියට සමගාමීව කලාකරුවන් සඳහාම විශේෂ වූ ජංගම යෙදුමක් (Mobile App) ද නිර්මාණය කර ඇත. එමගින් කලාකරුවන්ගේ කලා නිර්මාණ ප්‍රචාරණය කර ගැනීම සහ වෙළඳපොළ අවකාශය පුළුල් කර ගැනීම අපේක්ෂා කෙරේ. මෙම ජංගම යෙදුම සඳහා ප්‍රවේශ විය හැක්කේ දත්ත පද්ධතියේ ලියාපදිංචි වන කලාකරුවන් සඳහා පමණි. එම නිසා රට පුරා විසිරී සිටින සියලුම කලාකරුවන් මෙම දත්ත පද්ධතිය තුළ ලියාපදිංචි කිරීම ජාතික වැඩසටහනක් මෙන්ම එම කලාකරුවන්ට ද පෞද්ගලිකවම ප්‍රතිලාභ ගෙනදෙන වැඩසටහනක් ද වේ. මෙහි ලියාපදිංචි වන කලාකරුවන්ට ඉදිරියේදී ඩිජිටල් හැඳුනුම්පතක් නිකුත් කිරීමට සහ එමගින් විවිධ සුභසාධන පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට ද අපේක්ෂිතය.

ශ්‍රී ලංකාව තුළ ජීවත් වන ආදිවාසී හා වෙනත් සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාවන් ඉදිරියට පවත්වාගෙන යාම හා ඔවුන් සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළ එම ප්‍රජාවන්ගේ ප්‍රජා අයිතීන් සුරැකීම හා ඔවුන්ගේ එදිනෙදා ජීවන කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය සහාය ලබා දීමද ජාතික උරුම අංශය විසින් ඉදිරි වැඩසටහන් වල ඇතුළත් කර ඇත.

දේශීය පෞඩත්වය විදහා දක්වන පැරණි සංස්කෘතික අංග වත්මන් සමාජයෙන් ගිලිහී යාම වැළැක්වීම සඳහා මෙන්ම අතීත උරුමය ඉදිරි පරපුර වෙත දායාද කිරීමේ අරමුණ පෙරදැරිව අපගේ පැරණි සංස්කෘතික අංග ප්‍රවර්ධනය හා සංරක්ෂණය උදෙසා ක්‍රියාත්මක වීමද ජාතික උරුම අංශය ප්‍රමුඛ කොට සලකයි.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි

නම :

තනතුර :

දිනය :

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/
ප්‍රධාන ගණකාධිකාරි/

අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)

නම :

දිනය : 2017/02/27

පරිච්ඡේදය 03

3.1 වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය



එසිජ්-එල්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	තත්ත්‍ය 2022 රු.	තත්ත්‍ය නැවත ඉලපන ලද 2021 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එසිජ්-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		243,683,000	409,157,000	එසිජ්-3
-	කැන්පතු		56,684,628	22,325,561	එසිජ්-4
-	අත්තිකාරම් ගිණුම්		4,026,516	2,717,970	එසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	48,410,693	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**304,394,144**	482,611,224	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**304,394,144**	482,611,224	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		69,080	191,305	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		304,325,064	482,419,919	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
90,830,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	61,061,885	62,950,089	
99,540,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	87,007,945	90,761,462	එසිජ්-2(ii)
136,300,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	123,238,891	120,060,701	
100,000.00	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	7,000	
326,770,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**271,308,721**	273,779,252	
	මූලධන වියදම්				
2,250,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	279,806	28,960,209	
7,130,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	4,127,161	14,698,494	
67,500,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	67,416,937	98,587,345	එසිජ්-2(ii)
	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
1,100,000	හැකියා වර්ධනය	14	393,662	3,731,522	
18,550,000	වෙනත් මූලධන වියදම්	15	13,038,805	35,366,131	
96,530,000	මුළු මූලධන වියදම් (උ)		**85,256,371**	181,343,701	
	කැන්පතු ගෙවීම්		120,547,597	143,212,376	එසිජ්-4
	අත්තිකාරම් ගෙවීම්		4,578,900	4,995,117	එසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		125,126,497	148,207,493	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		481,691,588	603,330,446	
423,300,000	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(177,366,524)	(120,910,527)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		177,366,524	120,910,527	එසිජ්-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	එසිජ්-3
			-	-	

1

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය



ඒසිඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තක්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	25,336,307	25,235,066
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	8,104,895	7,552,511
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**33,441,201**	**32,787,577**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(60,345,957)	(124,761,310)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		25,336,307	25,235,066
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ප්‍රංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	68,450,852	132,313,821
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**33,441,201**	**32,787,577**

පිටු අංක 07 සිට 61 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 62 සිට 77 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 27/02/2023

ගණන්දීමේ නිලධාරි
නම : ප්‍රධාන ගණකාධිකාරී
තනතුර : "දහම්පාය"
දිනය :

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය :

සෝමරත්න විද්‍යානපබිරණ
ලේකම්
බුද්ධාගම, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
අංක. 135, "දහම්පාය"
ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ - 07.

ප්‍රධාන ගණකාධිකාරී
ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ආගමික කලා
ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය
අමාත්‍යාංශය

2

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය



ඒසුඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2022 රු.	තත්‍ය නැවත ගලපන ලද 2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	75,791,870	457,567,693
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	
අග්‍රිම ලැබීම්	251,683,000	-
අත්තිකාරම් අයකර ගැනීම්	18,442,284	3,251,507
තැන්පතු ලැබීම්	56,684,628	22,325,561
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	402,601,781	483,144,761
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් ව්‍යදම්	207,234,463	215,760,017
සහනාධාර සහ මාරුකිරීම්	-	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද ව්‍යදම්	11,717,440	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	8,069,080	191,305
අත්තිකාරම් ගෙවීම්	19,760,578	4,994,317
තැන්පතු ගෙවීම්	120,547,597	128,971,916
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	367,329,158	349,917,555
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	35,272,623	133,227,206
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිෂ්කෘති ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	35,272,623	133,227,206
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	35,272,623	133,227,206
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(35,272,623)	(133,227,206)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	0	0
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්		
ප්‍රදානයන් ලැබීම්		
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්		
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඒ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(එ)-(ඒ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් එකතු කිරීමේ ආයතනයක් නොවේ.

රු.,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය(රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසන් ප්‍රතිපාදනය		
පුනරාවර්තන	330,800	330,800	270,559	81.79
ප්‍රාග්ධන	92,500	92,500	86,006	92.98

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන වෙනත් ආයතන වලට වෙන් කරන ලද ප්‍රතිපාදන නොමැත.

රු.,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
130	රාජ්‍ය පරිපාලන	2021 වර්ෂයේ සංවර්ධන නිලධාරින්ගේ වැටුප් ගෙවීම	36,835.78	36,835.78	36,835.78	100%

3.8 මූල්‍ය නොවන වත්කම් කිරීමේ කාර්ය සාධනය

රු.,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ	25,336,306.52			
9153	ඉඩම්				
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්	7,463,475.18			

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } සිඒඒ/සි/එම්ඹබී/02/2022/06

මබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2023 ජූනි 09 දින

ලේකම්

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

ශීර්ෂය 101 - බුද්ධශාසන, හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 101 - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රතිපත්තිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ ඇයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමී.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ බුද්ධශාසන අංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1.1 (අ)	අමාත්‍යාංශය සතු අංක 18 – 4263 දරන වාහනයෙහි වටිනාකම (තක්සේරු කර නැත) මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් නොකිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.	1.6.1 (අ) (ii)

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) බුද්ධශාසන අංශය

(i) 2022 දෙසැම්බර් 31 දිනට බුද්ධශාසන අංශයේ මූල්‍ය නොවන වත්කම් තුළ ඇතුළත් වාහනවල වටිනාකම් රු.243,386,950 ක් වූ අතර අමාත්‍යාංශය විසින් පිළිවෙලින් මහාභාරකාර දෙපාර්තමේන්තුවට හා බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවට භාර දී තිබූ, වටිනාකම් රු.38,000,000 ක් වූ අංක PA- 7082 දරන ජීප් රථය සහ වටිනාකම් රු.1,500,000 ක් වූ අංක 32-5816 දරන ජීප් රථය මෙතෙක් නීත්‍යානුකූලව පවරා දී නැතත් ගිණුම්වලින් ඉවත් කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ii) අංක 18-4263 දරන මෝටර් රථයෙහි වටිනාකම (තක්සේරු කර නැත) මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් නොකිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ආ) සංස්කෘතික අංශය

(i) සංස්කෘතික අංශය සතු අංක CAM 5384, 254 -0003 හා YC 1104 දරන වාහන 03 (තක්සේරු කර නැත) මූල්‍ය ප්‍රකාශන තුළ වාහනවල වටිනාකමට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ii) අංක KE-8095 දරන ටාටා සුමෝ ජීප් රථය හා අංක 253-1191 දරන ටොයොටා ඩබල් කැබ් රථය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත පවරා දී තිබුණද, පිළිවෙලින් රු.2,500,000 ක් හා රු.1,500,000 ක් වූ එම වාහනවල තක්සේරු වටිනාකම 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර නොතිබුණි.

(ඇ) 2022 සැප්තැම්බර් 21 දිනැති අංක 06/2022 දරන අයවැය වක්‍රලේඛයේ 20 සහ 21 වගන්ති ප්‍රකාරව අහෝසි වූ වැය ශීර්ෂ යටතේ මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

	ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණය
(i)	භාණ්ඩ පිළිබඳ ලේඛනය	මූදල් රෙගුලාසි 110	බුද්ධශාසන අංශය විසින් පවත්වා නොතිබුණි.
(ii)	ඇප ලේඛනය	මූදල් රෙගුලාසි 891 (1)	බුද්ධශාසන අංශය විසින් පවත්වා නොතිබුණු අතර සංස්කෘතික අංශය විසින් යාවත්කාලීන කර නොතිබුණි.
(iii)	වැය ලෙජර	මූදල් රෙගුලාසි 447(3)	සංස්කෘතික අංශය විසින් යාවත්කාලීන කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) පුනරාවර්තන වියදම්

අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශයේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනවලින් මු.රෙ 66 යටතේ පුනරාවර්තන වැය විෂයයන් 04 කට රු.19,166,000 ක ප්‍රතිපාදන මාරුකර තිබුණු අතර ඉන් සියයට 40 සිට සියයට 100 දක්වා පරාසයකට අයත් රු. 11,266,723 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

(ආ) මූලධන වියදම්

අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශයේ ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් මු.රෙ 66 යටතේ මූලධන වැය විෂයයන් 04 කට රු.70,315,000 ක ප්‍රතිපාදන මාරුකර තිබුණු අතර එම සමස්ත ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

(ඇ) වැය විෂයයන් 6 ක් සඳහා වෙන් කරන ලද රු.3,270,000 ක ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම් සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථාපනයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.1 (අ) ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ	
(i) 4.2.5, 4.5, 4.6 හා 6.3 උප වගන්ති	බුද්ධශාසන අංශයේ විශ්‍රාම ගිය නිලධාරියෙකුගේ රු.167,055 ක ණය ශේෂය වර්ෂ 03 කට වැඩි කාලයක සිටද සංස්කෘතික අංශයේ විශ්‍රාම ගිය නිලධාරියෙකුගේ රු,128,732 ක ණය ශේෂය වර්ෂ 17 කට වැඩි කාලයක සිටද අයවිය යුතුව පැවති අතර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ii) 4.4 උප වගන්තිය	සංස්කෘතික අංශයේ මිය ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අය විය යුතු වර්ෂ 1 සිට 2 දක්වා කාල පරිච්ඡේදයක සිට පැවත එන රු.234,305 ක ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
(iii) 4.5, 4.6 සහ 6.3 උප වගන්ති	සංස්කෘතික අංශයේ වැඩ තහනමට ලක් වූ නිලධාරීන් 08 දෙනෙකුගේ එකතුව රු.483,021 ක් වූ ණය ශේෂය වර්ෂ 03 සිට 05 දක්වා කාල පරිච්ඡේදයක සිට අයවිය යුතුව පැවතියද, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ	
(i) මුදල් රෙගුලාසි 135	(i) සංස්කෘතික අංශයේ පවිත්‍රතා සේවයට අදාලව, තහවුරු කිරීමේ ලේඛන පරීක්ෂාවකින් තොරව 2021 දෙසැම්බර් 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා මසකට රු.147,000 බැගින් ගෙවීම් කර තිබුණි. (ii) සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ නිලධාරිනියකට රු.68,917 ක ණය මුදලක් සාවද්‍ය ලෙස ගෙවා තිබූ අතර එම ණය මුදල ආපසු අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 113 (6) හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 වගන්තිය	සේවය අතහැර ගොස් වර්ෂ 05 ඉක්මවා තිබූ සංස්කෘතික අංශයේ නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.220,488 ක් වූ ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	
(ඇ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14	බුද්ධශාසන අංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාවෙහි අනුකූල වන බවට දක්වා තිබූ අවශ්‍යතා 09ක් අනුකූල නොවන බව නිරීක්ෂණය විය. තවද, සංස්කෘතික අංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාවේ අනුකූල බව දක්වා තිබූ අවශ්‍යතා 03 ක් අනුකූල නොවන බව නිරීක්ෂණය විය.	
(ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.3 වගන්තිය	ඉන්ධන භාවිතයේ අහිතකර වෙනස්කම් ඇත්නම් එය හඳුනා ගැනීම සඳහා චක්‍රලේඛයෙහි ඇමුණුම 1 අනුව ප්‍රවාහන සේවා සටහන මාසිකව සම්පූර්ණ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	

2.4 තැන්පතු

බුද්ධශාසන අංශයේ 2022 දෙසැම්බර් 31 දිනට තැන්පත් ශේෂය රු.23,240,820 ක් වූ අතර ඉන් වර්ෂ 02 ඉක්ම වූ එකතුව රු.21,106,115 ක කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් තැන්පතු 05 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් පවත්වාගෙන යාමේදී චෙක්පත් අත්සන් කරන නිලධාරීන් මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් බුද්ධශාසන අංශයේ අදාල නිලධාරීන්ගෙන් ඇප අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 වගන්තිය ප්‍රකාරව වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපති වෙත පිටපතක් සහිතව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2021 වර්ෂයේ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණේ 2022 සැප්තැම්බර් 30 දින වේ.

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අදාළ ප්‍රගතිය හා කාර්යසාධනය

(i) සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන, සංස්කෘතික කටයුතු අංශය මගින් ක්‍රියාත්මක කරන ප්‍රධාන වැඩසටහන වන බැවින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම සංස්කෘතික මධ්‍යස්ථානයක් පිහිටුවීමට නියමිත බව වාර්ෂික කාර්යසාධන වාර්තාවේ දක්වා තිබුණි. එසේ වුවද, මුලතිව්, මන්නාරම හා කිලිනොච්චි යන දිස්ත්‍රික්ක තුන තුළ එකදු සංස්කෘතික මධ්‍යස්ථානයක් හෝ පිහිටුවා නොතිබුණු අතර මෙම වර්ෂයේ සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීමේදීද මේ සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි.

(ii) ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇති බොහෝ ක්‍රියාකාරකම් විස්තරාත්මක ලෙස සටහන් කර නොතිබුණි. මේ හේතුවෙන් ඒ යටතේ සිදුකළ යුතු වැඩසටහන්/ව්‍යාපෘතීන් මොනවද යන්න පැහැදිලි නොවූන අතර එම ක්‍රියාකාරකම්වලට අදාල අරමුණු සහ ඉලක්ක සපුරාගෙන තිබුනේද යන්න නිශ්චය කිරීමට නොහැකි විය.

(iii) ක්‍රියාකාරී සැලැස්මෙහි අභිමතාර්ථ අංක 04 හි ඉලක්කයන් ලෙස තිරසාර සංවර්ධන අභිමතාර්ථ ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කිරීම දක්වා තිබුණි. 2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසාර සංවර්ධනයට ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුම හා කුසලතාවයන් ලබාගෙන සිටීම සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සඳහා වැඩසටහන් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම සිදුකර නොතිබුණි.

(iv) අභිමතාර්ථ අංක 11 හි ඉලක්ක 11.4 ලෙස සියලු සංස්කෘතික සහ ස්වාභාවික උරුමයන් රැකගැනීම, ආරක්ෂාව සහ සංරක්ෂණය වෙනුවෙන් වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීමේ ඉලක්ක වශයෙන් දෙමළ, මුස්ලිම් හා අනෙකුත් සංස්කෘතික උරුමයන් සඳහා වැඩසටහන් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) සමාජ සංස්කෘතික ඒකාබද්ධතාවය සඳහා විශේෂ වැඩසටහන් (101-2-5-6-1508)

(i) මෙම වැය විෂයය මගින් සංස්කෘතික මධ්‍යස්ථාන හරහා ක්‍රියාත්මක කිරීමට යෝජිත සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් සඳහා මූල්‍යාධාර ලබා දීමට රු.10,000,000ක අයවැය ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු අතර 2022 දෙසැම්බර් 19 දින ඉන් රු.6,560,000ක ප්‍රතිපාදන 101-2-5-9-1409 වැය විෂයයට මාරුකර තිබුණි. මේ නිසා එම වැය විෂයය යටතේ ඉතිරි ප්‍රතිපාදනය අඩු අගයක් දක්වා කාර්යසාධන වාර්තාවේ මූල්‍ය ප්‍රගතිය සියයට100 ක් ලෙස දක්වා තිබුණි. එසේ වුවද, සංස්කෘතික මධ්‍යස්ථාන මගින් ක්‍රියාක්මක කරන සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් සඳහා මූල්‍යාධාර ලබා දීම අවම මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

(ii) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අදාල වැය විෂයයේ කාර්යසාධන දර්ශකය, "ක්‍රියාත්මක කිරීමට යෝජිත සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව" ලෙස දක්වා තිබුණද, ඒ සඳහා වූ අපේක්ෂිත ඉලක්ක පිහිටුවා නොතිබුණි. එසේ වුවද, අදාළ වැය විෂයයේ භෞතික ප්‍රගතිය සියයට 100 ලෙස වාර්ෂික කාර්යසාධන වාර්තාවේ සඳහන් කර තිබුණි.

(iii) මෙම වැය විෂයය යටතේ ක්‍රියාකාරකම් ලෙස සමාජ සංස්කෘතික ඒකාබද්ධතාවය සඳහා විශේෂ වැඩසටහන් පැවැත්වීම හඳුනාගෙන තිබුණද විවිධ ජාතීන්ගේ සංස්කෘතීන් නියෝජනය වන පරිදි විවිධත්වයෙන් යුතු වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය (101-02-05-08-1409)

2022 වර්ෂයේ අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය සඳහා අයදුම්පත් කැඳවීම් හා පූර්ව ප්‍රචාරක කටයුතු මෙම වැය විෂයය මඟින් සිදුකළ යුතු වුවද වර්ෂය තුළ එම කටයුතු සිදුකර නොතිබුණද අදාළ වැය විෂයයයේ භෞතික ප්‍රගතිය සියයට 99 ක් ලෙස වාර්ෂික කාර්යසාධන වාර්තාවේ සඳහන් කර තිබුණි.

(ඉ) ශිල්ප ගම්මාන වැඩසටහන (101-02-05-21-2506)

ශිල්ප ගම්මාන වැඩසටහනේ පළමු ක්‍රියාකාරකම් යටතේ නියමිත අනු ක්‍රියාකාරකම් තුනෙන් කිසිදු ක්‍රියාකාරකමක් සිදු කර නොතිබූ අතර ශිල්පීන් 18 දෙනෙකු සහ ආයතන හා නිලධාරීන් 12 දෙනෙකු සඳහා සම්මාන ප්‍රදානෝත්සවයක් පවත්වා තිබුණි. ඒ අනුව දුම්බර රටා කර්මාන්තය සංචාරක ආකර්ශණය සඳහා ප්‍රවර්ධනය කිරීම යන අරමුණ සාක්ෂාත් කරගෙන නොමැති බව නිරීක්ෂණය විය. අදාල ක්‍රියාකාරකම් සිදු නොකිරීම හේතුවෙන් භෞතික ප්‍රගතියක් නොමැති වුවත්, සියයට 48 ක භෞතික ප්‍රගතියක් වාර්ෂික කාර්යසාධන වාර්තාවේ දක්වා තිබුණි.

(ඊ) සංස්කෘතික වටිනාකම් හා දේශීය දැනුම පිලිබඳ පර්යේෂණ ක්‍රියාකාරකම් (101-02-05-29-2507)

මේ යටතේ පර්යේෂණ ඒකකය ස්ථාපිත කර පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමග ඒකාබද්ධ පර්යේෂණයක් ආරම්භ කිරීම හා ජාතික සංස්කෘතික ප්‍රතිපත්තිය සකස් කිරීම යන කටයුතු වර්ෂය තුළදී සම්පූර්ණ කර නොතිබුණු අතර එම ක්‍රියාකාරකම් දෙක 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මටද ඇතුලත් කර නොතිබුණි. ඒ අනුව ජාතික සංස්කෘතික ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා පුවත්පත් දැන්වීම් සඳහා ගෙවන ලද රු.461,916ක වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්ව ඇති බව නිරීක්ෂණය විය.

3.2 ප්‍රසම්පාදනයන්

(අ) අමාත්‍යාංශයේ සංස්කෘතික අංශය සඳහා පවිත්‍රතා සේවාව ලබා ගැනීම - 2021/2022

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) අමාත්‍යාංශයේ සංස්කෘතික අංශයේ පිරිසිදු කිරීම් සේවා කටයුතු රු.147,000 ක්වූ මාසික කුලියකට 2021 දෙසැම්බර් 01 දින සිට 2022 නොවැම්බර් 30 දින දක්වා කාලසීමාවක් සඳහා 2022 මාර්තු 07 දින ගිවිසුම්ගතවී තිබුණද පිරිසිදු කිරීමේ කටයුතු ආරම්භ කර තිබුණේ 2021 නොවැම්බර් 26 දින වේ.

(ii) ලංසු ලේඛනය ප්‍රකාරව, පවිත්‍රතා සේවකයින්ගේ පෞද්ගලික තොරතුරු ලබා ගත යුතු වුවත් එම තොරතුරු ලබා ගෙන නොතිබූ අතර ලංසු ලේඛනය සහ ගිවිසුම් අතර පැමිණීම් හා පිටවීමේ වේලාව සහ සේවයේ යෙදවිය යුතු සේවක සංඛ්‍යාව සම්බන්ධයෙන් වෙනස්කම් පැවතුණි.

(iii) ගිවිසුම හා ලංසු ලේඛන ප්‍රකාරව වැඩ සුපරීක්ෂක හා පවිත්‍රතා සේවකයින් 04 දෙනෙකු සේවයේ යෙදවිය යුතු වුවත්, සේවකයින් දෙදෙනෙකු පමණක් 2022 ජනවාරි සිට 2022 දෙසැම්බර් 31 දින තෙක් සේවයේ යෙදී තිබූ අතර වැඩ සුපරීක්ෂකවරයෙකු අධීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි. මෙවැනි අවස්ථාවක දණ්ඩන අයකිරීම් සඳහා අදාල කරගත හැකි කොන්දේසි ලංසු ලියවිලි වලට හා ගිවිසුමට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර දිගින් දිගටම සේවා කොන්දේසි උල්ලංඝනය කර තිබුණද ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් නොගෙන සම්පූර්ණ මාසික කුලි මුදලම ගෙවා තිබුණි.

(iv) පවිත්‍රතා කටයුතු වෙනුවෙන් සැපයුම්කරු විසින් මාසිකව සැපයිය යුතු උපාංග හා ද්‍රව්‍ය මෙන්ම ද්‍රව්‍ය සැපයීම හා භාවිතය සම්බන්ධ කොන්දේසි ලංසු ලේඛනයට සහ ගිවිසුමට ඇතුළත් කර නොතිබුණු අතර එම ද්‍රව්‍ය පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යාමටද එම කටයුතු සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය සඳහා පවිත්‍රතා සේවාව ලබා ගැනීම - 2022/2023

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) පිරිසිදු කිරීමේ සේවාව ලබාගැනීම සඳහා වෙළඳපොල මිල සැදහුම් ලංසු ක්‍රමය භාවිතා කර අමාත්‍යාංශයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවීමට අමාත්‍යාංශයේ සුළු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය හිමිව තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 හා 4.3.2 ප්‍රකාරව මෙම ප්‍රසම්පාදන කාර්යය සඳහා වූ මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද, ලංසු කැඳවීමේ ආරාධනා යවන ලද සැපයුම්කරුවන් 05 දෙනාගෙන් එක් සැපයුම්කරුවෙකු පමණක් ලියාපදිංචි සැපයුම්කරුවන් අතර විය.

(ii) 2021/2022 හා 2022/2023 සේවා ගිවිසුම් ප්‍රකාරව ගෙවිය යුතු උපරිම මාසික ගාස්තුව පිළිවෙලින් රු.798,000 ක් හා රු.831,000 ක් විය යුතු වුවද, ඊට පටහැනිව වැඩිපුර ගෙවන ලද මුදල රු.79,800 ක් වූ අතර එම ප්‍රමාණය වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ජාතික ප්‍රාසාංගික කලා මධ්‍යස්ථානය සඳහා පවිත්‍රතා සේවාව ලබා ගැනීම

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණු අතර පසුගිය මාස 11කට අදාලව ඉදිරිපත් වූ ඉන්වොයිසිවල වටිනාකම දළ ඇස්තමේන්තුව ලෙස සලකා තාක්ෂණික දැගැයීම් කමිටුව විසින් සිය නිරීක්ෂණ ලබා දී තිබුණි.

(ii) පිරිසිදු කිරීමේ සේවය ලබා ගැනීමට පෙර අදාල සේවා සැපයුම්කරු සමග ගිවිසුම්ගත විය යුතු වුවත්, 2022 අප්‍රේල් 01 දින සිට සේවය ලබා ගෙන මාස 6ක කාල ප්‍රමාදයකින් පසු 2022 සැප්තැම්බර් 30 දින ගිවිසුමකට එළඹ තිබුණි.

(iii) ලංසු ලේඛන අනුව දෛනිකව සේවයේ යෙදවිය යුතු මුළු සේවක සංඛ්‍යාව 21 ක් වුවද සේවකයන්ගෙන් 6–7 අතර ප්‍රමාණයක් එනම් සියයට 32 ක් පමණ දෛනිකව සේවයට නොපැමිණෙන බව නිරීක්ෂණය විය. ඒ අනුව, නියමිත සේවක සංඛ්‍යාව යොදවා ගුණාත්මක තත්ත්වයෙන් සේවය ලබා ගැනීම සඳහා කිසිදු උත්සාහයක් ගෙන නොතිබූ අතර නොපැමිණෙන සේවකයන් වෙනුවෙන් වූ ගාස්තු අඩුකිරීම පමණක් සිදුකර තිබුණි.

(iv) වැටුප් ගෙවීමේදී සේවකයෙකු සඳහා දිනකට රු.1,400ක් හා වැඩ පරීක්ෂක සඳහා රු.1,500ක් වශයෙන් ගෙවීම් සිදු කළද නොපැමිණීම් සඳහා මුදල් අඩු කිරීමේදී දෛනිකව රු.740ක් හා වැඩ පරීක්ෂක සඳහා රු.840ක් බැගින් අඩුකල යුතු බව ගිවිසුමෙහි දක්වා තිබුණි. ඒ හේතුවෙන් 2022 අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා කාලඵසීමාව තුල රු.845,460 ක මුල්‍යමය අලාභයක් සිදුව තිබුණි.

(ඇ) සේවා ලබා ගැනීම, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව සිදු කළ යුතු වුවද, ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය සඳහා 2022/23 වර්ෂයට අදාලව ආරක්ෂක සේවාව ලබා ගැනීමේදී සේවා කොන්ත්‍රාත්තුව පෙර වර්ෂයේ සැපයුම්කරු වූ සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා ආයතනය වෙත ලබා දීමට තීරණය කර ඇති බව සෘජුවම ප්‍රධාන ගණකාධිකාරී (ජාතික උරුම අංශය) විසින් 2022 දෙසැම්බර් 12 වන දින අදාල සැපයුම්කරු වෙත දන්වා යවා තිබුණි.

(ඉ) ප්‍රසම්පාදන තීරණයක් මගින් අමාත්‍යාංශය විසින් පවත්වන වැඩසටහන් සඳහා ආහාර ලබා ගත යුතු ආයතන නිර්දේශ කර තිබුණද ඊට පටහැනිව 2022 ජනවාරි 04 දින රු.134,875 ක් ගෙවා වැඩසටහනක් සඳහා කෙටි ආහාර ලබා ගෙන තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම

රු.මිලියන 1350 ක (අදියර 1-5) දක්වා මූලික ඇස්තමේන්තුවක් මත 2005 වර්ෂයේ ආරම්භ කර 2017 සැප්තැම්බර් 30 දින නිම කිරීමට නියමිතව තිබූ විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව අදියර 05ක් දක්වා ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1245.18 ක පිරිවැයක් දරා තිබුණි. කාර්යසාධන වාර්තාව අනුව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් බව දක්වා තිබූ අතර 2022 වර්ෂයේදී ඊට අදාලව වියදම් දරා නොතිබුණි. ඊට අදාලව 2022 නොවැම්බර් 29 දින සිදුකරන ලද ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහත සඳහන් පරිදි විය.

(i) අත්තිවාරමේ පවතින දෝෂ සහිත බව නිසා ප්‍රධාන ගොඩනැගිල්ලට සමානව ඉදිරිපස හා පිටුපස පඩිපේලි ගිලා බැස ඒවායේ ටයිල් ගැලවී තිබුණු අතර ප්‍රවේශ පඩිපෙළ හා සම්බන්ධ බිත්ති පුපුරා ඉරිතැලීම් පැවතුණි. ගිලා බැස්මේ උපරිම ප්‍රමාණය මැනීම සඳහා සම්බන්ධිත පඩිපේලි මත වැලි කොට්ට අසුරා තිබුණි.

(ii) ගොඩනැගිල්ල තුළට පිටතින් ජලය කාන්දුවෙමින් පැවති අතර මධ්‍යම වායු සමීකරණ පද්ධතිය සහිත කාමරයේ ද ජලය කාන්දුවීම් පැවතුණි. ජල ටැංකි ස්ථාපනය කර තිබූ ස්ථානයේ දිය සිරාව මත විවිධ පැළැටි වැවී කිහිප තැනක දියසෙවල බැඳී තිබුණි.

(iii) ගොඩනැගිල්ලේ ඉහලම මහලෙහි ලින්ටල්වල බදාම තට්ටු ගැලවී තිබූ අතර ප්‍රවේශ දොරටුවේ බිත්ති සහ සිවිලිම කුරුල්ලන් විසින් අපවිත්‍ර කර තිබුණි.

(iv) ප්‍රධාන ශ්‍රවණාගාරයේ සවිකර තිබූ ආසන මත පුස් සෑදී තිබූ අතර සවි කරන ලද තිර රෙදි අපවිත්‍ර වී තිබූ බවත් ඇතැම් තිර රෙදි අනාරක්ෂිතව අපවිත්‍ර වන සේ බිම ගොඩ ගසා තිබූ බවත් නිරීක්ෂණය විය.

(v) ගොඩනාගිල්ලේ සවි කර තිබූ ගිනි නිවීමේ උපකරණ 2019.11.10 දින කල් ඉකුත් වී තිබූ බව නිරීක්ෂණය විය.

(vi) ගොඩනැගිල්ල පිහිටි භූමි පරිශ්‍රය වල් බිහිවී තිබූ අතර විවිධ වැල් වර්ග ගොඩනැගිල්ල ඇතුළත දක්වා ද වැවී තුබුණි.

(vii) කෙසේ වුවද, මෙම සම්මන්ත්‍රණ ශාලා ගොඩනැගිල්ල මෙම වාර්තාවේ දින වන විටත් භාවිතයෙන් තොරව නිශ්කාර්යව පැවතුණි.

(ආ) අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශයට අයත් අංක 18-4263 දරන මෝටර් රථය 2019 වර්ෂය හෝ ඊට පෙර සිට මහානායක වාරිකාරාම පරිශ්‍රය තුළ දිරාපත් වෙමින් පැවතුණි.

(ඇ) 2018 ඔක්තෝබර් 10 දිනැති 03/2018 අංක දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව 2019 මාර්තු 31 දිනට පෙර රජයට අයත් වාහනවල ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටලු නිරාකරණය කර ගත යුතු වුවද සංස්කෘතික අංශය විසින් පරිහරණය කරනු ලබන අංක KU – 1910, CAM – 5384 හා 32 – 5805 දරන වාහන 03 හි අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) අපහරණය කළ යුතු ලෙස හඳුනාගෙන තිබූ සංස්කෘතික අංශය සතු අංක 301-4103, QY-1829 හා 18-7052 දරන වාහන 03 නාගරික සංවර්ධන අධිකාරියට අයත් බත්තරමුල්ල ප්‍රදේශයේ පිහිටි රථ ගාලක අනාරක්ෂිතව ගාල්කර තිබූ අතර එම වාහන සම්බන්ධයෙන් 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 (II) අනුව කටයුතු කර නොතිබුණි.

(ඉ) තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පැවති තිස්සමහාරාම, රන්මිණිකැන්තේ පිහිටි මහින්ද රාජපක්ෂ ටෙලි සිනමා උද්‍යානය, 2020 අගෝස්තු 09 දිනැති අංක 2187/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරා තිබුණි. ඒ අනුව, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ අංක MMI/05/08/16 හා 2020 දෙසැම්බර් 04 දින දරන ලිපිය මගින්, වාහන 09 ක් රන්මිණිකැන්න උද්‍යානයට අනුයුක්ත කර තිබුණි.

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) අමාත්‍යාංශ අතර වත්කම් මාරු කිරීමේදී හා පැවරීමේදී 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ II කොටසේ 8 වගන්තියේ සඳහන් නිර්ණායක ප්‍රකාරව කටයුතු කළ යුතු වුවත් අදාල පැවරීම් ඊට අනුකූලව සිදුකර නොතිබුණි.

(ii) අදාල වාහන 09 අතුරින් වාහන 04 ක් ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත පවරා දී තිබූ අතර ඉතිරි වාහන නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) අදාල වාහන භාරගැනීම් අදාල අමාත්‍යාංශය විසින් සිදු කළ යුතු වුවද මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානයේ වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිදු කර තිබුණි. මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය යනු විධිමත්ව ස්ථාපිත නොවූ ආයතනයක් වන බැවින් හා එහි අධ්‍යක්ෂ ජනරාල් තනතුර ද තාවකාලික පත්වීමක් වන බැවින් වාහන භාර ගැනීම නීත්‍යානුකූල නොවන බව නිරීක්ෂණය විය.

(ඊ) 2022 දෙසැම්බර් 31 දිනට ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය සතුව පවතින නිල නිවාස 10 න් නිල නිවාස 7ක් නිලධාරීන්ගේ පදිංචිය සඳහා හා ඉතිරි නිවාස 3 වෙනත් අවශ්‍යතා සඳහා භාවිතා කරමින් පැවතුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 1 වගන්තිය ප්‍රකාරව සියලුම රජයේ නිවාස උප ලේඛනගත නිවාස හෝ පොදු සේවා නිවාස ලෙස වර්ගීකරණය කළ යුතු වුවද ජනකලා කේන්ද්‍රය සතු නිල නිවාස ඒ අනුව වෙන්කර නොතිබුණි.

(ii) ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5.6 උපවගන්තිය ප්‍රකාරව නිලධාරියෙකුගේ වැටුපෙන් අයකරන නිවාස කුලිය ඔහුට දී තිබෙන නිවාසයේ සාධාරණ ආර්ථික කුලියට වඩා සැලකියයුතු ප්‍රමාණයකින් වැඩි වන්නේ නම් එම නිලධාරියාගේ වැටුපෙන් සියයට ගණනක් අයකර ගැනීම වෙනුවට, නිශ්චිත නිවාස කුලියක් අයකර ගැනීමට ලේකම්වරයාගේ අවසරය ලබා ගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iii) ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 60.1 උපවගන්තිය ප්‍රකාරව තනතුරකට වෙන් කරන ලද නිවාස හැර අනෙකුත් සියළුම නිල නිවාසවල බදු කාලය වසර 5කින් අවසන් වන අතර නිල නිවාස නිලධාරීන්ට භාරදීමේදී ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ සඳහන් කොන්දේසි අනුව අදාල නිලධාරියා සමග ගිවිසුම්ගත විය යුතු වේ. එමෙන්ම නිල නිවාසවලින් ඉවත් වී නොගියහොත් 1971 අංක 03 හා 1974 අංක 40 දරන පනත්වලින් සංශෝධිත 1969 අංක 07 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත යටතේ ඔවුන් එම නිවාස වලින් ඉවත් කළ යුතු වේ. එසේ වුවද, එලෙස ගිවිසුම්ගතවීම ප්‍රතික්ෂේප කරමින් නිල නිවාසයක පදිංචි වී සිටින නිලධාරියෙකු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iv) එක් නිල නිවාසයක් සංගීත අධ්‍යයන කටයුතු සඳහා භාවිතා කරන බවට විගණනය වෙත දන්වා තිබුණද පාවිච්චියට නොගෙන වසා දමා තිබීම හේතුවෙන් වෙයන් වැනි කෘමී සතුන්ගේ උවදුරට ලක්ව ඇති බවත්, ගොඩනැගිල්ල අබලන් තත්ත්වයට පත් වීම වළක්වා ගැනීම සඳහා සුදුසු නිලධාරියෙකුට ලබා දෙන ලෙසත් ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රයේ අධ්‍යක්ෂතුමිය විසින් බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමාගෙන් ඉල්ලීමක් කර තිබුණි.

3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වන අධිකාරිය අනුව අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශයේ ඇප තැබිය යුතු නිලධාරීන් 25 දෙනෙකුගෙන් ඇප මූදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

(අ) දඹදිව වන්දනා සංවාරකයින් ලියාපදිංචිය හා මාර්ගෝපදේශ සැලසීම

(i) දඹදිව වන්දනා සංවිධායකයින් අමාත්‍යාංශයෙහි ලියාපදිංචිවීම තුළින් දඹදිව වන්දනා වාරිකාවේ යෙදෙන්නන්ට නිදහස් වීසා ලබා ගැනීමේ පහසුව සැලසීම, විදේශ ගමන් බලපත්‍ර ලබාගැනීමේ පහසුව හා වන්දනාකරුවන්ට වැඩි ආරක්ෂාවක් සැපයීම වැනි අවස්ථාවන් හිමිවන නමුත් ඔවුන්ට ලැබෙන මෙම පහසුකම් පිළිබඳව සංවිධායකයින් සහ වන්දනාකරුවන් දැනුවත්කිරීමේ විධිමත් වැඩපිළිවෙලක් අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. තවද, නිදහස් වීසා පහසුකම් ලබාදීම තුළින් වියදම අඩුවීමේ වාසිය වන්දනාකරුවන්ට හිමිවන්නේද යන්න පිළිබඳ පසු විපරම් කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ii) දඹදිව වන්දනාකරුවන් වන්දනාවේ යෙදෙන අතරතුර නිරන්තරයෙන් සෞඛ්‍ය ගැටළුවලට මුහුණ දීම හා කිහිප අවස්ථාවකදී මරණයට පත්වීම ආදි සිද්ධීන් හේතුවෙන් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) විසින් වන්දනා වාරිකා සංවිධාන හා වන්දනාකරුවන් සඳහා සෞඛ්‍ය උපදෙස් සහිත මාර්ගෝපදේශයක් සකස් කර දෙන ලෙස සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් කර තිබුණු අතර ඒ අනුව, සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය විසින් අදාල මාර්ගෝපදේශයක් පිළියෙල කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද, මෙම මාර්ගෝපදේශය අමාත්‍යාංශයේ ලියාපදිංචි සියළු වන්දනා සංවිධානයකයින් වෙත බෙදා දුන් බවට විගණනයේදී තහවුරු කරගත නොහැකි වූ අතර ඊට අදාල පසු විපරම් කිරීමටද කටයුතු කර නොතිබුණි.

(iii) ලියාපදිංචි සංවිධායකයින්ගෙන් දඹදිව වන්දනාවේ යෙදෙන බැතිමතුන්ට සිදුවන අඩුපාඩු සම්බන්ධයෙන් සොයා බැලීමක් අමාත්‍යාංශය මඟින් සිදු කර නොතිබුණු අතර 2020 සිට 2022 දක්වා කාලසීමාව තුළ වන්දනාකරුවන්ට සංවිධායකයින්ගෙන් සිදු වූ විවිධ දුෂ්කරතාවන් හා අසාධාරණයන් දක්වමින් පැමිණිලි 29 ක්ද, වන්දනා සංවිධාකයින්ගෙන් පැමිණිලි 02 ක් ද ලැබී තිබුණද ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් කිසිදු පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(ආ) රජරට වාරිකා නිවාසය පරීක්ෂා කිරීම

(i) රජරට වාරිකා නිවාස ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් බීම් ඉරිතැලී ඇති අතර රියදුරු නවාතැන් ගොඩනැගිල්ලේ විදුලි සවිකිරීම් ආශ්‍රිතව අළුත්වැඩියාවන් සිදු කළ යුතු තත්වයක පැවතුණි. තවද, වාරිකා නිවාසයේ පිවිසුම් මාර්ගය වැසි ජලයට සේදීයාම හේතුවෙන් වාහන ඇතුළු කිරීමේ දුෂ්කරතාවයක් පැවතුණ ද මෙතෙක් අළුත්වැඩියාවන් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) වාරිකා නිවාසය වෙන් කිරීමේ ගාස්තුවලට අතිරේකව අමුත්තන්ගේ එක් ඇදක් සඳහා රු.50 බැගින් ඇද ඇතිරිලි ගාස්තුවක් වාරිකා නිවාස භාරකරු විසින් අයකරන ලබන අතර ඒ සඳහා මුදල් රෙගුලාසි 168 (1) සහ (2) වගන්තිය ප්‍රකාරව විධිමත් කුවිතාන්සියක් නිකුත් කර නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි 177 ප්‍රකාරව එකතු කර ගන්නා රජයේ මුදල් දිනපතාම හෝ හැකිතාක් කලින් ප්‍රේෂණය කළ යුතු වුවත් වාරිකා නිවාසයට සුළු මුදල් අග්‍රිමයක් හෝ ලබා දීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් ඇතැම් අවස්ථාවල ඇද ඇතිරිලි ගාස්තුවලින් වෙනත් වියදම් දරා තිබුණි.

(සැ) නිදහස් උත්සවයේ නර්තනාංග සඳහා ඇඳුම් වෙනුවෙන් අමාත්‍යාංශයේ සංස්කෘතික අංශය විසින් රු.4,429,800 ක් වැය කර තිබුණු අතර එම ඇඳුම් විධිමත්ව නර්තන ඇඳුම් ගබඩාවේ තැන්පත් කර නොතිබීම හේතුවෙන් රංග වස්ත්‍රාභරණවල ශේෂයන්හි නිවැරදිතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. තවද, සාපේක්ෂව ඉතා ඉහළ පිරිවැයක් දරා නිර්මාණය කරන මෙම නර්තන ඇඳුම් කට්ටල වෙනත් විකල්ප අවස්ථාවන් සඳහා බාහිර ආයතනවලට ලබා දී ආදායම් උත්පාදනය කර ගැනීමට හැකියාව ඇතත් ඒ සම්බන්ධයෙන් අවධානය යොමුනොකර නිශ්කාර්ය ලෙස මෙම ඇඳුම් කට්ටල ගොඩගසා ඇති බව නිරීක්ෂණය විය.

(සෑ) තිස්සමහාරාම, රන්මිණිතැන්න ප්‍රදේශයේ අක්කර 235 ක භූමි ප්‍රදේශයක ඉදිකර තිබූ මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය 2010 මාර්තු 30 වන දින විවෘත කර තිබූ අතර ඒ වන විට ආයතනයක් ලෙස විධිමත්ව ස්ථාපිත වී නොතිබුණි. ඒ සම්බන්ධයෙන් "මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය රජයට අයත් සමාගමක් බවට පත්කිරීම" යන මැයෙන් එවකට ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යවරයා විසින් 2013 ජනවාරි 31 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) අදාල අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කළ යුතු ආයතනය ලෙස ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය නම්කර තිබූ අතර එම අමාත්‍යාංශය විසින් හෝ මෙම උද්‍යානය එවකට පැවති ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් අදාල අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාවට නංවා නොතිබුණි.

(ii) මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය පිහිටි ඉඩම රජයේ ඉඩමක් වන අතර මෙම උද්‍යානය ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය යටතේ පැවති කාලසීමාවේදී එම අමාත්‍යාංශයේ බලයලත් නිලධාරියා වෙත විශේෂ කොන්දේසි කිපයක් යටතේ පැවරීම සිදුකර තිබුණි. මෙම වාර්තාවේ දිනය වන විටත් එම ඉඩම, ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයේ බලයලත් නිලධාරියාගේ නමින් පැවති අතර ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත උද්‍යානය පැවරී වසර 02 කට වැඩි කාලයක් ගත වී තිබුණද අදාල ඉඩම අමාත්‍යාංශය වෙත පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රයේ මෙහෙයුම් කටයුතු හා කාර්යසාධනය පිලිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2022 සැප්තැම්බර් 13 දිනැති අංක අමප/22/1294/620/007දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් වශයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගන්නා ලෙස බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත නිර්දේශ කර තිබුණද, සංස්කෘතික කටයුතු

දෙපාර්තමේන්තුව යටතේ වන ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක නොකර විගණිත දින වන විටත් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පැවතුණි.

(ii) පුර්ව ආසන්නතම වසර තුනක කාලපරිච්ඡේදය තුළ ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය වෙනුවෙන් දරන ලද මුළු වියදම රු.26,365,301ක් වුවත් එම කාලපරිච්ඡේදය තුළ පාඨමාලා සඳහා සහභාගීවී ඇති සිසුන් ගණන 112ක් වැනි අඩු අගයක් ගෙන තිබූ අතර පාඨමාලා සඳහා සහභාගිවන සිසුන් සංඛ්‍යාව වැඩිකර ගැනීම සඳහා සුදුසු ක්‍රමෝපායන් භාවිතා කර නොමැති බව නිරීක්ෂණය විය.

(iii) 2020 ඔක්තෝබර් 26 දිනැති අංක 02/2020 දරන කළමනාකරණ සේවා වක්‍රලේඛයෙහි 1(vii) උපවගන්තිය ප්‍රකාරව ආයතනයන්හි කාලීන සේවා අවශ්‍යතාවයන් අනුව අනුමත සේවක සංඛ්‍යාව සඳහා සංශෝධනයන් අවශ්‍ය වන විට වඩා කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් ලබා දීමට අවශ්‍ය අවම තනතුරු සංඛ්‍යාවක් හඳුනාගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේනතුව වෙත ඉදිරිපත් කර අනුමත කර ගත යුතුය. එසේ වුවද, රංගශාලාවක් නොමැති ජනකලා කේන්ද්‍රය සඳහා කළමණාකරු තනතුරක් හා රංගශාලා සහයක තනතුරු දෙකක් අනුමත තනතුරු ලෙස පවත්වා ගෙන ගොස් තිබූ අතර එම තනතුරු කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් සංශෝධනය කරගෙන නොතිබුණි.

(ඊ) ජාතික ප්‍රාසාංග කලා මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2020 සැප්තැම්බර් 25 දින සිට නෙළුම් පොකුණ රහහල, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ පැවති ජාතික උරුම ප්‍රාසාංගික කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පරිපාලනය විය. අනතුරුව, 2022 ජුලි 22 දිනැති අංක 2289/49 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතට පත්කර තිබුණි. එසේ වුවද, රහහල විධිමත් පරිදි සංස්ථාපනය කිරීම උක්ත අමාත්‍යාංශ විසින් 2022 දෙසැම්බර් 31 දින වන විටත් සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

(ii) රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක SA/AMP/Deposit/Transfer දරන 2020 ජනවාරි 09 දිනැති ලිපිය ප්‍රකාරව රහහලේ ආදායම් සඳහා ආදායම් ශීර්ෂයක් ඇතිකර ගැනීමට කටයුතු කළ යුතු වුවත් සම්බන්ධව 2022 දෙසැම්බර් 31 දින වන විටත් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(iii) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛයේ 5.1 ඡේදය ප්‍රකාරව, සේවා සම්පාදනය සඳහා අයකරනු ලබන විවිධ ගාස්තු ඉහළ නැංවීමක් සිදු කර නොමැති සියළුම රාජ්‍ය ආයතනයන් විසින් අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන එම ගාස්තු සියයට 15 කින් හෝ ට වැඩි ප්‍රමාණයකින් ඉහළ නැංවීමට කටයුතු කළ යුතු වුවද, අමාත්‍යාංශය විසින් 2012 වර්ෂයේ සිට අයකරන ගාස්තු සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර 2020, 2021 හා 2022 වර්ෂවලදී ද ගෙන නොතිබුණි.

(iv) රහහල. කුලී පදනම් මත ලබා දීමේදී ඇතැම් පාර්ශවයන් වෙතින් පමණක් සහනදායී මිල ගණන් මත කුලී මුදල් අයකර (වට්ටම් ලබා දීම) තිබූ අතර එවැනි සහනදායී අයකිරීම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(v) රහහල, කුලී පදනම් මත ලබා දීමේදී අදාල කුලී ගැනුම්කාර පාර්ශව සමඟ ගිවිසුම්කට. එළඹ තිබූ අතර ගිවිසුමෙහි පලමු පාර්ශවය වෙනුවෙන් ගිවිසුම් අත්සන් කිරීම රහහල වෙන්කරවා ගැනීමේ නිලධාරී සහ රහහලෙහි ප්‍රධාන පරිපාලන නිලධාරී විසින් සිදු කර තිබුණි. එසේ වුවද, විධිමත් නෛතික පුද්ගලභාවයක් සහිත ආයතනයක් ලෙස රහහල ස්ථාපනය කර නොතිබූ බැවින් ගිවිසුමෙහි නෛතික වලංගුභාවයක් නොපැවතුණි.

(vi) මුදල් රෙගුලාසි 3(1) අනුව රජයේ සියළුම කාර්යයන් කලින් තීරණය කර සැලසුම් හා වැඩසටහන්වල දැක්විය යුතු වුවද, රහහලට අදාල වියදම් දැරීම සඳහා එසේ සැලසුම් කර නොතිබුණු අතර එම වියදම් වාර්ෂික ඇස්තමේන්තුවේ ඇතුළත් කර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(vii) විදුලි බිල්පත් සඳහා ගෙවීම් කිරීමේදී, යම් මසක බිල්පත ලැබී දින 15 ක් තුල ගෙවීම් කළ යුතු බවත්, ප්‍රමාද වන ගෙවීම් සඳහා 16 වන දින සිට 1.20% ක මාසික පොලී මුදලක් හිඟ බිල්පත් වටිනාකම මත අයකරනු බවත් බිල්පතෙහි සඳහන්ව තිබුණි. එසේ වුවද, රහහලේ මාසික විදුලි බිල්පත් සඳහා දින 15 ක් ඇතුලත ගෙවීම් කර ප්‍රමාද පොලී අයකර ගැනීම් වලක්වා ගැනීමට පියවර ගෙන නොතිබුණි. මේ හේතුවෙන් 2022 වර්ෂය තුලදී පාරිභෝජනය කල විදුලිය සඳහා වන ගෙවීම් වලට අමතරව රු.460,419ක අතිරේක මුදලක් අධිභාර ලෙස ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 හා 210(2) ප්‍රකාරව කටයුතු කළ යුතු බව නිරීක්ෂණය විය.

(viii) මධ්‍යස්ථානය තුල පෞද්ගලික සන්නිවේදන ආයතන තුනක් මගින් පවත්වාගෙන යන සම්ප්‍රේෂණ ඇන්ටනා සඳහා සේවා සැපයීම වෙනුවෙන් අයකරනු ලබන බදුකුලී සහ විදුලි වියදම් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

- සම්ප්‍රේෂණ ඇන්ටනා පවත්වාගෙන යනු ලබන පෞද්ගලික සන්නිවේදන ආයතන දෙකක් සමඟ එළඹ තිබූ ගිවිසුම් 2022 දෙසැම්බර් 31 දින වන විට අවසන් වී තිබුණද, නව ගිවිසුම්වලට එළඹ නොතිබුණි. මේ හේතුවෙන් මිල ගණන් සංශෝධනය කර වැඩි ආදායමක් උපයා ගැනීමට රහහලට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.
- ගිවිසුම් ප්‍රකාරව සෑම මසකම 10 වන දින බදු කුලිය ගෙවිය යුතු වුවත් රගහලේ මාසික ආදායම් වාර්තා අනුව, උක්ත සඳහන් සන්නිවේදන ආයතන විසින් වාරික මුදල් නිසි පරිදි ගෙවා නොතිබුණු අතර ගිවිසුම්වලට එළඹීමේදී බදු කුලිය ගෙවීම ප්‍රමාද වීම මත අයකළ යුතු දඩ මුදලක් දක්වා නොතිබීමෙන් ප්‍රමාද දඩ මුදල් අයකළ නොහැකිව තිබුණි.
- රහහල හා එක් එක් සන්නිවේදන ආයතනය අතර වූ ගිවිසුම් අනුව, සම්ප්‍රේෂණ ඇන්ටනා පවත්වාගෙන යාම සඳහා භාවිතා වන විදුලිය වෙනුවෙන් වූ වියදම් එම ආයතන විසින් රහහල වෙත ගෙවිය යුතු අතර රහහල විසින් අදාල බිල්පත් පියවිය යුතු වේ. එසේ වුවද, උක්ත සඳහන් ආයතන විසින් විදුලි බිල්පත් නිසි පරිදි ගෙවා නොතිබීම හේතුවෙන් 2021 හා 2022 වර්ෂ සඳහා රු.1,255,465ක මුදලක් අයවිය යුතුව පැවතුණි.

(ix) මධ්‍යස්ථාන පරිශ්‍රය තුල වර්ග අඩි 400 ක පමණ භූමියක් හාවිතා කරමින් යුධ හමුදාව විසින් ආපන ශාලාවක් පවත්වාගෙන යනු ලබන අතර ඒ සඳහා අදාල හමුදාව වෙතින් කිසිදු කුලී මුදලක් අයකරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. ආපනශාලාව සුභසාධන පදනම මත ක්‍රියාත්මක කරන බැවින් හා එම ආපනශාලාවේ කටයුතු රහහලේ කටයුතු සමඟ සම්බන්ධ නොවන පරිදි වෙන්ව පවත්වාගෙන යනු ලබන බැවින් පරිශ්‍රය වෙනුවෙන් කුලී මුදලක් නොගෙවන බව අදාල යුධ හමුදා අංශය විසින් විගණනය වෙත දක්වන ලදි. එසේ වුවද, අදාල භූමි පරිශ්‍රය ඉතා ඉහළ ආර්ථික වටිනාකමකින් යුක්ත බවත් එම පරිශ්‍රයට අදාලව පිරිසිදු කිරීම්, විදුලි බිල්, ජල බිල් යනාදියද රහහල මහින්ම දරන බැවින් තක්සේරු වටිනාකම මත කුලී මුදලක් අයකළ යුතු බව නිරීක්ෂණය විය.

(උ) කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා වූ අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා වූ අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය සිදු කරනු ලබන ව්‍යාපෘති බොහෝමයක් ඉටු කිරීම සඳහා වෙනත් ආයතන පවතින බැවින් තවදුරටත් කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා වෙනමම ව්‍යාපෘතියක් පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැති බව නිරීක්ෂණය විය.

(ii) කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩල කාර්යාල පරිශ්‍රය සඳහා මහනුවර මහ නගර සභා සීමාව තුළ පිහිටි ගොඩනැගිල්ලක් බදු කුලී පදනමට ලබා ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර තිබුණි. අදාල බදු ගිවිසුමට අනුව අමාත්‍යාංශය විසින් දේපළෙහි සිදු කරන ලද රු.6,194,607ක සවිකිරීම් හා ඉදිකිරීම්, බදු ගිවිසුම අවසානයේ පවත්නා තක්සේරු වටිනාකම මත බදුදීමනාකරු වෙතින් අය කර ගැනීමට අමාත්‍යාංශය පියවර ගෙන නොතිබූ අතර නව බදු ගිවිසුමට එම කොන්දේසි ඇතුළත් කිරීමට ද කටයුතු කර නොතිබුණි.

(ඌ) පූර්ණ හිමිකාරිත්වය අමාත්‍යාංශය සතු සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් (පුද්) සමාගම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) සංස්කෘතික අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල ඉදිකිරීම් හා නඩත්තු කටයුතු කාර්යක්ෂමව ඉටු කරවා ගැනීමේ අරමුණින් අමාත්‍යාංශය වෙත පූර්ණ කොටස් අයිතිය ඇතිව ලියාපදිංචි කර තිබූ සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් (පුද්) සමාගමේ 2018/2019, 2019/2020, 2020/2021 හා 2021/2022 මූල්‍ය වර්ෂවලට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) වර්තමානයේ සමාගමේ කටයුතු සම්පූර්ණයෙන්ම අක්‍රිය වී ඇති බැවින් සමාගම ඇවර කිරීමට 2021 ජූලි 05 දින අග්‍රාමාත්‍ය ලේකම්වරයා වෙතින් ඉල්ලා තිබුණද ඇවර කිරීමේ ක්‍රියාවලිය මෙම වාර්තාවේ දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

4. යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) සහ 40 (3) වගන්ති ප්‍රකාරව අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින්, 2021 හා 2022 වර්ෂවල අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර තිබූ විගණන විමසුම් 07 ක් සම්බන්ධයෙන් අදහස් දැක්වීම් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 දරන කළමනාකරණ විගණන වක්‍රලේඛයේ 6 වගන්තිය ප්‍රකාරව වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීමේදී මුදල් රෙගුලාසි 134(2) හි සඳහන් පරිදි විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශයේ සංස්කෘතික අංශය සඳහා දහසකට ආසන්න කාර්ය මණ්ඩලයක් සහ දිවයින පුරා පිහිටුවා ඇති සංස්කෘතික මධ්‍යස්ථාන 208 ක් ක්‍රියාත්මකව පැවතියද, අනුමත අභ්‍යන්තර විගණන තනතුර වසර කිහිපයක සිට පුරප්පාඩුව පැවතුණි.

5. මානව සම්පත් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශය සඳහා අනුමත කාර්ය මණ්ඩලය 219ක් හා නත්‍ය කාර්ය මණ්ඩලය 164 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව 55කි. ඒ අනුමින්, අධ්‍යක්ෂ තනතුරක, ඉංජිනේරු සහ සහකාර ඉංජිනේරු තනතුරු 02 ක, සහකාර ලේකම් තනතුරු 03 ක පුරප්පාඩු පැවතුණි. ඊට අමතරව, සංවර්ධන නිලධාරී තනතුරු 13 ක සංවර්ධන සහකාර තනතුරු 12 ක සහ කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 9 ක සහ රියදුරු තනතුරු 07 ක පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම අමාත්‍යාංශයේ කාර්යසාධනය කෙරෙහි බලපෑමක් ඇති කරන බව නිරීක්ෂණය කෙරේ.

(ආ) සංස්කෘතික අංශය සඳහා සහකාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීන් 201 ක් අනුමත කර තිබුණද නත්‍ය සංඛ්‍යාව 133 ක් වූ අතර තනතුරු 68 ක් එනම් සියයට 34 ක පුරප්පාඩු පැවති අතර සංස්කෘතික අංශය සඳහා අනුමත සංවර්ධන නිලධාරී සංඛ්‍යාව 141 ක් වුවද නත්‍ය සංඛ්‍යාව 187 ක් වුයෙන් තනතුරු 46 ක එනම්, සියයට 33 ක අතිරික්තයක් පැවතුණි.

(ඇ) අමාත්‍යාංශය සතුව සංස්කෘතික මධ්‍යස්ථාන 208 ක් පැවතුණද මධ්‍යස්ථාන මුරකරුවන් 297 ක් සේවයේ යොදවා තිබුණි. 2020 දෙසැම්බර් 10 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දරන්නාට පමණක් පෞද්ගලික වන සේ මුරකරුවන් 106 ක් අනුමත කිරීම හේතුවෙන් මෙම අතිරික්තය වාර්තා වී තිබුණි. සිදුකළ විගණන පරීක්ෂාවේදී අතිරික්ත මුරකරුවන් 89 දෙනාගේ සේවය කාර්යක්ෂම අයුරින් ලබා ගැනීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. මෙම මධ්‍යස්ථානවල සේවයේ නිරත සේවකයන් සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීමේ වැදගත්කම 2021 වර්ෂයේ විගණන වාර්තාවලින් පෙන්වා දී තිබුණද අමාත්‍යාංශය විසින් මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ඈ) මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය සඳහා "කාර්යාල කාර්ය සහායක තනතුර" අනුමත තනතුරක් නොවුවද 2022 දෙසැම්බර් 31 දින වන විටත් පුද්ගලයන් 02 දෙනෙකු එම තනතුරේ සේවය කරමින් පැවතුණි.

එච්.එම්.රණසිංහ මිණ්ඩා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පරිච්ඡේදය 04

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	වාර්ෂික අයවැය ප්‍රතිපාදන (රු.මි)	මූල්‍ය ප්‍රගතිය		අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%)			වෙනත්
		සත්‍ය වියදම (රු.මි)	වෙන් කළ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස	100% -90%	75% - 89%	50% - 74%	
1.ජාතික උරුම ප්‍රවර්ධනය සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වා දීම .-ප්‍රමුඛතා පදනම යටතේ ස්පර්ෂණීය හා අස්පර්ෂණීය ජාතික උරුම සඳහා වීඩියෝපට සංඛ්‍යාව .	5.5	5.5	100.00	√			මේ සඳහා අවශ්‍ය අමතර ප්‍රතිපාදන රු. මි. 1.5 ක් වැය ශීර්ෂ 101-2-09-018-2509 මගින් මාරු කරවා ගැනීමට අවශ්‍ය කටයුතු කර ඇත.
2.ආදිවාසී / සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාව සංරක්ෂණ සේවාවන් පැවැත්වීම .සංරක්ෂණ සේවාවන් ලබන ආදිවාසි ජන පවුල් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව වර්ධනය	5.5	4.82	87.64	√			
3.දඹාන ජන උරුම මධ්‍යාස්ථානය නඩත්තු කිරීම.චේතන ගෙවන සේවක සංඛ්‍යාව	1.5	1.5	100.00	√			
4.ජාතික උරුම පර්යේෂණ හා සංරක්ෂණ ඒකකයක් ස්ථාපනය කිරීම (ජාතික උරුම හඳුනා ගැනීම) සංරක්ෂණය කරනු ලබන ජාතික උරුම සංඛ්‍යාව	0.25	0	0.00				අංක 03/2022 දරන චක්‍රලේඛණය අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ නොහැක.
5. ආදී වාසි ජන උරුමයන් ආරක්ෂා කිරීම ප්‍රතිසංස්කරණය කරන ලද කෞතුකාගාරය සහ එමගින් ලැබෙන ආදායම ප්‍රතිශතාත්මකව වර්ධනය	0.5	0	0.00				අංක 03/2022 දරන චක්‍රලේඛණය අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ නොහැක.
6. දෑයේ උරුමය දරුවන්ටයි වැඩසටහන -දරුවන්ගේ කලා රසඥතාවය වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සංස්කෘතික විද්‍යාගාර කේන්ද්‍රව සිදුවන ක්‍රියාකාරකම් ඉහළ යාම	0.1	0	0.00				අංක 03/2022 දරන චක්‍රලේඛණය අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ නොහැක.

විශේෂිත දර්ශක	වාර්ෂික අයවැය ප්‍රතිපාදන (රු.මී)	මූල්‍ය ප්‍රගතිය		අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			වෙනත්
		සත්‍ය වියදම (රු.මී)	වෙන් කළ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස	100% -90%	75% - 89%	50% - 74%	
7.ප්‍රසිද්ධ කලාකරුවන් ආශ්‍රය කරගත් කලා ගම්මාන නිර්මාණය කිරීම මධ්‍යස්ථානය කේන්ද්‍ර කොට සිදුවන නව කලා සංස්කෘතික ක්‍රියාකාරකම් වර්ධනය වීමේ ප්‍රතිශතය	0.1	1.13	0.00				අංක 101 - 2-09-18- 2509 දරන වැය ශීර්ෂයෙන් රු.මී. 0.9 සහ අංක 101 - 2-09-019- 2509 දරන වැය ශීර්ෂයෙන් රු.මී. 0.18 ප්‍රතිපාදන ප්‍රසිද්ධ කලාකරුවන් ආශ්‍රය කරගත් කලා ගම්මාන නිර්මාණය කිරීම යන ව්‍යාපෘතිය යටතේ හඳපාන්ගොඩ සංස්කෘතික විද්‍යාගාරයේ 2021 බැරකම් පියවීම සඳහා මාරු කරන ලදී. අංක 03/2022 දරන චක්‍රලේඛණය අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ නොහැක.
8.දේශීයත්වය මුල්කරගත් කර්තෘ භාග ගෙවීම සඳහා පිළිගත් ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව විධිමත් යාන්ත්‍රණයක් හඳුන්වා දීම.-සාමූහික සංගම් පිහිටුවීම සම්බන්ධයෙන් ඡායාරූප සංගම් හා සාකච්ඡා කිරීම සිදුකරමින් තිබේ.	0.52	0	0.00				අංක 101-2-09-17-2509 දරන වැය ශීර්ෂයට රු.මී.0.18 ක ප්‍රතිපාදන මෙම ව්‍යාපෘතියෙන් මාරු කරන ලදී.
9.කලාකරුවන්ගේ දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම හා යාවත්කාලීන කිරීම විවිධ ක්ෂේත්‍ර ලියාපදිංචි කරනු ලබන දේශීය කලාකරුවන් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව වර්ධනය කිරීම.	4.1	1.04	25.37				101-2-09-17-2509 දරණ වැය ශීර්ෂය ට රු.මී.0.9 ක ප්‍රතිපාදන මෙම ව්‍යාපෘතියෙන් මාරු කරන ලදී. 101-2-09-015-2509 දරණ වැය ශීර්ෂය ට රු.මී.1.5 ක ප්‍රතිපාදන මෙම ව්‍යාපෘතියෙන් මාරු කරන ලදී.
10.ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය 1. සංවර්ධනය වූ පාඨමාලා ගණන 2. අස්පර්ශනීය උරුම සංරක්ෂණය වෙනුවෙන් වූ වැඩසටහන් ගණන 3. මානව සම්පත් සංවර්ධනය සඳහා වූ වැඩසටහන් ගණන	4	4	100.00	√			
11.කන්ද උඩරට උරුමය සුරැකිම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය -ඌව පරණගම, කොරදේකුඹුර ගම්මානය අංගම්පොර සටන් කලාව සංරක්ෂිත ගම්මානයක් ලෙස වැඩිදියුණු කිරීම	5.4994	5.4619	99.32	√			
12.පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව - සංරක්ෂණය කරන ලද ගොඩනැගිලි ඒකක ගණන - ගවේෂණය කරන ලද පුරාවිද්‍යා ස්ථාන ගණන - නඩත්තු කර පවත්වා ගෙන යන ස්ථාන සහ ස්මාරක වැඩ බිම් ඒකක ගණන	116.281	85.438	73.48			√	

විශේෂිත දර්ශක	වාර්ෂික අයවැය ප්‍රතිපාදන (රු.මී)	මූල්‍ය ප්‍රගතිය		අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			වෙනත්
		සත්‍ය වියදම (රු.මී)	වෙන් කළ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස	100% -90%	75% - 89%	50% - 74%	
13.ගාලු උරුමය පදනම -ගාලු කොටුව පල්ලිය වීදියේ පැරණි පොලිස් නිල නිවාස ගොඩනැගිල්ල සංරක්ෂණය කර ආදායම් උත්පාදනය කිරීම සඳහා යෙදවීමේ ව්‍යාපෘතියේ ප්‍රතිශතාත්මකව වර්ධනය	18	18	100.00	√			
14.අපේ ගම - මහවලවිව ගොඩනැගිල්ලේ විදුලි පද්ධතිය ස්ථාපිත කිරීම. - වෙළඳ කුටියක් හා කාමරයක් සහිත වර්ග අඩි 600 වෙළඳ කුටි 02 නවීකරණය කිරීමේ හා නාමපුවරුව නවීකරණය කර ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රතිශතාත්මකව වර්ධනය	9.5	9.5	100.00	√			
15.මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය - චිත්‍රාගාරය ප්‍රතිසංස්කරණය, නාගරික සහ ග්‍රාමීය දර්ශන පසුතල අලුත්වැඩියා කිරීමේ ප්‍රතිශතාත්මකව වර්ධනය	24	24	100.00	√			

පරිච්ඡේදය 05

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්ක	අරමුණු/ ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
(11.4.)ලෝකයේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීමට සහ ආරක්ෂා කිරීමට දරන උත්සාහයන් ශක්තිමත් කිරීම.	**1. ජාතික උරුම ප්‍රවර්ධනය සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වා දීම** . ජාතික උරුම ඩිජිටල් මාධ්‍ය භාවිතයෙන් සංරක්ෂණය වීම හා ජාතික උරුම ස්ථාන සඳහා දෙස් විදෙස් සංචාරක ආකර්ෂණය වැඩි වීම .	ඩිජිටල් යෙදවුමට ඇතුළත් කිරීම සඳහා ජාතික උරුම සංරක්ෂණ වීඩියෝ පට 22 ක් නිෂ්පාදන කිරීම හා 2021 නිෂ්පාදිත වීඩියෝ පට 30 දේශීය විදේශීය සංචාරකයින් අතර ප්‍රචලිත කිරීම උදෙසා ආයතන සම්බන්ධ කරමින් වීඩියෝ පට ප්‍රචාරණය කිරීම			√
	2. ආදිවාසී/ සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාව සංරක්ෂණ සේවාවන් පැවැත්වීම . ආදිවාසී දිනය සැමරීම සහ වාර්ෂික ශාන්ති කර්ම සිදු කිරීම.	සංරක්ෂණ සේවාවන් ලබන ආදිවාසී ජන පවුල් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව වර්ධනය			√
	ආදිවාසී ප්‍රජා සංරක්ෂණ කටයුතු සේවාවන් සැපයීම .(දළුකාන ක්ෂේත්‍ර අධ්‍යයනය)				√
	3.දඹාන ජන උරුම මධ්‍යස්ථානය නඩත්තු කිරීම. දඹාන ජන උරුම මධ්‍යස්ථානයේ සේවය කරන කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීම හා සාමාන්‍ය නඩත්තු කටයුතු කිරීම.	චේතන ගෙවන සේවක සංඛ්‍යාව			√
	4.කලාකරුවන්ගේ දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම හා යාවත්කාලීන කිරීම විවිධ ක්ෂේත්‍ර ලියාපදිංචි කරනු ලබන දේශීය කලාකරුවන් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව වර්ධනය කිරීම.	දිවයිනේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් දැන්වීම් 2000 ක් ප්‍රදර්ශනය කිරීම.	√		
	5. කලාකරුවන් සඳහා හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.	හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය ලබා ගත් කලාකරුවන් 550 දෙනා ගෙන් 41 දෙනෙකු ප්‍රතිලාභ ලබාගෙන ඇත.	√		
	6.ටවර් හෝල් රහඟල පදන ප්‍රාසාංගික කලාකරුවන් සඳහා මාසිකව විශ්‍රාම දීමනා ලබාදීම	ශිල්පීන් 99 ක් සඳහා දීමනා ලබාදීම			√

ඉලක්ක	අරමුණු/ ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
(4.1)ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබාගැනීමට හැකි වන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් නිදහස්, සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ, ප්‍රාථමික, සහ ද්විතියික අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම. (4.2) සියලුම ගැහැණු ළමුන්ට සහ පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ව ළමාවිය සංවර්ධනයට, සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථාව පැවතීම හා එමගින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම්ව සිටින බව තහවුරු කිරීම.	අධ්‍යයන වර්ෂ 2014/15, 2015/16, 2016/17, 2017/18, 2018/19 සිසුන්ගේ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය පැවැත්වීම	ඩිප්ලෝමාලාභීන් 172 ක් සඳහා ඩිප්ලෝමා ප්‍රදානය කිරීම			√
	නාඩගම් ගී 16 ක් ඇතුළත් සංයුක්ත තැටිය එළිදැක්වීම	පිටපත් 1000			√
	7. ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය සෞන්දර්ය පාඨමාලා සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂම් සභාවේ සහ ජාතික අධිනිකත්ව පුහුණු අධිකාරියේ අනුමැතියෙන් ජාතික නිපුණතා මට්ටම් ලබා ගැනීමට හැකිවන ආයතනයක් ලෙසට පත් කිරීම.	1. සංවර්ධනය වූ පාඨමාලා ගණන			√
	චිත්‍ර හා මූර්ති පාඨමාලා සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂම් සභාවේ සහ ජාතික අධිනිකත්ව පුහුණු අධිකාරියේ අනුමැතියෙන් ජාතික නිපුණතා 4, 5 සහ 6 මට්ටම් ලබා ගැනීම.	2. අස්පර්ශනීය උරුම සංරක්ෂණය වෙනුවෙන් වූ වැඩසටහන් ගණන			√
	නව පාඨමාලා ආරම්භ කිරීම - (චිත්‍ර හා මූර්ති, සංගීතය,පන්සල් චිත්‍ර සංරක්ෂණය පාඨමාලා ආරම්භ කිරීම)	3. මානව සම්පත් සංවර්ධනය සඳහා වූ වැඩසටහන් ගණන			√
	8. මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය, රන්මිනිතැන්න සැමට දැරිය හැකි සහ සාධාරණ ප්‍රවිෂයක් කෙරෙහි අවධානය යොමු කරමින් ආරේථික සංවර්ධනයට සහ මානව යහ පැවැත්මට සහාය වීම සඳහා කලාපීය හා අන්තර් දේශ සීමා යටිතල පහසුකම් ඇතුළුව ගුණාත්මක, විශ්වාසනීය, තිරසාර හා ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.	චිත්‍රාගාරය ප්‍රතිසංස්කරණය, නාගරික සහ ග්‍රාමීය දර්ශන පසුතල අලුත්වැඩියා කිරීමේ ප්‍රතිශතාත්මකව වර්ධනය			√

ඉලක්ක	අරමුණු/ ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
SDG 9ධරණීය යටිතල පහසුකම් ගොඩ නැගීම, සංයුක්ත සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම සහ නව්‍යකරණයන් පෝෂණය කිරීම	**9. කන්ද උඩරය උරුමය සුරැකීම දහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය** මුද්‍රිත කෘති, නාට්‍ය. සිනමා, චිත්‍ර හා මූර්ති, සංගීත හා නර්තන කර්මාන්තයන් ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැපයීම	අරමුදල් මූලාශ්‍ර (පොදු, පුද්ගලික), උරුම වර්ගය (සංස්කෘතික, ස්වභාවික) සහ රාජ්‍ය මට්ටම (ජාතික, ප්‍රාදේශීය සහ ප්‍රාදේශීය/මහ නගර) මගින් සියලුම සංස්කෘතික හා ස්වභාවික උරුමයන් සංරක්ෂණය, ආරක්ෂාව සහ සංරක්ෂණය සඳහා වූ මුළු ඒක පුද්ගල වියදම			√
11.4 ලෝකයේ ස්වාභාවික සහ සංස්කෘතික උරුමයන් රැකගැනීම හා ආරක්ෂා කරගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම.	ජාතික උරුමයන් ආරක්ෂාකිරීම සඳහා පවතින ආයතනවල ඵලදායිත්වය ඉහළ නැංවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම .				√
	කලාත්මක නිර්මාණ සංරක්ෂණය සහ ප්‍රදර්ශණය සඳහා විශේෂිත පහසුකම් සැලසීම				√
	10. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විශ්වීය වැදගත්කමක් ඇති පුරාවිද්‍යා ස්ථාන ලෝක උරුම තත්ත්වයට උත්ශ්‍රේණි කිරීම	ස්ථාන ගණන කටයුතු සිදු කෙරෙමින් පවති			
11.4 රටේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමට දරණ උත්සහයන් ශක්තිමත් කිරීම.	ප්‍රජාව, පාසැල් සහ විශ්වවිද්‍යාල ළමුන්ගේ සහභාගිත්වයෙන් ස්ථාන ආශ්‍රිත ක්‍රියාකාරකම් සංවිධානය කිරීම .	ස්ථාන ගණන කටයුතු සිදු කෙරෙමින් පවති		√	
	දෙස් විදෙස් ජනතාව දැණුවත් කිරීම සඳහා වැඩසටහන් .	පැවැත්වූ ප්‍රදර්ශන, මුද්‍රණය කළ ග්‍රන්ථ,සකස් කළ වීඩියෝ වැඩ සටහන්		√	
	පුරාවස්තු අඳාපනත සංශෝධනය කිරීම	පුරාවස්තු අඳා පනතට අදාළව සිදු කරන ලද සංශෝධන		√	
	11. අපේ ගම අපේ ගම පරිශ්‍රයේ ප්‍රතිසංස්කරණ කටයුතු	නවීකරණය කරන ලද ගොඩනැගිලි			√
11 තිරසර නගර සහ ප්‍රජාවන්	මහවලව්ව ගොඩනැගිල්ලේ වහලයේ වඩිම්බු ලෑලි, වැහිපිහිලි හා ජලබස්නා නල සවි කිරීම	අලංකාර කරන ලද පරිශ්‍රය			√
	වෙළඳ කුටි 03කින් සමන්විත (වර්ග අඩි 450) වෙළඳ කුටි නවීකරණය කිරීම (වෙළඳ කුටි 06ක් සඳහා)	නවීකරණය කරන ලද ගොඩනැගිලි හා උපකරණ			√
	12. ගාලු උරුමය පදනම ලෝකයේ ස්වාභාවික සහ සංස්කෘතික උරුමයන් රැකගැනීම හා ආරක්ෂා කරගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම .	අරමුදල් මූලාශ්‍ර (පොදු, පුද්ගලික), උරුම වර්ගය (සංස්කෘතික, ස්වභාවික) සහ රාජ්‍ය මට්ටම (ජාතික, ප්‍රාදේශීය සහ ප්‍රාදේශීය/මහ නගර) මගින් සියලුම සංස්කෘතික හා ස්වභාවික උරුමයන් සංරක්ෂණය, ආරක්ෂාව සහ සංරක්ෂණය සඳහා වූ මුළු ඒක පුද්ගල වියදම			√

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ (ජාතික උරුම අංශයේ) ජාතික උරුම හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම සඳහා වන දිගුකාලීන අරමුණු වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට විශේෂිත වූ ක්‍රමවේදයක් නොමැති වීම මෙම ක්ෂේත්‍රය තුළ පැවති විශාල හිඩැසකි.මෙම ප්‍රශ්නයට තිරසාර විසඳුමක් වශයෙන් ජාතික උරුම ප්‍රවර්ධනය කිරීම සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වා දීම යටතේ,ශ්‍රී ලාංකේය ජාතික උරුමයන් ආවරණය වන පරිදි ජාතික උරුමයන් දේශීය හා විදේශීය ප්‍රජාව වෙත වඩාත් ආකර්ෂණීය හා ඵලදායී ලෙස උපයෝගී කර ගැනීම සඳහා තිරසර සංවර්ධන උපාය මාර්ග සහ ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට හැකි වීම විශේෂ ජයග්‍රහණයකි.

දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක හා කලා ක්ෂේත්‍ර හා ග්‍රාමීය කලා ශිල්පීන් ආවරණය වන පරිදි දිවයිනේ විවිධ ප්‍රදේශ වල විසිරී සිටින කලාකරුවන්ගේ අංග සම්පූර්ණ තොරතුරු ඇතුළත් කල හැකි දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම, සිදු කළ අතර මාර්ගගත ක්‍රමය යටතේ දිවයින පුරා කලාකරුවන් 3500 ක් පමණ දත්ත පද්ධතියේ ලියාපදිංචි කරන ලදි. මේ වන විටද දත්ත පද්ධතිය සඳහා කලාකරුවන් ලියාපදිංචි වීමේ කටයුතු අඛණ්ඩව සිදු කරමින් පවති.ප්‍රාදේශියව ජීවත්වන කලාකරුවන් මාර්ගගත ක්‍රමය යටතේ දත්ත පද්ධතියේ ලියාපදිංචි කිරීමට අභියෝගාත්මක කාර්යයන් වූයේ ඔවුන්ගේ තාක්ෂණික සාක්ෂරතාවයේ ඌනතාවයක් හේතුවෙනි.

කලාකරු රක්ෂණ ව්‍යාපෘතිය යටතේ කලාකරුවන් 550 ක් පමණ 2021 වර්ෂයේදි රක්ෂණය කළද ඔවුන්හට ප්‍රතිලාභ ලබා ගැනීම 2022 වර්ෂයේදි සිදු විය. මෙම ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන 2023 වර්ෂය සඳහා නොලැබීම මෙහිදි මුහුණ පාන ලද විශාල අභියෝගයකි.

පාහියංගලින් සොයාගන්නා ලද මානව අස්ථි සංරක්ෂණය කර ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තැබීම සඳහා කටයුතු කරමින් පැවතියද වර්ෂය පුරා මුහුණ දුන් විදේශ විනිමය ගැටලුව හේතුවෙන් අවශ්‍ය යන්ත්‍රය මෙරටට ගෙන්වා ගැනිමට නොහැකි විය. ඒ අනුව එම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට නොහැකි විය.

අභිනව අමාත්‍යාංශය 2020 වර්ෂයේ අග භාගයේදී ආරම්භ කිරීමෙන් අනතුරුව අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණු හා කාර්යයන්ට අනුකූලව ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම හා සංස්කෘතිය,සාහිත්‍ය සහ කලාව ඉහළ ප්‍රමිතියකින් හා උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියාකාරී සැලැස්මක් සකස් කල ද රජය විසින් පනවන ලද අංක 03/2022 දරන චක්‍රලේඛණය අනුව මාර්ගෝපදේශයන්ට යටත්ව කටයුතු කිරීමට සිදු වීම නිසාවෙන් 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සියයට සියයක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වුව ද පැවති තත්වයට සාපේක්ෂව සැහිමකට පත්විය හැකි ය.

පරිච්ඡේදය 06
මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය **2022.12.31** දිනට

		අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු	අතිරික්ත
ජ්‍යෙෂ්ඨ		**09**	**04**	**05**	**-**
තෘතියික		**03**	**00**	**03**	**-**
ද්විතියික	සං. නිලධාරි	**28**	**58**	**-**	**30**
	කළ. සේ. නිලධාරි	**08**	**04**	**04**	**-**
ප්‍රාථමික		**13**	**02**	**11**	**-**

6.2 අනුයුක්තව ඇති සියලුම විෂය නිලධාරීන් සඳහා වෙන් වෙන් වශයෙන් රාජකාරි පවරා ඇති බැවින් දෛනික කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කළ හැකි වේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (දේශිය)	වැඩසටහනේ ස්වභාවය (දේශිය)	නිමැවුම/ ලබාගත් දැනුම
01	ඵලදායිතා සංකල්පය අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක කිරීම.	30	පැය 3 (2022.01.11)	10,000/=	ඵලදායිතා පුහුණු උපදේශිකාවක් ගෙන්වා දේශන පැවැත්වීම.	අමාත්‍යාංශය තුළ ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම.
02	ඵලදායිතා සංකල්පය අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක කිරීම. -II	60	පැය 6 (2022.02.08/18)	-	ඵලදායිතා පුහුණු උපදේශිකාවක් ගෙන්වා දේශන පැවැත්වීම(5S)	අමාත්‍යාංශය තුළ 5S සංකල්පය ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම.
03	ලිපිගොනුකරණය	05	දින 1 (2022.04.05)	25,000/=	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මඟින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන් මාලාවක්	කාර්යාලීය ලිපිගොනුකරණය වඩාත් විධිමත් හා ඵලදායි ලෙස පවත්වාගෙන යමින් කාර්යාලීය කටයුතු පහසු කිරීම පිළිබඳ දැනුම
04	කාර්යාල කළමණාකරණය හා මුදල් රෙගුලාසි	03	දින 1 (2022.05.10/11)	30,000/=	,,	නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය හා සඵලදායිත්වයතුළින් ආයතනයේ සේවා කටයුතු ඵලදායිකර ගැනීම පිළිබඳ දැනුම.

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (දේශීය)	වැඩසටහනේ ස්වභාවය (දේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
05	කාර්යාල සටහන් ලිවීම සහ රාජකාරි ලිපි ලිවීම	**04**	දින **1** **(2022.05.25)**	**20,000/=**	,,	ගුණාත්මක කාර්යාල සේවයක් නිර්මාණය කිරීම පිළිබඳ දැනුම
06	රජයේ වාහන නඩත්තු	**02**	දින **1** **(2022.06.16)**	**10,000/=**	,,	රජය සතු වාහන උපරිම කාර්යක්ෂමතාව යෙන් හා අවම පිරිවැයකින් යුතුව පරිහරණය කිරීම සහ ඒවායේ ආරක්ෂාව උපරිම කරන අයුරින් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව දැනුම
				95,000/=		

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වීම.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ	අනුකූල වේ		

	පාලනයට යටත්ව කටයුතු කිරීම			
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		.
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		

6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		

8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල	අනුකූල වේ		

	සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.			
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අදාළ නොවේ		

12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අදාළ නොවේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ		

15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	මෙම අංශය වෙනම අංශයක් ලෙස ක්‍රියාත්මකවීම	ආංශික ලේඛනයත් නවත්වාගැනීමට කටයුතු කිරීම
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		

17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	ඉහත 17.1 පරිදි වේ.	අංශයට අදාළ තොරතුරු වෙනම ඉදිරිපත් කිරීම.
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ		පවත්නා වර්ෂය තුළ පුරවැසි ප්‍රඥප්තියක් සකස්කර ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කරමි.
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ		පවත්නා වර්ෂය තුළ පුරවැසි ප්‍රඥප්තියක් සකස්කර ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කරමි.
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ		මානව සම්පත් සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කරමි
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ		ක්‍රියාකිරීමට අපේක්ෂා කරමි

19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ		ක්‍රියාකිරීමට අපේක්ෂා කරමි
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල නොවේ		ක්‍රියාකිරීමට අපේක්ෂා කරමි
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		